ISSN 1391 - 1031
2012 ජනවාරි
17 වෙළුම 10 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

'' සමාජයේ නායකයා හා මාර්ගෝපදේශකයා වශයෙන් නව පංතියක් ඓතිහාසික දර්ශන පථයට පැමිණෙන විට එක් අතකින් ප්‍රචණ්ඩ ''සෙලවීම්'' කම්පන, අරගල සහ කුණාටුද අනිත් අතින් න ව වාස්තවික තත්වයන්ට ගැලපෙන නව ක්‍රම තෝරා ගැනීමේදී දක්නට ලැබෙන අනිස්ථිර පියවරයන්, අත්හදාබැලීම්, වැනෙනසුළු හා පැකිලීම් සහිත කාලසීමාවක්ද ඇතිවීම වැළැක්විය හැකි නොවේ.''

ලෙනින් තෝ. කෘ. 8 වෙළුම - 59 පිටුව

## 3 ආණ්ඩුවේ අවදානම



'අලුත් අවුරුද්දක්' වන 2012 වසර එළඹී ඇත්තේ, පැරණි අභියෝග සමග මෙන්ම එකී අභියෝගවලට එරෙහිව අරගල කිරීමට ජනතාවගේ ඇති සූදානම....

## 4 තරුණ



සිංහලෙන්, දෙමළෙන්, වගේම ඉංග්‍රීසියෙනුත් ගායනා ඉදිරිපත් කරමින් සංගීතය විශ්ව භාෂාවක් වගේම ...

## 5 සංවාදය



අපේ ජනතාව ඉදිරිපිට, අපි ඉදිරිපිට අභියෝග රැසක් මතුවෙලා තියෙනවා. ධනවාදයේ පීඩාවට එරෙහිව ජනතාව තැනින් තැන අරගල .....

## 8 කලාව රසවින්දනයෙන්



නිර්ධන පංති කලාවක් සඳහා කලාව තුළ පවතින අධිපති පංති මතවාදය හඳුනාගත යුතුවේ. නූතන ධනවාදය තුළ එනම්, නව ලිබරල් ධනවාදය තුළ කලාව මුළුමනින්ම ...

## 9 කෝප්පයකින් වැසිය



රාජ්‍යය බිහිවූ සමයේ පටන් රාජ්‍යය අහෝසි වන තුරුම රාජ්‍යය පවතින්නේය. ධනේශ්වර රාජ්‍යය සූරාකෑමෙන් මෙන්ම දූෂණයෙන්ද ...

සමුළුව....................07
දැනුම ....................10
කාලීන.....................11
කාන්තා...................12
ජාත්‍යන්තර..............13
විශේෂ.....................14



ඉහළට එසැවුණු අත් සහ කුළු ගැන්වුණු දෙනෙත් දහස් ගණනකි. එවා නියෝජනය කරන්නේ, ප්‍රතිගාමිත්වයේ බොරුවලවල්වලට නොවැටෙන බවට වන විශ්වාසය සහ ලාංකේය නිර්ධන පංතියේ පක්ෂය කෙරෙහි වන අපරිමිත කැපවීමය; පීඩිත ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් සමාජවාදය තෙක් සටන් වදින බවට වන අධිෂ්ඨානයය.
ජනවාරි 01වැනි දින තිස්සමහාරාම දෙබරවැව පොදු ක්‍රීඩාංගණයේදී මුළු දුන් අභිමානවත් විශේෂ සමුළුවේ අවස්ථා කිහිපයක් කැමරා ඇසට හසුවූයේ මෙලෙසය.

# සියලු බාධක පරදා

# ජ.වි.පෙ. සමුළුව මහ ඉහළින්!

## නව මධ්‍යම කාරක සභාවක්, නව දේශපාලන යෝජනා මාලාවක් සම්මතයි

**ප්‍රතිගාමිත්වයේ සකලවිධ බාධාකිරීම් හා කුමන්ත්‍රණ සහමුළින් පරාජය කරමින් ජ.වි.පෙ. විශේෂ සමුළුව තිස්සමහාරාම දෙබරවැව පොදු ක්‍රීඩාංගණයේදී ජනවාරි 01වැනි දින අති සාර්ථක ලෙස මුළු දුන්නේය.**

පක්ෂය තුළ මතුවූ කල්ලිවාදී ප්‍රවණතාවන් මුලිනුපුටා දැමීමත් රට තුළ හා ජාත්‍යන්තරව වර්ධනය වන නව දේශපාලන තත්වයන්ට අනුව ජනතා ජයග්‍රහණ වෙනුවෙන් රට හා පක්ෂය සූදානම් කිරීමත් අරමුණු කර ගනිමින් මෙම සමුළුව කැඳවීමට ජ.වි.පෙ. මධ්‍යම කාරක සභාව තීරණය කර තිබිණි. කල්ලිවාදී ලෙස ජ.වි.පෙ.න් ඉවත්වී ගිය කොටස්, සමුළුවක් පවත්වන ලෙසට මාධ්‍ය මගින් ජ.වි.පෙ.ට අභියෝග කරනු ලැබ තිබූ අතර පසුව ජ.වි.පෙ. විශේෂ සමුළුව කැඳවීමට කටයුතු කිරීමත් සමග ඊට එරෙහි වාරණ නියෝග අධිකරණය මගින් ලබාගැනීමට දෙවරක්ම උත්සාහ කර තිබූ අතර ඒවා අසාර්ථක විය.

මෙම විශේෂ සමුළුවේදී විසිපස්දෙනෙකුගෙන් යුත් නව මධ්‍යම කාරක සභාවක් සමුළු නියෝජිතයින් විසින් ඒකමතිකව තෝරා පත්කර ගන්නා ලද අතර පක්ෂ නායකයා ලෙස සෝමවංශ අමරසිංහ සහෝදරයා පත් කර ගනු ලැබිණි. සිව් වැදෑරුම් නව දේශපාලන යෝජනා මාලාවක්ද මෙහිදී සම්මත කෙරිණි. යුරෝපය, මැද පෙරදිග, දකුණු කොරියාව හා ජපානය වැනි රටවල් රැසක ජ.වි.පෙ. විදෙස් කමිටුවලින් සමුළුවට සුභපැතුම් එක් කරනු ලැබීමද විශේෂත්වයක් විය.

තේරී පත්වූ නව මධ්‍යම කාරක සභාවේ නාම ලේඛනයත් එම මධ්‍යම කමිටුව විසින් තෝරා ගන්නා ලද දේශපාලන මණ්ඩලයත් සම්මත කරන ලද නව දේශපාලන යෝජනා මාලාවත් නියමුවා 07වැනි පිටුවේ පළවේ.

# වැඩ බිම



## ටෙලිකොම් සේවක සංගමයේ 07 වන සමුළුව මුළුදෙයි




'අයිතින් දිනීමට ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරිමට වැඩකරන ජනතා බලයක් ගොඩනගමු' යන තේමාව යටතේ ලංකා ටෙලිකොම් සේවා සංගමයේ සිය 7වැනි වාර්ෂික මහා සමුළුව පසුගිය 07වැනි දින කොළඹ සේවා මුක්ත හට සංගම් ශාලාවේදී පවත්වනු ලැබීය.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති සමුළුව සඳහා විශාල සේවක පිරිසක් සහභාගී වී සිටි අතර එම සංගමයේ නිල වෙබ් අඩවියද මෙදින විවෘත විය.

මේ අවස්ථාවේ ආරාධිත දේශනය පැවැත්වූ ලාල්කාන්ත සහෝදරයා, කම්කරු නායකයෙක් වෘත්තීය සමිති නායකයෙක් වැටුප් සටන් පමණක් කරමින් සිටින්නේනම් එම නායකයින් ධනපති ක්‍රමයේ ඒජන්තයින් බවත් එවැනි වෘත්තීය සමිති ප්‍රතිගාමී බවත් කියා සිටියේය.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ ඔහු කම්කරු පන්තියට සිය අයිතිවාසිකම් දිනා ගැනීමේදී ඒ ආණ්ඩුව රතුද කොළද, නිල්ද කියන එක අදාල නොවන බවත් කම්කරුවාට ජීවත් වීමට සරිලන වැටුපක් අවශ්‍යවී ඇතත් මහින්ද රාජපක්ෂ මහතාගේ පාලනය තුළ වැඩකරන ජනතාවට තම ජීවිතය කප්පාදු කර ගැනීමට සිදුවී ඇති බවත් පෙන්වා දුන්නේය.

''වෘත්තීය සමිති ව්‍යාපාරය ලෙස මේ සිස්ටම් එක ඇතුළේ අපිට සටන් දෙකක් තියෙනවා. එකක් වැටුප් සටන. අනික වැටුප අහෝසි කර ගැනීම සඳහා වූ සටන. ඒ සටන කියන්නේ සමාජවාදය. ඒ නිසා අපි වෘත්තීය සමිති ව්‍යාපාරය විදියට සංවිධානය වෙන්න ඕනෑ. සාමාජිකයින් තව තව එකතු කරන්න ඕනෑ. සටන් කරන්න ඕනෑ. කම්කරු පන්තියේ සටන මහින්ද මහත්තයා කරලා දෙන්නේ නැහැ. ඒක ඔය ලාබ කඳු ගොඩගහන අය අරන් දෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ වැඩ කරන පන්තියේ වැටුප් සටනට අමතරව සමාජවාදය සඳහා වන සටනකුත් තියෙනවා කියලා.'' ඔහු අවධාරණය කළේය.

## ආණ්ඩුවේ වැටුප් යෝජනා පුස්සක්; 10,000 වැටුප් සටන ඉදිරියටම



2012 අයවැය යෝජනාවලට අනුව රාජ්‍ය සේවකයින්ගේ හා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවන්ගේ විශේෂ දීමනා සංශෝධනයට අදාල රා.ප.ච. 31/11 මේ වන විට නිකුත් කර ඇත. රාජ්‍ය සේවකයාගේ කාර්ය භාරය වචනයෙන් වර්ණනා කර, දීමනා ලබා දීමේදී සොච්චමක් ලබා දී ඔවුන් හැල්ලුවට ලක් කර ඇති ආකාරය හා එම වැඩි කිරීම ජීවත් වීම සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව මීට පෙර තම සංගමය විසින් පෙන්වා දී ඇති බවත් එම නිසා රුපියල් 10000 කින් වැටුප් වැඩිකර ගැනීමේ සටන තවදුරටත් වලංගු වන බවද, ඒ සඳහා ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ග වෙනුවෙන් රාජ්‍ය සේවකයා පෙලගස්වන බවද ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා ලිපියක් මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා වෙත දන්වා යවා ඇත.

පසුගිය දෙසැම්බර් 23වැනි දින යවන ලද එම ලිපියේ වැඩිදුරටත් මෙසේ සඳහන් වේ.

එසේම, තමාගේ ජීවිත කාලයේදීම රාජ්‍ය සේවය වෙනුවෙන් දියකර විශ්‍රාම ගෙන අපහසුවෙන් දිවි ගැටගසාගන්නා විශ්‍රාමිකයා කෙරෙහි දක්වා ඇත්තේද කුඩම්මාගේ සැලකීමකි.

අද දවසේ ජීවන වියදම ඉහළ යාමේ ප්‍රමාණය හා වේගය සලකා බලන විට සිදුකර ඇති වැඩිවීම කිසිසේත් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිය.

ඒ අතර 2006. 01. 01 දිනෙන් පසු විශ්‍රාම ලැබුවන් අති විශාල ප්‍රමාණය සම්බන්ධයෙන් වචනයකුදු සඳහන් නොකර මගහැරීම තුළ ආණ්ඩුව සිදුකර ඇත්තේ බරපතළ අඩුපාඩුවකි.

මේ තත්වය පිළිබඳව අපගේ බලවත් විරෝධය ප්‍රකාශ කර සිටින අතර විශ්‍රාමිකයින් කාණ්ඩවලට වර්ග කර ඇත්තේ කුමන පදනමකින්ද යන්න අප වෙත පැහැදිලි කිරීමක් අවශ්‍යය.

## විකෘති උසස්පෙළ ප්‍රතිඵලය වහා නිවැරදි කළ යුතුයි!

**ලංකා ගුරු සේවා සංගමය**



ආණ්ඩුව විසින් මේ වන විට නිකුත් කර ඇති උ/පෙළ ප්‍රතිඵලය බරපතළ ලෙස විකෘති කළ ප්‍රතිඵලයක් බැවින් එය වහා නිවැරදි කර දරුවන්ට සාධාරණය ඉටුකරන ලෙස ආණ්ඩුවට බල කර සිටින බව ලංකා ගුරු සේවා සංගමය පවසයි.

විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය විසින් සේවා දිගු 3 ක් ලබාදෙමින් අකාර්යක්ෂම, අදක්ෂ සහ දූෂිත නිලධාරියෙක් විභාග කොමසාරිස් ධූරයේ තබා ගැනීම පිළිබඳව සමස්ත ආණ්ඩුවම වගකිවයුතු බවද මෙවැනි තත්වයක් තුළ මේ වන විට එක් එක් ඇමතිවරු මෙම ප්‍රශ්නය වෙනත් අය මත පටවමින් සිටීම හාස්‍යයට කරුණක් බවද ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසා සිටී. ඔහු මේ බව පැවසුවේ දෙසැම්බර් 28වැනි දින කොළඹ ජාතික පුස්තකාලයේ පැවති මාධ්‍ය හමුවක් අමතමිනි.

## උගත් පාඩම් කොමිසම, කාලය හා මහජන මුදල් නාස්ති කිරීමක්

**ජනතා විමුක්ති පෙරමුණ**

ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීමටවත් අඩු ගණනේ ඊට ආරම්භක පියවරක් තැබීමට හෝ ප්‍රශ්නය නිවැරදිව හඳුනාගැනීමටවත් ධනපති ක්‍රමය තුළ මෙතෙක් පැවති ආණ්ඩුවලට මෙන්ම වත්මන් ආණ්ඩුවටද වුවමනාවක් මෙන්ම හැකියාවක්ද නැතිබව උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසමේ වාර්තාව මගින් හෙළිවන බවත් එය හුදෙක් කාලය හා මහජන මුදල් නාස්ති කිරීමක් බවත් ජ.වි.පෙ. පෙන්වා දෙයි. එම කොමිසමේ වාර්තාව පිළිබඳව තම පක්ෂයේ මතය ප්‍රකාශ කරමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 18වැනිදා නිකුත් කරන ලද නිවේදනයක මේ බව සඳහන්ය.

උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසමේ වාර්තාව පසුගිය 16දා ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ එය ඉදිරිපත් කරන ලෙස බාහිර බලපෑම් වැඩිවෙමින් තිබූ නිසාය. ජනාධිපතිවරයා විසින් මෙම කොමිසම පත්කරනු ලැබුවේද ලංකාවේ වසර 30කට ආසන්න කාලයක් තුළ පැවති බෙදුම්වාදී යුද්ධය තුළ සිදුවූ සිදුවීම් හා ලංකාවේ බෙදුම්වාදී අරගලය බිහිවීමට බලපෑ සමාජ, ආර්ථික, දේශපාලන හේතු අධ්‍යයනය කොට ඊට විසඳුමක් සෙවීමේ අවංක අරමුණකින් නොව යුද්ධය නිමාවීමත් සමඟ විදේශ බලවේග යන් වෙතින් එල්ල වූ චෝදනා හා බලපෑම් වලින් ගැලවීම සඳහාය.

මෙම කොමිසම ලංකාවේ ජාතික ගැටලුවට, බෙදුම්වාදී අරගලයට බලපෑ හේතු විමසා ඊට විසඳුම් ඉදිරිපත් කරන්නක් නොව වසර 30කට වැඩි බෙදුම්වාදී යුද්ධයේ ඉතිහාසයෙන් 2002 පෙබ. 21දා සිට 2009 මැයි 19 දක්වා වූ කාලය තුළ සිදුවූ සිදුවීම් බිඳක් මතුපිටින් පමණක් විමසා බැලීමකි. මෙම කොමිසමේ සීමාව විසින්ම හා එහි නිරර්ථක බව පැහැදිලි වේ. වසර 30කට ආසන්න කාලයක් තුළ පැවති බෙදුම්වාදී අරගලය තුළ වරින් වර බලයට පත්වූ ආණ්ඩු කටයුතු කළ ආකාරයත්, බෙදුම්වාදී බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වයත්, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය අරභයා අධිරාජ්‍යවාදයේ හා අසල්වැසි ඉන්දියාවේ මැදිහත්වීම්ද යන වැදගත්ම සාධක මුලුමනින්ම නොසලකා හැර වසර කිහිපයක සිදුවීම් ගැන විමර්ශනය කිරීමට පමණක් මෙම කොමිසමේ බලය සීමාකිරීම තුළින්ම පෙනෙන්නේ මෙය ප්‍රශ්නයෙන් පළායාමට හා ජාත්‍යන්තර වශයෙන් එල්ල වූ විරෝධය මගහැර 'දවස ගෙවා ගැනීමේ' වූ අරමුණින්ම කළ එකක් බවය.

අනෙක් අතට මෙම කොමිසමේ ක්‍රියාකාරිත්වය තුළද විටින් විට ගැටළු මතුවිය. එය ඉදිරියේ සාක්ෂි දීමට ඉදිරිපත් වූ බොහෝ දෙනෙකුට සාක්ෂි දීමට නොහැකි වූ බවත් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවූ බවත් වාර්තා විය. ඉන් පෙනී යන්නේද මෙම කොමිසම පුළුල් අරමුණක් හා වගකීමක් සහිතව ක්‍රියාත්මක නොවූ බවය.

එවැනි තත්වයක් තුළ මෙම කොමිසමේ වාර්තාවෙහි අඩංගු සමහර කරුණු ගැන කතාකිරීම, එකී කරුණු වල හොඳ නරක හෝ හරි වැරදි ගැන කතා කිරීම ඵල රහිත වේ. මෙම කොමිසම පත් කිරීමට ජනාධිපතිවරයා හා ආණ්ඩුව ගත් තීරණය උතුරේ ප්‍රශ්නය විසඳීමේ අවංක උත්සාහයක් සඳහා නොවන බව තහවුරු වන්නේ මෙවැනි කොමිසමක නිර්දේශ නොමැතිව වුවද ආණ්ඩුව අඩු වශයෙන් යුද්ධය අවසන් වූ මොහොතේ සිටම වහාම ඉටු කළයුතු වූ කාර්යයන් රැසක් ඉටු නොකර හිතුවක්කාරී ලෙස මගහැර යමින් තිබෙන නිසාය.

උතුරේ අවතැන්වූවන් යළි පදිංචි කිරීම, ඔවුනට ජීවිතය පටන් ගැනීමට අවශ්‍ය ආධාර ලබාදීම, ඔවුන්ගේ ඉඩම් ආපසු ලබාදීම, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ ගැටළුව විසඳීම, සිවිල් පාලනය ස්ථාපිත කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය ස්ථාපිත කිරීම වැනි හදිසි පියවර ක්‍රියාත්මක කිරීමට කොමිසමක නිර්දේශ අවශ්‍ය වන්නේ නැත. යුද්ධය නිමාවූ මොහොතේම ජනතා විමුක්ති පෙරමුණ මේ සඳහා යෝජනා මාලාවක් ඉදිරිපත් කරමින් මැදිහත් වූ බවද අමතර කරුණක් ලෙස සඳහන් කළ යුතුය.

අවසාන වශයෙන් සඳහන් කළ යුත්තේ මෙම කොමිසම රටේ පැවති යුද්ධය නිමාවීමෙන් පසුද, තවමත් පවතින ජාතික ප්‍රශ්නයට විසඳුම් සෙවීමට වත් පාඩම් ඉගෙන ගැනීමටවත් ජාතික සමගිය ඇතිකිරීමට හෝ ප්‍රතිසන්ධානයක් ඇතිකිරීමට වත් පිහිටුවන ලද කොමිසමක් නොව ජනාධිපතිවරයා හා ආණ්ඩුව මුහුණ දුන් අර්බුදයෙන් ගැලවීම සඳහා පිහිටුවන ලද කොමිසමක් බවය. ඒ අර්ථයෙන් ගත්විට මෙය වෙනත් අවස්ථා වලදී මෙන්ම කාලය හා මහජන මුදල් නාස්ති කිරීමක්ද වී තිබේ. ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීමටවත් අඩු ගණනේ ඊට ආරම්භක පියවරක් තැබීමට හෝ ප්‍රශ්නය නිවැරදිව හඳුනාගැනීමටවත් ධනපති ක්‍රමය තුළ මෙතෙක් පැවති ආණ්ඩුවලට මෙන්ම වත්මන් ආණ්ඩුවටද වුවමනාවක් මෙන්ම හැකියාවක්ද නැතිබව මේ මගින් යළිත් පෙන්වා තිබේ.

## ආණ්ඩුවේ ශිෂ්‍ය මර්දනය වහා නවතනු!

**සමාජවාදී ශිෂ්‍ය සංගමය**

නිදහස් අධ්‍යාපනය රැකගැනීම වෙනුවෙන් ශිෂ්‍ය ව්‍යාපාරය දියත්කර ඇති සටනට සහය ලබා දෙන ලෙස ඉල්ලමින්ද ශිෂ්‍ය මර්දනය වහා නතර කරන ලෙස රාජපක්ෂ ආණ්ඩුවට බලකරමින්ද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක නලින්ද ජයතිස්ස සහෝදරයා පසුගිය 21වැනිදා මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එහි මෙසේ සඳහන්ය.

නිදහස් අධ්‍යාපනය වනසන පෞද්ගලික විශ්වවිද්‍යාල පනතට එරෙහිව විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව විසින් සංවිධානය කර තිබූ විරෝධතා පාගමනට ආණ්ඩුව පොලීසිය, අධිකරණය හා හමුදාව යොදවා බාධාකර තිබේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඇරඹීමට නියමිතව තිබූ මෙම විරෝධතා පාගමන වැළැක්වීම සඳහා ආණ්ඩුව විසින් අධිකරණ නියෝගයක් ලබාගෙන ඇති අතර අද (21) උදෑසන සිට පොලීසිය හා හමුදාව යොදවා විශ්වවිද්‍යාල පරිශ්‍රය වටකරගෙන සිටී. එසේම විශ්වවිද්‍යාල පරිපාලනය යොදාගෙන නේවාසිකාගාරවල සිටින සිසු සිසුවියන්ට තර්ජනය කර විරෝධතා පාගමන සඳහා පැමිණීම වැළැක්වීමට කටයුතුකර ඇත.

IMF - රාජපක්ෂ එකඟතා අනුව ගෙනඒමට නියමිත, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතිහාසයේ ඉදිරිපත් කෙරෙන භයානකම ලියවිල්ල වන පෞද්ගලික විශ්වවිද්‍යාල පනත 2012 ජනවාරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමට ආණ්ඩුව සූදානම්ව සිටී. විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්ට පමණක් නොව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවටද හොර රහසේ ගෙනඒමට සූදානම්කර ඇති මෙම පනත මගින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය කඩාවට්ටවන අතර පෞද්ගලික විශ්වවිද්‍යාල සඳහා නීතිමය ඉඩකඩද අධ්‍යාපනයේ ප්‍රමුඛතාවයද ලැබෙනු ඇත.

මෙම ජනතාද්‍රෝහී පනතට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරයේ සහ පොදු ජනතාවගේ විරෝධය නිසැකවම එල්ලවන බව රාජපක්ෂ ආණ්ඩුව දනී. එමනිසා කිසිවෙකුටත් නොදන්වා හොර රහසේම පාර්ලිමේනතුවට ගෙනවිත් ප්‍රෝඩාකාරී ලෙස ගොඩනගාගත් 2/3 බලය පාවිච්චිකර සම්මතකරගැනීම ආණ්ඩුවේ අරමුණයි. එයට එරෙහි වන ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය සඳහා ශිෂ්‍ය සංගම් තහනම් කිරීම, ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම, ශිෂ්‍යභාවය අහෝසි කිරීම, පංති තහනම් කිරීම, ආණ්ඩුවේ නිල හා නොනිල මැර කණ්ඩායම් ලවා ශිෂ්‍යයින්ට පහරදීම ඇතුළු මර්දනකාරී පියවර රැසක් පසුගිය වකවානුවේ ආණ්ඩුව ක්‍රියාත්මක කළේය. අද වන විට එයටත් ඉදිරියට යමින් සාමකාමී ශිෂ්‍ය විරෝධතා වැළැක්වීමට අධිකරණය නොමග යවමින් අධිකරණ නියෝග ගැනීමට පවා කටයුතුකර ඇත. විශ්වවිද්‍යාල තුළ පොලීසි පිහිටුවීමට කටයුතු කරනවාට අමතරව පොලීසිය හා හමුදාව ලවා විශ්වවිද්‍යාල වටකරන තැනට පත්ව ඇත.

සිය අයිතිවාසිකමක් වූ නිදහස් අධ්‍යාපනය රැකගැනීම වෙනුවෙන් ශිෂ්‍ය ව්‍යාපාරය දියත්කර ඇති සටනට සහය ලබා දෙන ලෙස අපි සමස්ත ලාංකේය ප්‍රගතිශීලී බලවේගවලින් ඉල්ලාසිටිමු. එසේම ශිෂ්‍ය මර්දනය වහා නතර කරනලෙසත් රාජපක්ෂ ආණ්ඩුවට බලකර සිටිමු.

## විරුද්ධවාදීන් මර්දනය කිරීමේ ආණ්ඩුවේ පිළිවෙත හෙළා දකිමු!

**ජනතා විමුක්ති පෙරමුණ**

ලලිත් කුමාර හා කුගන් මුරුගන් දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනා නිදහස් කිරීමට පියවර ගන්නා ලෙසත් පුද්ගල පැහැරගැනීම් වහා නතර කරන ලෙසත් ආණ්ඩුවට දැඩිව අවධාරණය කරමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය පසුගිය 13වැනිදා මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

පසුගියදා යාපනයේදී අතුරුදහන් වී ඇති ලලිත් කුමාර හා කුගන් මුරුගන් නම් දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනා පිළිබඳ තොරතුරක් මෙතෙක් අනාවරණය වී නොමැති බවට මාධ්‍ය වාර්තා පළවී තිබේ. ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනය නැවත වරක් රට හමුවේ ලෝකය හමුවේත් තහවුරු කරන මෙම පුද්ගල අතුරුදහන් කරවීම් ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩිව හෙළා දකිමු.

මෙය හුදෙකලා සිදුවීමක් නොවන අතර පසුගිය කාලයේ සිදුවූ මෙවැනි පැහැරගැනීම් ගණනාවක තවත් දිගුවකි. යාපනය වැනි ආණ්ඩුවේ ආරක්ෂක අංශ පාලනය දැඩිව ක්‍රියාත්මක වන තැනක සිදුවන පැහැරගැනීම් ආණ්ඩුවේ අවබෝධය රහිතව සිදුවේ යැයි විශ්වාස කිරීමට අපහසුය. එබැවින් මෙම අතුරුදහන්වීම් පිළිබඳව ආණ්ඩුවට ඇඟිල්ල දිගුවීම වැළැක්විය නොහැකිය. දේශපාලන විරුද්ධවාදීන් අරභයා කටයුතු කිරීම පිළිබඳ රාජපක්ෂ

15පිටුවට

# ආණ්ඩුවේ අවදානම හා ජනතාවගේ සූදානම



අපේ රටේ සෑම පාලකයෙකුගේම දෙවන ධූරකාලයත් සෑම පාලනයකම දෙවන පාලන කාලයත් අර්බුදයන්ගෙන් පිරි අවදානම් එකක් විය. දැන් රාජපක්ෂ පාලනයද එම අර්බුදකාරිත්වයට හා අවදානමට මුහුණ දී ඇත. 2011 වසර අවසන් වූයේ එක් අතකින් ආණ්ඩුවට බරපතළ පරාජයක් ගෙන දෙමින් හා ආණ්ඩුව උසස් පෙළ විභාග ප්‍රතිඵල අවුල් කිරීම මගින් පඹගාලක පැටලෙමිනි. වසර අවසන් වන විට ආණ්ඩුව ලැබූ පරාජය වූයේ, එළවළු ප්‍රවාහනයට ප්ලාස්ටික් කූඩ හඳුන්වා දීමට ගත් අත්තනෝමතික උත්සාහය ජනතා විරෝධය හමුවේ හකුළා ගැනීමට සිදුවීමය. 'ප්ලාස්ටික් කූඩ හඳුන්වාදීමේ තීරණය කිසිසේත් වෙනස් නොකරමි'යි, ඇමති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා වහසි බස් දෙඩූවද ජනතා විරෝධය හමුවේ දණ ගැසීමට ආණ්ඩුවට සිදුවිය.

සමාජ ක්‍රමයක් ලෙස ධනවාදය අර්බුදයට යද්දී එහි සෑම ක්ෂේත්‍රයක්ම අර්බුදයට හසුවේ. ආර්ථිකය තුළ මතුවන අර්බුදය දේශපාලනයද පරිපාලනයද ධනේශ්වර කළමනාකරණයද ධනේශ්වර සදාචාරයද ධනේශ්වර නීතියද වසා පැතිරෙමින් මහා අර්බුද ජාලාවක් බවට පත්වේ. එවැනි තත්වයක් තුළ අර්බුදයට නොගිය අරාජිකත්වයට පත් නොවූ කිසිදු ක්ෂේත්‍රයක් සොයාග ැනීමට හැකිවන්නේ නැත. මාක්ස් එංගල්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයේදී සඳහන් කළ පරිදි ''ශුද්ධ වූ සියල්ල කෙළෙසෙන්නේය''. දැන් ලංකාවේ ධනපති ක්‍රමය තුළ සිදුව තිබෙන්නේ එයයි. වර්තමානයේ ලංකාවේ මතුවන ප්‍රශ්න හා අර්බුද නිලධාරීන්ගේ පිට තබා ඇඟ බේරා ගැනීමට ඇමතිවරුන් උත්සාහ කරන අතර එය අසාර්ථක වන විට ප්‍රශ්නය ඇමතිවරුන් පිට තබා ඇඟ බේරා ගැනීමට ජනාධිපතිවරයා කටයුතකු කරන බව පෙනේ.

රට තුළ වර්ධනය වන දැවැන්ත ආර්ථික අර්බුදය තුළ දිනෙන් දින බඩුමිල ඉහළ යමින් ජනතාවගේ ජීවන බර වැඩිවේ. එනිසාම රටේ ණය කන්දරාවද 'බ්ලූමැන්ඩල් කුණු කන්ද' මෙන් දිනපතා වර්ධනය වේ. මේ තත්වය තුළ වැටුප් වැඩිවීම්, ආදායම් වැඩිවීම් හා සහන 'සිහින' බවට පමණක් පත්ව තිබේ. ඒ අතර වංචාව, නාස්තිය දූෂණය ඉහවහා යමින් තිබේ. රටේ මහා ආර්ථික අර්බුදයක් පවතිද්දී 2011 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ජනාධිපතිවරයා සඳහා ගෙන්වා ඇති වාහනවල වටිනාකම රු. මිලියන 379 ක් බව වාර්තාවේ. නාස්තිකාර වියදම් පිළිබඳ ඒ එක් උදාහරණයක් පමණි. අනෙක් අතට බාල බෙහෙත් ගෙන්වීම, බාල සිමෙන්ති ගෙන්වීම, බාල පෙට්‍රල් ගෙන්වීම වැනි කටයුතු නිසා රටට අහිමිවූ නාස්තිවූ මුදල විශාලය. බාල පෙට්‍රල් ගෙන්වීම නිසා පමණක් පාඩු වූ මුදල රු. කෝටි 49ක් බව වාර්තා විය. මේවා පරිපාලන දුර්වලතා පමණක් නොව දේශපාලන මැදිහත්වීම්වල අහිතකර ප්‍රතිඵලද වේ.

මේ වන විට මෙකී අර්බුද සමාජ අර්බුදයක් දක්වාද වර්ධනය වී තිබේ. සාමූහික ඝාතනයන් හා දිවිනසාගැනීම් මහා පරිමාණයෙන් ඉහළ ගොස් තිබේ. එකම පවුලේ හතර පස් දෙනා කපා කොටා හෝ වෙඩිතබා මරා දැමූ සිදුවීම් කිහිපයක්ම පසුගිය දෙසැම්බර් මාසයේ පමණක් වාර්තාවිය. අපරාධ, ස්ත්‍රී දූෂණ හා කප්පම් ඉල්ලා පැහැර ගැනීම්ද වැඩිවී තිබේ. මේ සියල්ල පෙන්නුම් කරනුයේ, ධනවාදය තුළ ලාංකේය සමාජය පත්ව ඇති ඛේදවාචකයයි. මේ කිසිවකට අවම හෝ විසඳුමක්, පිළිතුරක් ආණ්ඩුව සතුව නොපවතී. ආණ්ඩුවේ ප්‍රධානම උපාය මාර්ගය වී ඇත්තේ ''දවස ගෙවා ගැනීම සඳහා'' කුමක් හෝ කියමින්, කුමක් හෝ කරමින් ඇඟ බේරාගැනීමට උත්සාහ කිරීමය. එහෙත් දැන් එයද අවලංගු වෙමින් තිබේ. ආණ්ඩුව අවදානම් තත්වයට පත්ව ඇත්තේ ඒ අනුවය. පසු ගිය වසරේ ආණ්ඩුවේ පරාජය සනිටුහන් කළ හා ජනතාව ජයග්‍රහණය කළ ප්‍රබල අවස්ථා දෙකක් දැක ගැනීමට හැකි විය. ඉන් එකක් වූයේ පසුගිය මැයි මාසයේ පෞද්ගලික අංශය සඳහා, ගෙනඒමට සූදානම් වූ ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුප් පනතට එරෙහිව නිර්මාණය වූ සේවක අරගලය හමුවේ ආණ්ඩුව පරාජය වීමය. විශ්‍රාම වැටුප් පනත කුමන තත්වයක් තුළවත් ඉවත් නොකර ගන්නා බව මැයි දිනයේදී ජනාධිපතිවරයාට පැවසුවද ඉන් දින 30කට පසු එය හකුළා ගැනීමට ආණ්ඩුවට සිදුවූයේ ආණ්ඩුවේ බලයට වඩා ජනතා බලය ප්‍රබල බව පෙන්වමිනි. එසේම පසුගියදා ප්ලාස්ටික් කූඩ නීතිය අකුළාගැනීම මගින්ද ආණ්ඩුව පෙන්නුම් කළේ තම නොහැකියාව මෙන්ම ජනතා අරගල හමුවේ පසුබැස්මට සිදුවන බවය.

දැන් ආණ්ඩුවට එරෙහිව නිර්මාණය වී ඇති බරපතළම අර්බුදය වී ඇත්තේ, උසස් පෙළ විභාග ප්‍රතිඵල අවුල් වීමය. නිලධාරින්ගේ නොසැලකිල්ලත් බලධාරීන්ගේ වගකීම් විරහිතකමත් මීට හේතුවී ඇති බව බැහැදිලි නමුත් එවැනි තත්වයක්

මේ සියල්ල පෙන්නුම් කරනුයේ, ධනවාදය තුළ ලාංකේය සමාජය පත්ව ඇති ඛේදවාචකයයි. මේ කිසිවකට අවම හෝ විසඳුමක්, පිළිතුරක් ආණ්ඩුව සතුව නොපවතී. ආණ්ඩුවේ ප්‍රධානම උපාය මාර්ගය වී ඇත්තේ ''දවස ගෙවා ගැනීම සඳහා'' කුමක් හෝ කියමින්, කුමක් හෝ කරමින් ඇඟ බේරාගැනීමට උත්සාහ කිරීමය.

නිර්මාණය කළේ ඇමතිවරුන් හා ජනාධිපතිවරයාය. ඒ රටේ සියලු ආයතන ජනතාවට වග නොකියන, ඇමතිට හෝ ජනාධිපතිට ''කඩේ යන'' හෙංචයියන්ගෙන් පුරවා ඇති නිසාය. කෙසේ වෙතත් මෙම අර්බුදය ලක්ෂ ගණනක් සිසුන් හා ඔවුන්ගේ දෙමාපියන් ආණ්ඩුවට එරෙහි සටනකට කැඳවීමක් වී තිබේ. නිදහස් අධ්‍යාපනය වැනසීම සඳහා එස්.බී. දිසානායක ඇමතිවරයා යොදාග නිමින් ආණ්ඩුව කරගෙන යන අධ්‍යාපනය පෞද්ගලීකරණයට එරෙහි සටනත් සමඟ උසස් පෙළ ප්‍රතිඵල අවුල් වීමෙන් පීඩාවට පත් අයගේ සටනත් පෙළ ගැසුණු විට එය ආණ්ඩුවට පහසු වන්නේ නැත. මින් පෙනී යන්නේ, ආණ්ඩුව දිනෙන් දින ජනතා බලවේග තමන්ට එරෙහිව සටන් වදින තත්වයට පත්කරන ගනිමින් ජනතාවගෙන් වියෝ වෙමින් සිටින බවය.

දැන් ආණ්ඩුවෙන් ඉවත් වෙමින් සිටින්නේ, ජනතාව පමණක් නොවේ. ආණ්ඩුව තුළ තවමත් ලැගගෙන සිටින එහෙත් 'එන පොට හොඳ නැතිබව' කල්තියා හඳුනාගත් කපටි දේශාලනඥයෝද ආණ්ඩුවේ අර්බුදවලට තමන් නොගෑවී සිටීමට උපාය සොයති. පාඨලී චම්පික හා විමල් වීරවංශ වැනි ඇමතිවරු මේ දවස්වල කරන ප්‍රකාශ දෙස බලන විට එය පැහැදිලි වේ. මේ තක්කඩි ඇමතිවරුන් කොන්දේසි විරහිතව ආණ්ඩුව ආරක්ෂා කරන ඇමතිවරුන්ට වඩා භයානකය. ආණ්ඩුවේ 'බඹරය වැල්ලේදීත් කැරකෙන' කාලයේදී ඔවුන් එහි අයිතිය ගැනීමට, ජනාධිපතිවරයාට සමීප බව පෙන්වීමට උත්සාහ දරමින් ජනතාව රැවටූ ආකාරයෙන්ම දැන් 'තත්වය නරක් වී ගෙනඑන විට' තමන්ගේ ඇඟ බේරා ගැනීමට බොරු ආණ්ඩු විරෝධයක් පෙන්වති. නරකම ගණයේ දේශපාලනඥයන්ගේ ගණයට මේ අය වැටෙන්නේ ඒ නිසාය.

කෙසේ වුවත් පසුගිය කාලයේ සිදුවූ සිදුවීම්වල අයහපත් ප්‍රතිඵලවලත් පසුගිය කාලයේ ඇතිවූ අර්බුදත් පොදිබැඳගෙන හෙට දවසටද පිය නගද්දී මතුවිය හැකි බරපතළ තත්වයන් පිළිබඳ පෙරමග නිමිති දැන් පෙනෙන්නට පටන් ගෙන තිබේ. කැලැන්ඩරයට අනුව 'අලුත් අවුරුද්දක්' වන 2012 වසර එළඹී ඇත්තේ, පැරණි අභියෝග සමග මෙන්ම එකී අභියෝගවලට එරෙහිව අරගල කිරීමට ජනතාවගේ ඇති සූදානම පිළිබඳව සුභ පෙරනිමිතිද සමඟය. තමන්ට බලපාන බරපතළ ප්‍රශ්නවලදී ජනතාව ආණ්ඩුවේ වහසි බස් හෝ මර්දනය නොසලකා සටන් කරන බවත් එවැනි සටන් ජයගත හැකි බවත් ඒ සඳහා නිවැරදි නායකත්වයක් ලැබීමේ වැදගත්කම ගැනත් පසුගිය අරගල ජනතාවට උගන්වා ඇත. එක් පැත්තකින් විසඳාගත නොහැකි ආර්ථික, දේශපාලන, සමාජ අර්බුද රැසකට ආණ්ඩුව මුහුණ දී සිටින අතර අනෙක් පැත්තෙන් මෙතෙක් ආණ්ඩුව කොන්දේසි විරහිතව ආරක්ෂා කළ, ආණ්ඩුව තුළ සිටින කපටි ආරක්ෂකයින් ආණ්ඩුව විවේචනය කරමින් තම ඇඟ බේරාගැනීමට පටන් ගෙන තිබීම විසින් කියාපාන්නේ, ආණ්ඩුවේ පැවැත්ම අවදානමට ලක්වෙමින් තිබෙන බවය. ධනවාදයේ අර්බුදයේ ගැඹුරට අනුව ධනපති ආණ්ඩුව මෙන්ම ධනපති ක්‍රමයද අවදානමක පවතින බවය.

ආණ්ඩුවේ අවදානම එලෙස නිර්මාණය වෙද්දී, එය වර්ධනය වෙද්දී ඊට මුහුණ දීම සඳහා ජනතාවගේ සූදානම පිළිබඳවද විමසා බැලිය යුතුය. ධනපති ආණ්ඩුවත් ධනපති ක්‍රමයත් අවදානමට පත්වීම නරක දෙයක් නොවේ. එය හොඳ දෙයකි. එහෙත් එය හොඳ දෙයක් වන්නේ, ධනපති ක්‍රමයත් ආණ්ඩුවත් පරදා නව සමාජ පරිවර්තනයකට මග විවර කිරීමට ජනතාව සූදානම් නම් පමණි. ආණ්ඩුවේ අවදානම තුළ ජනතාවටද අවදානමක් තිබේ. තමන්ට එරෙහිව එල්ල වන ජනතා විරෝධයන්ට මුහුණ දී ගත නොහැකි ආණ්ඩුව සුපුරුදු පරිදි ජනතාවට එරෙහිව මර්දනය යොදාගැනීමේ ඉඩ තිබේ. එය ජනතාව මුහුණ දෙන අවදානමකි. එසේම නිර්මාණය වෙමින් පවතින ආණ්ඩු විරෝධය පටු අරමුණු වෙනුවෙන් කොල්ලකෑමට, එය තවත් ධනපති පාලනයකට පාර කැපීමට යොදා ගැනීම සඳහා විවිධ වෙස් ගත් කණ්ඩායම් යළි ජනතාව රැවටීමට උත්සාහ කරනුද පෙනේ. ධනවාදයේ පීඩාවට එරෙහිව කරන ජනතා අරගලය එලෙස අපතේ යාමේ අවදානමක් ද තිබේ.

එකී අවදානම් මගහැර පවතින අර්බුදයත් නිර්මාණය වන ආණ්ඩු විරෝධයත් ආණ්ඩුව පත්ව තිබෙන අවදානමත් ජනතාවගේ සැබෑ ජයග්‍රහණයක් දක්වා, එනම් සමාජවාදී සමාජ පරිවර්තනයක් දක්වා ගෙනයා හැකි වන්නේ, ජනතාව අවබෝධයෙන් හා සූදානමින් සිටින්නේ නම් පමණි. එබැවින් ආණ්ඩුවේ අවදානම හමුවේ ජනතාවගේ සූදානම ඉතාම තීරණාත්මකය. ඒ සඳහා මැදිහත් වීම, ජනතාව දැනුවත් කිරීම, ජනතාව සූදානම් කිරීම හා නිවැරදි අරගලයන් සඳහා ජනතාවට නායකත්වය දීම සැබෑ වමේ හා ප්‍රගතිශීලී ව්‍යාපාරයන්ගේ වගකීම වේ. ජනතා විමුක්ති පෙරමුණත් සියලු ප්‍රගතිශීලී හා සැබෑ දේශප්‍රේමී බලවේගත් හමුවේ ඇත්තේ එම වගකීමය. 2012 වසර සැබෑ ලෙසම සුබ නව වසරක් වනු ඇත්තේ, එකී වගකීම ඉටු කිරීමට ඉහත බලවේග සමත්වීම මතය.



''බයිනෙත්තුවේ ශක්තියෙන් පමණක් ස්වකීය බලය රැකගෙන සිටින, ජනතාවගේ කෝපය නිරතුරුවම හිරකර හෝ මැඩ පවත්වා තැබීමේ මාර්ගයෙන් පවතින ආණ්ඩු බොහෝ කලක සිටම අවබෝධ කර ගෙන සිටින සුප්‍රසිද්ධ සත්‍යය වන්නේ, පොදු ජන අප්‍රසාදය ඉවත් කළ නොහැකිය යන්නය. එම අප්‍රසාදය ආණ්ඩුව කෙරෙන් වෙනත් අරමුණක් වෙතට යොමු කිරීමට අවශ්‍ය බව එම ආණ්ඩු උගනියි''

**ලෙනින්**

**පෙරදිග ලෝකයේ ජාතික විමුක්ති ව්‍යාපාරය**



# පරගම්මන කඳු පියසේ මතකය ...

**(2011 සමාජවාදී තරුණ කඳවුර පිළිබඳ ලියවුණු සටහනක්)**



එතන තිබුණේ බොහෝම කඩිසර බවක්. හැම කොනකුගෙම මුහුණු බලාපොරොත්තුවලින් පිරිල. උතුරින්, දකුණින්, නැගෙනහිරින්, බටහිරින්, කඳුකරෙන් හැම පැත්තෙන්ම ආපු සොයුරු සොයුරියන් එකිනෙකා හඳුනාගනිමින් සිටියා. තමත් මුහුණ දුන් අප්‍රසන්න අත්දැකීම් පරදවන අධිෂ්ඨානයක් ඒ මුහුණු තුළ ගැබ්වෙලා තිබුණා. ඉඳහිට වැටුණු සිරි පොදක් තිබුණත් සිසිල් සුළං හමායන සෞම්‍ය කාලගුණය තාරුණ්‍යයේ චමත්කාරය තවත් වැඩි කළා. මේ විදියට කැගලු පුරයේ පරගම්මන කඳුගැටය අලුත්ම අත්දැකීමකට සූදානම් වෙමින් සිටියා.

දෙසැම්බර් 17 දහවල් වැඩසටහනක් ආරම්භ වුණා. විශ්වාසය, අවබෝධය, ක්ෂණික තීරණ හා සාමූහිකත්ව ගැන අපූරු හැඟීමක් ඇති කරපු කණ්ඩායම් ක්‍රියාවකින්. අපි හැමෝටම කළ හැකි දේ බොහෝයි කියන හැඟීම හැම දෙනෙක් තුළම ඇති කරන්න වැඩසටහන මෙහෙයවපු සහෝදරවරු සමත් වුණා.

ලෝකය පාලනය කරන්නේ සිතුවිලිද? මේ ප්‍රශ්නය අපි ගොඩක් අයගේ සිත් තුළ තෙරපෙන තරමක් සංකීර්ණ ප්‍රශ්නයක්. ඒ සංකීර්ණකම ඉතාමත් සරල කරල, මිනිස් මොළය, එහි පරිණාමය හා ක්‍රියාකාරීත්වය ගැන වෛද්‍ය විද්‍යාව පැත්තෙනුත්, සමාජ විද්‍යාව පැත්තෙනුත් සුපැහැදිලිකමක් ඇති කර ගන්න ඊළඟ දේශනය කාටත් වැදගත් වුණා. හොල්මන් අවතාරවලට මීට පස්සෙ නම් මේ කවුරුත් බය වෙන්නේ නැහැ.

සෙනසුරුගේ වාහනේ කපුටා. කාට හරි සෙනසුරු ඒරාෂ්ඨකයක් ආවම බලු කපුටු දාන දෙන්නෙ කපුටන්ට ශක්තිය ලැබෙන්න, සෙනසුරුත් අරගෙන වේගයෙන් පියාඹන්න. ලොකු බෙන්ස් කාර්වලින් ඇවිත්, ටයිකෝට් දාගෙන හන්දි ගානේ කාක්, කාක් කිය කිය කෑ ගහන බලු කපුටු දාන දෙන අය මේ කතාව දන්නව නම්. ඒ වගේම විවාහය සුභ කරගන්න, රාජ යෝග තියෙන දරුවන් ලබන්න නක්ෂත්‍රය අනුව ''සූත්‍රය'' දාන්නෙ කොහොමද කියල රෑ තිබුණු දේශනයේදී කාටත් තහවුරු වුණා. ඒ විතරක් නෙමේ, ඇස්බැන්දුම්වලින් කොහොමද අපිව රවට්ටන්නෙ කියල ප්‍රායෝගිකවම පෙන්නුවා. ඒබ්‍රහම් ටී කොවුර් කියන විශිෂ්ට භෞතිකවාදියා ගැනත්, තවමත් විවෘතව තිබෙන එයාගේ අභියෝගයන් ගැනත් ආඩම්බරයක් කා තුළත් ඇති වුණා. ගිනි පෑගීමේ හා ගිනි පන්දම් ඇඟ දිගේ ගෙන යන ''හාස්කමට'' අදාළ විද්‍යාව ප්‍රායෝගිකවම තේරුම් ගන්න ගිනි පාගපු කාටත් පුලුවන් වුණා.

රෑ කෑම මොහොත වෙන කොට දර්ශනයේ ගැඹුරු පාඩමක් වන භෞතිකවාදය ගැන පුළුල් හැඟීමක් ඇති කරගන්න හැමෝටම පුළුවන් වුණා. කෑමෙන් පස්සෙ තමයි සොඳුරුම රාත්‍රිය ආරම්භ වුණේ. තරුණ සංගමේ සංගීත කණ්ඩායමේ නාද රටාවන් එක්ක අපේම සොයුරු සොයුරියන්ගේ හඬවල් ඒකාත්මික වුණා. සිංහලෙන්, දෙමළෙන්, වගේම ඉංග්‍රීසියෙනුත් ගායනා ඉදිරිපත් කරමින් සංගීතය විශ්ව භාෂාවක් වගේම අපිත් සැබෑම ජාත්‍යන්තරවාදීන් කියන උතුම්ම සහෝදර හැඟීම ජනිත කළා. ඒ අතරේ වේදිකාගත වුණු කෙටි නාට්‍යය ඉදිරිපත් කළ බදුල්ලේ සහෝදර සහෝදරියන් ගැඹුරු කතාවක් කිව්ව. කුරිරු යුද්ධයට වැහිලා ගියපු උතුරේ තරුණ ජීවිතවල පොදු සමාජය නොදැකපු ඇත්ත කතාව ඔවුන් හඬ නගල කිව්වා. කාගෙත් ඇස්වලට කඳුලක් නැඟුණ. හදවත් වේදනාවෙන් බර කළා. මේ ඔක්කොම මැද්දෙ මධ්‍යම රාත්‍රියත් පසුවෙනව කාටවත් දැනුනෙ නැහැ.













18 වෙනිද කරන්න වැඩ ගොඩක් ඉතිරිව තියෙන නිසා අකමැත්තෙන් වුණත් ප්‍රසංගය අවසන් කරන්න සිදු වුණා.

පහුවෙනිද වෙහෙස නොබලම හැමෝම පාන්දර අවදි වුණා. පිනි බිංදු පිරිලා, මීදුම පොරවගෙන හිටපු ක්‍රීඩා පිටිය උණුසුම් කරවන තරග පිටියක් බවට පත් වෙන්න වැඩි වෙලාවක් ගියේ නැහැ. තරගකාරීත්වය, සාමූහිකත්වය හා සහෝදරත්වය උපරිමව පෙන්නපු මේ අත්දැකීම, එකිනෙකා අතර අවබෝධය පළල් කරන්නත් ලොකු දායකත්වයක් දුන්නා.

ඉන් පස්සේ යහපත් ලෝකයක් තනන්න අපි කා තුළත් තියෙන සුන්දර අරමුණ යථාර්ථයක් කර ගන්න අපි මොකද කළ යුත්තේ, කියන ප්‍රශ්නය ගැන අධ්‍යාපනිකවත්, න්‍යායිකවත් හදාරන්න අවශ්‍ය කරන මඟ පෙන්වීමක් පක්ෂයේ ප්‍රධාන ලේකම් සහෝදරයා ලබා දුන්නා. සමාජවාදය බිහි කිරීම ගැන, ඒ ක්‍රියාවලිය සඳහා තියෙන උපායමාර්ගය ගැන සමහර කට්ටිවාදීන් ඇති කරල තියෙන දුර්මත ගැන පුළුල් සංවාදයක් මෙතනදී සිදු වුණා. මාක්ස්, ලෙනින් වාගේම අපේ සදාදරණීය රෝහණ සහෝදරයත් අපි ළඟින්ම ඉන්නව කියන හැඟීම කා තුළත් ඇති වුණා.

දිවා ආහාරයෙන් පස්සේ තිබුණ සොබාදහමේ චමත්කාරය විඳින්නයි. ඝන කැලෑවේ ගස්, වැල්, අතරින් යමින් කටු වැල් පැටලෙමින් අමාරුවෙන් කණ්ඩායම් අධ්‍යයනය සිදු කළා. අමාරුම ප්‍රශ්නය වුණේ කූඩැල්ලන්ගෙන් බේරෙන එක.

කොයිතරම් න්‍යායික දේවල් දැනගත්තත්. ඒවා නිවැරදිව භාවිතා කිරීම කොතරම් දුෂ්කරද කියන එක සරල උදාහරණ ගොඩකින් කතා කෙරුණෙ ඊළඟ සංවාදයෙදියි.

සවස තේ පානයෙන් පස්සෙ අල්ටමීරා ගුහාවල ඉඳන් මොනාලිසා මගින් වර්තමානය දක්වා කලාව ගලාගෙන ඇවිත් ඇති ආකාරය ගැන කලාත්මක සංවාදයක් ඇති වුණා. කලාව අහසේ තියෙන ඕපපාතික දෙයක්ය කියන අයට විද්‍යාත්මක පිළිතුරු මේ සාකච්ඡාවේදී ලැබුණා. ඉන් පස්සේ ලංකාවේ ප්‍රවීනම රංගධරයෙක් එක්ක, ඒ කියන්නේ ජයලත් මනෝරත්න මහත්මයත් එක්ක කලාව ගැන අපූරුම, රසවින්දනාත්මක සංවාදයක් කරන්න කාට කාටත් භාග්‍ය උදා වුණා. දෘශ්‍ය, ප්‍රාසාංගික සහ සාහිත්‍යය ලෙස කලා නිර්මාණ වර්ග කරමින් එහි සමාජමය කාර්යභාරය ගැන සංවේදී හැඟීමක් මේ සංවාදයේදී ඇති වූ බව කිව යුතුමයි.

"සුදු නෙළුම කෝ සොර බොර වැවේ
මල් සුවඳ දුන් මහියංගනේ............''

මනෝ අයියාගෙ හඬ කාගෙත් හදවත් සසල කරමින් දෝංකාර දුන්නා. පුෂ්කින්, ටෝල්ස්ටෝයි, දොස්තොව්ස්කි, වගේම සේකර හා සරත්චන්ද්‍රයනුත් ශාලාවේ ඉදිරිපිට ඉන්නව වගේ කාටත් දැනුන වෙලාවක්, ඒ සොඳුරු මොහොත.

ලොව පුරාම පැතිර යන තරුණ අරගල ගැන බිමල් රත්නායක සහෝදරයා ඉදිරිපත් කරපු වැඩසටහන හැමෝම තුළ ජාත්‍යන්තරවාදී ජීව ගුණය වඩවන්නක් වුණා.

සමාජවාදී තරුණ කඳවුර නිමවන විට 18 වෙනිද මධ්‍යම රාත්‍රිය ආරම්භ වී තිබුණා. හැමෝගෙම තිබුණු බලාපොරොත්තු මල් ඵල ගැනුණු, අලුත් වීර්යයක්, අලුත් ජවයක් එක් කෙරුණු, සහෝදරත්වය කැටි කෙරුණු දෙදිනක් අවසන් උණා. සමාජවාදී තරුණ සංගමය ගැන අපේ පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ගැන වඩාත් ගැඹුරු හා ආදරණීය හැඟීමක් කා තුළත් නොමැකෙන ලෙස සටහන් කරන්නට මේ කඳවුර සමත් වූ බව සහතිකයි.

# IMAGINE

## හිතන්න!

## John Lennon



(1980 දෙසැම්බර් මස ඝාතනය කරන ලද Beatles කණ්ඩායමේ සාමාජික ජෝන් ලෙනන්ගේ Imagine ගීතයේ සරල පරිවර්තනයකි)

හිතන්න, දෙවිලොවක් නැතැයි කියා
එය පහසුයි, ඔබ උත්සාහ කළොත්
අපට පහළින් අපායක් නැත
නැත අපට ඉහළින් අහස හැර අන්‍යයමක්
හිතන්න, සියලුම මිනිසුන් අද වෙනුවෙන් ජීවත් වන හැටි

හිතන්න, රටවල් නැතැයි කියා
එය අපහසු දෙයක් නොවෙයි කෙරුමට
එවිට මැරෙන්නත්, මියදෙන්නත් දෙයක් නොවනු ඇත.
ආගම් නැතැයිද සිතන්න
හිතන්න, සියලුම මිනිසුන් සාමයෙන් ජීවත් වන හැටි...

ඔබ, ඔබ සිතාවී මා, සිහින දකින්නෙක් කියා
නමුත් එසේ සිටිනුයේ මා පමණක් නොවේ!
මම හිතනව ඔබත් යම් දිනෙක අප හා එක්වනු ඇතිබැව්
එමෙන්ම ලෝකය එකක් වනු ඇති බව!

හිතන්න! පෝලිම් නැතැයි කියා
මට පුදුමයි ඔබට එසේ සිතිය හැකිද, කියා
එවිට පොදි ගසන්නටත්, සාගතයෙන් සිටින්නටත් අවශ්‍ය නොවනු ඇත
මිනිස් සහෝදරත්වයත්
හිතන්න, සියලුම මිනිසුන් ලෝකය බෙදාහදාගෙන ජීවත් වන හැටි......
ඔබ, ඔබ සිතාවී මා සිහින දකින්නෙක් කියා.!
නමුත් එසේ සිටිනුයේ මා පමණක් නොවේ!
මම හිතනවා ඔබත් යම් දිනෙක අප හා එක්වනු ඇති බැව්!..
එමෙන්ම ලෝකය එකක් වනු ඇති බැව්!

Imagine there's no heaven
It's easy if you try
No hell below us
Above us only sky
Imagine all the people living for today

Imagine there's no countries
It isn't hard to do
Nothing to kill or die for
And no religion too
Imagine all the people living life in peace

You, you may say
I'm a dreamer, but I'm not the only one
I hope some day you'll join us
And the world will be as one



Imagine no possessions
I wonder if you can
No need for greed or hunger
A brotherhood of man
Imagine all the people sharing all the world

You, you may say
I'm a dreamer, but I'm not the only one
I hope some day you'll join us
And the world will live as one

## 1959 ජනවාරි 01 - 2012 ජනවාරි 01

# කියුබානු විප්ලවය දිගුකල් දිනේවා!




''සෝවියට් දේශය තුළ අප අත්දුටු ඓතිහාසික යථාර්ථයක් තිබුණා. කියුබාවේ ස්ටාලින්වාදයක් තිබුණේ නැහැ. බලය අයුතු ලෙස භාවිතය, නිල ඡායාරූප පිළිරූ නැහැ. පෞද්ගලිකත්වයේ සංස්කෘතිය මෙහෙ තිබුණේ නැහැ. අපි හැම වෙලාවේම පෞද්ගලිකත්වයේ සංස්කෘතියට විරුද්ධ වුණා.
අපට අප අතින් සිදු නොවූ වැරදිවලට පිළියම් හොයන්න අවශ්‍ය නැහැ. මෙහෙ බලහත්කාරී සාමූහිකකරණය තිබුණේ නැහැ. අපි එක් මූලධර්මයකට ගරු කළා. සමාජවාදය ගොඩ නගන්නේ නව සමාජයක් ගොඩ නැගීමට කැමති නිදහස් මිනිසුන්ගෙන්...

''විප්ලවය එය විසින්ම ආරක්ෂා විය යුතුයි. එය ආරක්ෂා වන්නේ එලෙසයි. අපට න්‍යෂ්ටික අවි තිබීම නිසා හෝ අප පොහොසත් නිසා එය ආරක්ෂා වන්නේ නැහැ. අප වසර 46ක් සම්බාධකවලට මුහුණ දුන්නා. විවිධ බාධක හා හිරිහැර ! අපි විශේෂ දුෂ්කර කාලයක් පසුකළා. කිසිම රටක් ජනතාවගේ සහයෙන් තොරව එලෙස ආරක්ෂා වන්නේ නැහැ.
ජනතාවගේ දේශපාලන කැමැත්ත නැතිව එසේ වන්නේ නැහැ.''

**ෆිදෙල්**



# නව වසර අරගල වසරක්
# නායකත්වය දෙන්න ජ.වි.පෙ. සූදානම්

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

***නියමුවා:***
***2012 වසර ආරම්භ වන විටම ජනතා විමුක්ති පෙරමුණ ජනවාරි 01 වෙනිදා විශේෂ පක්ෂ සම්මේලනයක් පවත්වන්න තීරණය කරලා තියෙනවා ඒ ඇයි?***

*ටිල්වින් සහෝදරයා*
අපි 2011 පෙබරවාරි 10 වෙනිදා අපේ පක්ෂයේ 06 වෙනි ජාතික මහ සමුළුව පැවැත්වුවා. අපේ පක්ෂයේ මහ සමුළු සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ වසර 05කට වරක්. ඒ අනුව 07 වන ජාතික මහ සමුළුව පැවැත්විය යුතු වන්නේ 2016 දීයි. ඒත් 2012 ජනවාරි 01 දා විශේෂ සමුළුවක් පවත්වන්න අපි තීරණය කළා. ඒ, ප්‍රධාන හේතු කිහිපයක් නිසයි. පසුගිය කාලයේ අපේ පක්ෂය තුළ කල්ලියක් නිර්මාණය වෙමින් පැවතියා. ඒ කල්ලිය පක්ෂයේ මතයට වෙනස් මත සහ වැරදි මත අසංවිධානාත්මකව පළකරමින් සිටියා. ඒ වගේම පක්ෂයේ සංවිධාන මූලධර්ම උල්ලංඝනය කරමින් කටයුතු කළා. ඒ පිළිබඳව පක්ෂය තුළ සාකච්ඡා වෙමින් තිබුණ කාලේ ඒ කියන්නේ පසුගි ය සැප්තැම්බර්වල. මේ තත්වය තුළ විශේෂ සමුළුවක් ඉදිරි මාස කිහිපය තුළ පැවැත්විය යුතු යැයි කියලා පක්ෂයේ මධ්‍යම කාරක සභාව තීරණය කළා. ඒ තීරණය ගත්තේ පසුව පක්ෂයෙන් ඉවත්ව ගිය කණ්ඩායම මධ්‍යම කාරක සභාව තුළ සිටියදී ඔවුන්ගේද කැමැත්ත අනුවයි. ඒ අනුව එම විශේෂ සමුළුව 2012 ජනවාරි 01 දින පවත්වන්න අපි තීරණය කළා. ඒ, එක හේතුවක්. අනික මේ වනවිට අපේ රටේ ධනවාදය බරපතළ ලෙස අර්බුදයට ලක්වෙලා තියෙනවා. අපේ ජනතාව ඉදිරිපිට, අපි ඉදිරිපිට අභියෝග රැසක් මතුවෙලා තියෙනවා. ධනවාදයේ පීඩාවට එරෙහිව ජනතාව තැනින් තැන අරගල කරන්න පටන් ගෙන තිබෙනවා. මේ අනුව ඉදිරි වසර අරගල වසරක් වේවි කියලා අපි හිතනවා. එහිදී එම අරගලයන්ට වමේ නායකත්වයක් ලබාදෙමින් එම අරගල ජනතා ජයග්‍රහණ වෙත මෙහෙයවීම සඳහා පක්ෂය හා පන්තිය සූදානම් කළ යුතු වෙනවා. විශේෂ සමුළුවක් පැවැත්වීමට එයත් හේතුවක්. ඒ නිසා අපි මේ සමුළුවේදී ඉදිරි අභියෝගවලට මුහුණ දීම සඳහා පක්ෂය සූදානම් කිරීමටත් ඒ සඳහා නව දේශපාලන යෝජනා සහ වැඩපිළිවෙළවල් සම්මත කර ගැනීමටත් ඒ වගේම පක්ෂය මෙහෙයවීම සඳහා නව මධ්‍යම කාරක සභාවත් පත්කර ගැනීමටත් බලාපොරොත්තු වෙනවා. මෙම පක්ෂ සමුළුව පැවැත්වීමට යොමු වුණු ප්‍රධාන හේතු ඒවායි.



> "අපේ ජනතාව ඉදිරිපිට, අපි ඉදිරිපිට අභියෝග රැසක් මතුවෙලා තියෙනවා. ධනවාදයේ පීඩාවට එරෙහිව ජනතාව තැනින් තැන අරගල කරන්න පටන් ගෙන තිබෙනවා. මේ අනුව ඉදිරි වසර අරගල වසරක් වේවි කියලා අපි හිතනවා. එහිදී එම අරගලයන්ට වමේ නායකත්වයක් ලබාදෙමින් එම අරගල ජනතා ජයග්‍රහණ වෙත මෙහෙයවීම සඳහා පක්ෂය හා පන්තිය සූදානම් කළ යුතු වෙනවා."

***නියමුවා:***
***මේ සමුළුව ප්‍රජාතන්ත්‍රවාදී නොවන බව පක්ෂයෙන් ඉවත්ව ගිය අය චෝදනා කරනවා. ඒ ගැන ඔබේ අදහස?***
*ටිල්වින් සහෝදරයා*
ඒක මුළුමනින්ම අසත්‍ය හා වැරදි අදහසක්. අපි මේ සමුළුව පවත්වන්නේ, පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව හා ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී ලෙසයි. ඒ අනුව අපි පක්ෂයෙන් ඉවත්ව ගිය අය ඇතුළු සියලුම පූර්ණ සාමාජිකයින්ට මේ සමුළුව ගැන දනුම්දීලා ලියාපදිංචි තැපෑලෙන් ලියුම් යවා තියෙනවා. සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ජාතික පුවත්පත්වල සාමාජිකයන්ගේ දැන ගැනීම සඳහා සමුළුව පිළිබඳ දැන්වීම් පළ කර තිබෙනවා. මැතිවරණ කෙනෙකුට හිනායනවා. ඒ වගේම මේ අය ගැන අනුකම්පාත් හිතෙනවා. ඒ තරම්ම පරස්පරයන් තමයි තියෙන්නේ. මුලදී සමුළුවක් ඉල්ලා කෑ ගැහුව්වා. දැන් සමුළුව වැරදි කියලා කෙඳිරි ගානවා. මේ විශේෂ සමුළුව තිස්සමහරාමයේ පැවැත්වීම ගැටලුවක් වෙන්නේ කොහොමද? අපි 1995 විශේෂ සමුළුව තිබ්බෙත් තංගල්ලේ. කොළඹ සමුළු තියන විට තිස්සමහරාමය, හම්බන්තොට සාමාජිකයන්ට කොළඹ එන්න පුළුවන්නම් ඇයි මේ අයට තිස්සමහරාමයට යන්න අමාරු වෙන්නේ. මේ අය කැමති කොළඹ කුරුඳුවත්තේ තියන සමුළුවලටද? මේව පදනමක් නැති කතා.
අනෙක් කරුණ මේ සමුළුව අපි තියන්නේ අපේ තනතුරු රැක ගන්න කියන එකත් කුහක කතාවක් අපේ පක්ෂයෙ කවදාවත් තනතුරු පිළිබඳ ගැටලුවක් තිබුණේ නැහැ. වමේ ව්‍යාපාර විප්ලවවාදී ව්‍යාපාර 'තනතුරු' ප්‍රශ්න බවට පත්කර ගත්තේ නැහැ. ඒත් මේ අයට නම් තනතුරු මෙනියාව තිබෙන බව ඒ අයගේ භාවිතයෙන් පේනවා. අපේ පක්ෂයේ තියෙන්නේ තනතුරු නෙවෙයි, වගකීම්. මේ වගකීම් අපට පැවරුවේ, පසුගිය පෙබරවාරි සමුළුවෙනුයි. ඒ වගකීම් තව වසර 05 ක් අපට දරන්න පුළුවන්. ඒ නිසා තනතුරු රැකගැනීමේ ප්‍රශ්නයක් අපට නැහැ. ඒත් තනතුරු ලබාගැනීමේ කෑදරකමක් ඉවත්ව ගිය අයට තිබුණ බවක් නම් අපට තේරෙනවා. කොහොම වුණත් මේ පිරිස කොමසාරිස්වරයාට නිල ලෙස දනුම්දී තියෙනවා. ඉතින් තවත් මොනවද කරන්න තියෙන්නේ. ඒ තමයි ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සමුළුව පවත්වන ක්‍රමය. එය නොදන්නා අය හා සමුළුවේ ප්‍රජාතන්ත්‍රවාදයට බය අය, කල්ලි හදාගත් අය කියන මුසා අපි ගණන් ගන්නේ නැහැ. අපි පක්ෂ සමුළුව පවත්වන්න තීරණයක් ගෙන තිබියදීත් රට මුලා කිරීම සඳහා මේ අය පක්ෂයෙන් එළියට ගිහින් සමුළුවක් ඉල්ල ඉල්ලා කෑගැහුවා. දැන් සමුළුව පවත්වන කොට ඒ ගැන අවලාද කියනවා. වාරණ නියෝග ඉල්ලා උසාවි යනවා. ඒ, සමුළුව හෝ ප්‍රජාතන්ත්‍රවාදය ඕනැ නිසා නෙමෙයි; ඊට තිබෙන අකමැත්ත නිසා.

***නියමුවා:***
***කොහොම වුණත් මේ සමුළුව පවත්වන්නේ තනතුරු දරන අයගේ තනතුරු රැකගැනීමට බවත් සමුළුව යන්න බැරි මුල්ලක පවත්වන බවත් ආදී චෝ දනා රැසක්ම මේ අය නගා තිබෙනවා?***

*ටිල්වින් සහෝදරයා:*
මේ කණ්ඩායම පක්ෂයෙන් ඉවත්වෙලා ගියාට පස්සේ මාධ්‍යවලට ඒ ඒ වෙලාවේ කියපු දේවල් එකතු කරල පෙළගස්වල බැලුවොත් ඕනැම නගන අවලාදවලට පිළිතුරු දිය යුතු තරම්වත් ඒවා නෙවෙයි. ඒ නිසා ඒ අයට තමන් කැමති බොරු කියන්න ඉඩ දීලා අපි අපේ කාර්යය කරගෙන යනවා.

***නියමුවා:***
***රට මුහුණපා තිබෙන අභියෝග රැසක් ගැන ඔබ සඳහන් කළා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළොත්.***

*ටිල්වින් සහෝදරයා:*
මේ වනවිට මුළු ධනවාදී ලෝකයම පවතින්නේ බරපතළ ආර්ථික අවපාතයක. 2008 සැප්තැම්බර්වල එක්සත් ජනපදයෙන් ආරම්භ වුණු දැවැන්ත ආර්ථික පසුබෑම තවමත් යුරෝපය පුරා හමා යනවා. එහි අනිවාර්ය බලපෑම අපේ රට වගේ දුබල පසුගාමී ධනපති රටවලට තදින් දැනෙනවා. දැන් අපේ රටෙත් තියෙන්නේ ලොකු ආර්ථික අර්බුදයක්. ඒ තුළ ආණ්ඩුව කටයුතු කරන්නේ, අධිරාජ්‍යවාදයට අවශ්‍ය ලෙසයි. පසුගිය අයවැය ඉදිරිපත් කළ ආණ්ඩුව රුපියල 3% කින් අවප්‍රමාණ කළා. ආණ්ඩුව කිව්වේ එයින් අපේ අපනයනවලට වාසි ලැබෙනවා කියලයි. ඒත් අපේ රටේ අපනයනවලට වඩා ආනයන විශාල වශයෙන් වැඩියි. ඒ අනුව රුපියල බාල්දුවීම රටට අවාසියි. එපමණක් නොවෙයි අපේ රටට අරගෙන තිබෙන විදේශීය ණය ප්‍රමාණය රුපියල්වලින් ගණන් බලද්දී මේ තීරණය නිසාම 3%කින් නිකම්ම වැඩිවෙනවා. ඉතිං ආණ්ඩුව රුපියල බාල්දු කළේ රටට වාසි ලබාදෙන්න නොවේ. මූල්‍ය අරමුදල සතුටු කරන්නයි. ඒ වගේම ආණ්ඩුව රටේ ඉඩම් ටික විකුණනවා. කඩදාසි සංස්ථාව අඩු ගාණට ඕස්ට්‍රේලියාවට වික්කා. අපේ අධ්‍යාපනය පෞද්ගලීකරණය සඳහා දිගටම ක්‍රියාත්මක වෙනවා. ඊට එරෙහිව අරගල කරන විට ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය කරනවා. ශිෂ්‍ය සංගම් තහනම් කරනවා. පුද්ගලයන් පැහැර ගෙන යනවා. විරුද්ධවාදීන්ගෙ න් පලිගන්නවා. ඒ වගේම බඩුමිල වැඩිකරනවා. මේ සියලු කාරණාවන්ට එරෙහිව ජනතාව තුළ විශාල විරෝධයක් වර්ධනය වෙමින් තිබෙනවා. එය තමන්ට බලපාන ඕනෑම ප්‍රශ්නයකදී පුපුරා යනවා. එම අරගල අපතේ යෑමට නොදී ඒවාට නිවැරදි නායකත්වයක් ලබාදිය යුතුයි. ඒ සඳහා මැදිහත්වීම තමයි අපි ඉදිරියේ ඇති අභියෝගය.

***නියමුවා:***
***ආණ්ඩුව ශක්තිමත් බවත් විපක්ෂය දුර්වල බවත් නිතර පැවසෙනවා. එවැනි තත්වයකදී ඉහත අභියෝග ජයගැනීමට ජ.වි.පෙ.ට පුළුවන්ද?***

*ටිල්වින් සහෝදරයා:*
ආණ්ඩුව ශක්තිමත් බවත් විපක්ෂය දුර්වල බවත් මතුපිටින් බැලූ බැල්මට ඇත්ත වගේ වුණාට හරයෙන් එහෙම නෙවෙයි. ආණ්ඩුවේ බලයට වඩා ජනතාවගේ බලය වැඩියි. එය ශක්තිමත්. මේ ඉතාමත් ශක්තිමත් කියන ආණ්ඩු

15වැනි පිටුවට



විප්ලවය කරන්නට නම් විප්ලවාදී පක්ෂයක් තිබිය යුතුමය. විප්ලවාදී පක්ෂයක් නැතිව මාක්ස් - ලෙනින්වාදී විප්ලවාදී න්‍යාය මත විප්ලවාදී ශෛලිය අනුව ගොඩනංවන ලද පක්ෂයක් නැතුව, අධිරාජ්‍යවාදය හා ඒ පස්සේ දුවන බල්ලන් පරාජය කිරීමට කම්කරු පංතියටත් පළල් බහුජන සමූහයන්ටත් නායකත්වය දෙන්නට කොහෙත්ම බැරිය.

**මාවෝ සේතුං - තෝරාගත් කෘති 2 පිටුව**

# අයවැය විරෝධය රටපුරා

ආණ්ඩුවේ ප්‍රෝඩාකාරී අයවැයට, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ රට පුරා සංවිධානය කළ විරෝධතා ව්‍යාපාරවලට විශාල ජනතා ප්‍රතිචාරයක් හිමිවිය. නොවැම්බර් මාසයේ 16 වැනිදා ආරම්භ කළ එම උද්ඝෝෂණ ව්‍යාපාරයේ සාර්ථකත්වය සමගින් උඳුවප් සීතල පළවා හැර අරගල බිම උණුසුම් වී තිබිණ. දෙසැම්බර් 04 වැනිදා කිරිබත්ගෙ ාඩ නගරයේදී පවත්වන ලද උද්ඝෝෂණයට විශාල පිරිසක් සහභාගි වූ අතර දෛනික කටයුතුවලට නගරයට පැමිණ සිටි ජනකාය ඊට සහයෝගය පළ කළේය.

කිරිබත්ගොඩ නගරය අයත්වන්නේ කැළණිය මැතිවරණ බල ප්‍රදේශයටය. කැළණිය මැතිවරණ බල ප්‍රදේශය බාර ආණ්ඩුවේ කෙරුමා ඇමැති මර්වින් සිල්වාය. එම ප්‍රදේශයේ කපුටෙකුට ඉඟිලීමටත් තමන්ගෙ න් අවසර ගතයුතු යැයි සිතා සිටින ආචාර්ය මර්වින් සිල්වාගේ බල ප්‍රදේශයේ ඉතා සාර්ථක විරෝධතාවක් පැවැත්වීම, ජනතා විමුක්ති පෙරමුණේ අධිෂ්ඨානය සහ ශක්තිය මොනවට ප්‍රදර්ශනය කිරීමක් බවයි මහජනතාවගේ අදහස වුයේ. ජනතා විමුක්ති පෙරමුණ පළ කළ එඩිතර කැපවීමට ජනතා ප්‍රශංසා නොඅඩුව ලබමින් විරෝධතාව පැයකට ආසන්න කාලයක් සාර්ථකව පවත්වා පිරිස විසිර ගියහ. ගම්පහ දිස්ත්‍රික් ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරවරුන්ගේ සහභාගිත්වයෙන් මෙම විරෝධතාව පැවැත්වීය.

දෙසැම්බර් 5 වැනිදා අය වැය ප්‍රෝඩාවට එරෙහිව සාර්ථක ජනරැලියක් මාතර නගරයේදී පැවැත්විය. ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා ඇතුළු නායකයින්ගේ ප්‍රධානත්වයෙන් මෙම රැලිය පැවැත්විය. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් නොවන විශාල පිරිසක් අයවැය ප්‍රෝඩා පිළිබඳ පැහැදිලි කිරීම් උනන්දුවෙන් අසා සිටීම විශේෂත්වයකි.

දෙසැම්බර් 06 වැනිදින මෙම විරෝධතා ව්‍යාපාරයේ තවත් ජයග්‍රාහී සලකුණක් බදුල්ල නගරයේදී සටහන් විය. විරෝධතා පුවරු රැගත් පිරිස් පාගමනින් ගිය අතර ත්‍රීවීල් සහ යතුරුපැදි ද මේ සඳහා යොදාගෙන තිබිණ. බදුල්ල දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහ ඌව පළාත් සභා මන්ත්‍රී සුදත් බලගල්ල යන සහෝදරවරුන්ගේ මුලිකත්වයෙන් මෙම විරෝධතාව සංවිධානය කර තිබිණ.






ප්‍රෝඩාකාරී අයවැයට එරෙහිව කොළඳී පවත්වන ලද විරෝධතා පාගමන අතිශයින් සාර්ථක විය. ජනතා විමුක්ති පෙරමුණෙ නායක සහෝදරවරුන්, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය, සමාජවාදී කාන්තා සංගමය, සමාජවාදී ශිෂ්‍ය, තරුණ, ගොවි, සංගම් මෙයට සහභාගි විය. ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පෙළපාලියත් තරම්ම සාර්ථකව මෙම විරෝධතා පාගමන පැවැතියේය.

මෙහිදී දක්නට ලැබුණු විශේෂම සිද්ධිය නම් පාගමන ඇරැඹි බොරැල්ල කැම්බල් පිටිය අසල සිට කොළඹ කොටුව දක්වා මාර්ගය දෙපස රැස්ව සිටි විශාල මහජනකායක් අත්පොලසන් දෙමින් සහ ප්‍රීති ඝෝෂා කරමින් සහයෝගය පළකිරීමයි. එමෙන්ම මාර්ග තදබඳයට මුහුණ දී සිටි මඟීන් සහ වෙනත් පිරිස් වෙතින්ද විශාල සහයෝගයක් පළවිය.

කොළඹ කොටුවට පැමිණි විරෝධතා පාගමන අවසන් කරමින් කථා පැවැත්වූයේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා සහ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාය. ඒ වන විට එළවළු ගොවියන්, එළවළු රැස්කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, සිල්ලර වෙළෙන්දන් සහ පාරිභෝගියන් යන සියලු දෙනාම දැඩි පීඩනයකට පත්කර තිබූ එළවළු ඇසුරුම් නීතිය බලහත් කාරයෙන් ක්‍රියාත්මක කිරීම ආණ්ඩුවට අකුලාග න්නනා ලෙස එහිදී බල කෙරිණි. එමෙන්ම වැඩිවන ජීවන වියදමට සරිලන සේ රාජ්‍ය අංශයේ සේවක වැටුප රු 10000.00 සහ පෞද්ගලික අංශයේ සේවක වැටුප 40% කින් වැඩි කරන ලෙසද ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය සහ මාධ්‍ය මර්ධනය වහා නතර කරන ලෙසද බල කෙරිණි. එමෙන්ම යාපනයේදී පැහැර ගෙන යන ලද ලලිත් සහ කුගන් යන දේශපාලන ක්‍රියාකාරිකයන් වහා නිදහස් කරන ලෙසටද බල කෙරිණි. ප්‍රවාහනයේදී ප්ලස්ටික කුඩ භාවිතයට ආණ්ඩුව පනවා තිබූ බලහත්කාරී නීතිය එදින මධ්‍යම රාත්‍රියේ සිට ජනාධිපතිවරයා ඉවත් කර ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවේ කුඩ බලහත්කාරයට එරෙහිව වීදි බැසීම එය ඉවත් කරගැනීමට දැඩිව බලපෑ බව සනාථ විය.

## ඉල් සැමරුම කොරියාවේදීත්



22 වැනි ඉල්මහ සමරු උළෙලට සමගාමීව විදෙස් ගත ශ්‍රී ලාංකිකයන්ද රටවල් ගණනාවක සරු උළෙල සංවිධානය කර තිබිණු අතර දෙසැම්බර් 11 වැනිදා දකුණු කොරියා වේ සෝල් නුවරදී පවත්වන ලද්දේ එහි එක් පියවරකි. පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජික අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් එය පැවැතියේය. සමරු උළෙලට ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් සහභාගි වී සිටි අතර ඇතැමුන් කිලෝමීටර් 400 ට වැඩි දුරක් ගෙවා පැමිණ සිටියහ.

නව ලිබරල් ධනවාදී ආර්ථිකය සමාජ ප්‍රශ්න අතිශය බැරෑරුම්කර ඇති බව සහ මහින්ද රාජපක්ෂ පාලනය රටේ සම්පත් සියල්ල විදේශිකයන්ට සහ බහුජාතික සමාගම්වලට විකුණා දමමින් සිටින අන්දම අනුර කුමාර සහෝදරයා මෙහිදී පැහැදිලි කළේය. දිරාපත් වී ඇති ධනවාදයට ජනතා ප්‍රශ්න විසඳිය නොහැකි බවද ඒ වෙනුවට සමාවාදී සමාජයක් වෙනුවෙන් වූ පරිවර්තනයකින් තොරව පිළිතුරු නැති බව ද අනුර කුමාර සහෝදරයා පැහැදිලි කළේය.

කොරියාවේ සිටින ශ්‍රී ලාංකිකයන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ක්‍රියාකාරිත්වය කෙරෙහි දක්වන දැඩි උනන්දුව නිසා එරටට පූර්ණ කාලීනයකු පත්කිරීමට සුදුසු බව පෙරළා පැමිණි අනුර කුමාර සහෝදරයා පෙන්වා දී තිබිණ.

## සමාජවාදී තරුණ සංගමයට හා ජනතා ව්‍යාපාරයන්ට එරෙහිව ශ්‍රී ලංකා රජය සිදු කරනු ලබන මර්දනකාරී ක්‍රියාවන්ට එරෙහිව ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය මගින් නිකුත් කරන ලද ප්‍රකාශය

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ 18 වන සමුළුවේ ප්‍රකාශනයේ සඳහන් වන පරිදි ලොව පුරා ප්‍රතිගාමී රජයන්ට අවශ්‍යව ඇත්තේ ධනවාදයේ අර්බුධය නිසා වන පාඩුව ධනවාදීන්ගෙන් පියවා ගන්නවා වෙනුවට ජනතාව මඟින් පියවා ගැනීමටයි. අපගේ විශ්ලේෂණය නැවත වරක් තහවුරු කරනු ලැබ තිබේ. සෑම වසරකම මෙම වකවානුව බොහොමයක් රාජ්‍යන්ගේ රාජ්‍ය අයවැය ඉදිරිපත් කරනු ලබන වකවානුව වන හෙයින් වඩ වඩාත් ප්‍රතිගාමී කටයුතු ක්‍රියාවට නැංවෙමින් තිබේ.

ශ්‍රී ලංකාවේ සිදුවීමද මෙයයි. නොවැම්බර් 21 වන දින ශ්‍රී ලංකාවේ රජය පාර්ලිමේන්තුවට සිය අයවැය ප්‍රකාශනය ඉදිරිපත් කරනු ලැබීය. ජනතාවට හිතකර නොවූ මෙම අයවැය තරුණයින්ගේ හා වැඩකරන ජනතාවගේ අයිතීන් අහිමිකර තිබුණි. මේ අතරම තරුණයින්ගේ මූලිකම ප්‍රශ්නය වූ විරැකියාව පිළිබඳව පැහැදිලිවම නොසලකාහැර තිබුණි.

ශ්‍රී ලංකාවේ සමාජවාදී තරුණ සංගමයේ අපේ සහෝදරවරු මෙම ප්‍රතිපත්තීන්ට එරෙහිව සටන් වදිමින් සිටිති. ඒ වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කරනු ලැබ තිබූ මුදල් අමාත්‍යාංශය දක්වා වන පාගමනට එරට පොලීසිය විසින් සාහසික ලෙස පහරදෙන ලදී. මෙම පහරදීම හේතුකොටගෙන තරුණයින් 15 දෙනෙක් පමණ බරපතළ තුවාල ලද අතර ඊට අමතරව තවත් සියගණනක් පමණ දෙනා සුළු තුවාල ලැබූහ. කෙසේ වෙතත් මෙම විරෝධතා පා ගමන සහභාගිත්වය අතින් ඉතා සාර්ථක මෙන්ම දේශපාලනිකව ප්‍රතිඵලදායී එකක් විය. මේ වන විට ශ්‍රී ලංකා රජය සමාජවාදී තරුණ සංගමයේ සාමාජිකයින් අත්අඩංගුවට ගනිමින් ඔවුන්ව මර්දනය කරමින් සිටී.

ජනතා නැගිටීම්වලට එරෙහිව අධිරාජ්‍යවාදය ලොවපුරා ක්‍රියාකරන ආකාරය පිළිබඳව මෙය තවත් උදාහරණයකි. ඒකාධිකාරීත්වයේ ප්‍රතිලාභ ආරක්ෂාකර ගැනීම උදෙසා ඔවුන් සෑම දෙයක්ම කරනු ඇත. තව තවත් මර්දන යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ඇත.

ශ්‍රී ලංකාවේ ජනතා අරගලයන්ට හා සමාජවාදී තරුණ සංගමයේ සහෝදර සහෝදරියන්ට අප අපගේ සහයෝගීතාවය පළ කර සිටිමු. මෙය අවස්ථාවක් කොටගෙන ලොව පුරා සියලු වැඩකරන ජනතාව හා තරුණයින් ඔවුන්ගේ අයිතීන් උදෙසා කරනු ලබන අරගල, වර්ජන, විරෝධතා පෙළපාලි හා රැළි යනාදී සියල්ලටම අපගේ ආචාරය පුදකර සිටිමු. ලොව පුරා විවිධ තැන්හිදී අධිරාජ විරෝධී බලවේග අපගේ සතුරා වන අධිරාජ්‍යවාදයට එරෙහිව ඔවුන්ගේ සටන දියත් කරමින් සිටියි. සමාජ අයිතීන් උදෙසා වන අපගේ අරගලය සමඟ අප ඔප්පුකරමින් සිටින්නේ තාරුණ්‍යයේ මාවතද වැඩකරන ජනතාවගේ හා සාමාන්‍ය මහජනතාවගේ මාර්ගයම වන බවයි. මර්දනය නොතකා අධිරාජ්‍යවාදය පරාජය කිරීම සඳහා වන අපගේ සටන අපි ඉදිරියටම ගෙන යන්නෙමු.

# පලස්තීන සහයෝගිතා දින සැමරුම ඉහළින්ම




නොවැම්බර් මස 30 වැනිදාට යෙදී තිබූ පලස්තීන සහයෝගිතා දිනය සමරමින් සමාජවාදී තරුණ සංගමය ක්‍රියාමාර්ග කීපයක් ගනු ලැබීය. සහෝගීතා බැනරයට අත්සන් ගැනීම කළ අතර දෙසැම්බර් 06 වැනිදා කොළඹ මහජන පුස්තකාලයේදී සමරු උළෙලක් පැවැත්විය. ශ්‍රී ලංකාවේ සිටින පලස්තීන තානාපති ඩොක්ටර් අන්වර් අල් අග්හා (DR. ANWAR AL AGHA) සහ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ගේ ප්‍රධානත්වයෙන් එය පැවැත්විය. එහිදී ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පවත්වන ලද පලස්තීන සහයෝගීතා දේශනය කාගේත් සිත් ගත්තේය. ඉස්ලාම් බැතිමතුන් ගේ උපවාස ශීලය යෙදී තිබූ කාලයක පවත්වන ලද මෙයට සහභාගි වූ තානාපතිවරයා ඉස්ලාම් ආගමික කටයුතු නිසා ඉක්මනින් පිටවීයාමට අවශය බව මුලදීම දන්වා තිබිණ. එහෙත් ටිල්වින් සහෝදරයාගේ දේශනයේ විශාල කොටසක් අසා සිටි තනාපතිවරයා බිමල් රත්නායක සහෝදරයාට පවසා තිබුණේ '' මට සිංහල කතාව තෙරෙන්නෑ. ඒත් පලස්තීන, පලස්තීන කියල කියන කොට මම කොහොමද නැගිටල යන්නේ'' යනුවෙනි. එමෙන්ම ජාත්‍යන්තරවාදය පිළිබඳ ටිල්වින් සහෝදරයා කළ කථාව අසාසිටි පැරණි වමේ ක්‍රියාකාරිකයකු පැවසුයේ ''මම දේශපාලනය කරන්න පටන්ගෙන අවුරුදු 40 කට වැඩී. ඒත් ජාත්‍යන්තරවාදය ගැන කතාවක් ඇහුවේ අද ජ.වි.පෙ. ලේකම් සහෝදරයාගෙන් '' යනුවෙනි. ඇමරිකාව ඇතුළු අධිරාජ්‍යවාදීන්ගේ සුරතලකු වන ඊශ්‍රායලය පලස්තීන ජනතාවට කරන කෲර යුධ අපරාධ පිළිබඳව සැකසුණු වාර්තා චිත්‍රපටයක්ද මෙහිදී ප්‍රදර්ශනය කෙරිණි.

# සහෝදරත්වයේ ජනතා පවුර ඉදිවේ

යුද්ධය අවසන්වීමත් සමඟ ජාතිකත්වයන් අතර සැබෑ සහජීවනයක් සහ සහෝදරත්වයක්, සංහිඳියාවක් ගොඩනැගීමට මුලසිටම ක්‍රියාකළ ජනතා විමුක්ති පෙරමුණ හමුවේ මතුවන සියළුම අභියෝග පරාජය කරමින් පංති යුතුකම ඉදිරියටම ගෙන යමින් සිටී. උතුරේ ජනතාවගේ මෙතෙක් නොවිසඳා ඇති මූලික මිනිස් අයිතිවාසිකම් තහවුරු කරමින් භෞතික ජීවිත ගොඩනගා සිටුවීමට අවශ්‍ය මූලික කොන්දේසි සම්පූර්ණ කරන ලෙසත් දේශපාලන රැඳවියන් පිළිබඳ සියළුම තොරතුරු හෙලිකරන ලෙසත් ආණ්ඩුවට බලකරමින් ක්‍රියාකිරීමට ජනතා විමුක්ති පෙරමුණ විසින් ''සහෝදරත්වයේ ජනතා පවුර'' සංවිධානය පිහිටුවිය. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති රාමලිංගම් චන්ද්‍රසේකර් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරවරු මෙම සංවිධානයේ සම කැඳවුම්කරුවන් ලෙස වගකීම් දරයි. එම සංවිධානය පිහිටුවීමේ අරමුණ පැහැදිලි කර ඉදිරි ක්‍රියා මාර්ග විස්තර කිරීමේ ජනමාධ්‍ය හමුවක් වවුනියාව නෙල්ලි හෝටලයේදී දෙසැම්බර් 10 වැනිදා පැවැත් විය.



## සමාජවාදී පරිවර්තනයකින් මෙපිට ජනතාවට විසඳුම් නැහැ

### ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා



අධිරාජ්‍යවාදී ධනවාදය තුළ ප්‍රශ්නවලින් පීඩිතව සිටින ජනතාවට කිසියම්ම හෝ පිළිතුරක් ලබාදීමට ධනවාදය අසමත්වී ඇති බැවින් සමාජවාදී පරිවර්තනයකින් මෙපිට ජනතාවගේ ආර්ථික දේශපාලනික සමාජීය හෝ මානව අයිතිවාසිකම් කිසිවක් නොලැබෙන බව සහතික යැයි ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා ප්‍රකාශ කළේය. ඔහු මෙම අදහස් පළ කළේ, විශේෂ සමුළුවේ සමුළු දේශනය පවත්වමිනි.

''සමාජවාදී සමාජයක් බිහි කිරීමේ අරමුණින් අප අතර එකඟත්වයක් තිබිය යුතුයි. පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තිබිය යුත්තේ මේ එකඟත්වයට යටත්වයි. ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්නේ ඒ එකඟත්වයට උඩින් නෙමෙයි. පන්ති සටන් තුළ ජයග්‍රහණ දක්වා ඉදිරියට යාමට මේ එකඟත්වය තිබෙන නායකයින් අවශ්‍යයි. මේ සමුළුව පැවැත්වෙන අවස්ථාවේ නිර්ධන පන්තියට නායකත්වය දෙන නිර්ධන පන්තියේ ගාමක බලවේගය පක්ෂය මිස ඔය කල්ලි කණ්ඩායම් නෙමෙයි. නිර්ධන පන්තියේ සමාජවාදී ජයග්‍රහණය පිළිබඳ වගකීම පක්ෂයක් හැටියට අපි නිවැරදිව භාරගෙන තිබෙනවා. අපි පක්ෂයේ දේශපාලන ක්‍රියාමාර්ග පිළිබඳව දුර්වලතා වගේම ජයග්‍රහණ පිළිබඳවත් එකට තබා සමාලෝචනය කළ යුතුයි. දුර්වලතා ගැන පමණක් සිතන්නේ නම් කිසිම පක්ෂයකට තියා මොනම සංවිධානයකටවත් ඉදිරියට යන්න බැහැ. මේ බව ඓතිහාසිකව ඔප්පු කර හමාරයි. අද වන විට ජනතා විමුක්ති පෙරමුණේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය කම්කරු සංගමයේ ප්‍රමුඛ බලවේගය බවට පත් වී අවසන්. ඒකට අභියෝග කළ හැකි වෘත්තීය සමිතියක් රට තුළ නැහැ. ඒ වගේම තරුණ ශිෂ්‍ය කාන්තා ගොවි ඇතුළු දූවැන්තම බහුජන ව්‍යාපාරයට ජනතා විමුක්ති පෙරමුණ පත්කර අවසන්. පාර්ලිමේන්තුවේත් පළාත් සභාවලත් ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව මත බහුජන අරගලවල ජයග්‍රහණ රඳා පවතින්නේ නැහැ. ජයග්‍රහණය කිරීමේ ගුණය පවතින්නේ, බහුජන සංවිධානවල කැපවීමේ ක්‍රියාකාරීත්වය තුළයි. අපි මේ බව ඔප්පු කර තිබෙනවා. ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුප් පනත පරාජය කිරීම වගේම එළවළු කූඩ බලහත්කාරය පරාජය කිරීමෙන් ප්‍රකාශ වන්නේ මේ බවයි. බහුජන සංවිධානවල ශක්තිය රඳා පවතින්නේ නිවැරදි නායකත්වය මත බව ඉතා පැහැදිලියි.'' සෝමවංශ සහෝදරයා වැඩිදුරටත් පැවසීය.



වැඩකරන ජනතාවට තමන් හැර බලාපොරොත්තු රැඳවිය හැකි හෝ විශ්වාසය තැබිය හැකි වෙනත් කෙනෙක් නොමැත. වැඩකරන මිනිසා තමාම නිදහස් නොවේ නම් ඔහු නිදහස් කිරීමට වෙනත් කෙනෙක් නොමැත. එසේ තමන්ම නිදහස්වීම සඳහා මුළු රටේම කම්කරුවන් එකම සංගමයක් තුළ එකම පක්ෂයක් තුළ එක්සත් විය යුතුය.

**ලෙනින්**
**ජනතාව කම්කරු පංතිය හා ගොවියන් අතර සන්ධානය**

## කුමන්ත්‍රණ පරාජය කිරීමේ හැකියාව ජ.වි.පෙ. ඔප්පු කළා

### ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ජනතා විමුක්ති පෙරමුණ පිහිටුවා දශක 4 කට වැඩි කාලයක් තුළ එය විනාශ කිරීමට අවස්ථාවාදීන් හා ධනපති පංතිය නොයෙක් වර උත්සහ කළද ඒ සියලු කුමන්ත්‍රණ පරාජය කළ හැකි ශක්තියක්, ධෛර්යක් පක්ෂයට තිබෙන බව සනාථ කර අවසන් යැයි ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා පැවසීය. ඔහු මෙසේ පැවසූයේ, තිස්සමහාරාම දෙබරවැව ක්‍රීඩාංගණයේ පැවති පක්ෂයේ විශේෂ මහා සමුළුවේ පිළිගැනීමේ කතාව කරමිනි. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ, පක්ෂය බිඳීමට හෝ දුර්වල කිරීමට නොවන බවත් ජනතා ජයග්‍රහණ කරා පක්ෂය ගෙන යන ගමන ශක්තිමත් කිරීමට බවත් අවධාරණය කළ ටිල්වින් සහෝදරයා, රෝහණ විජේවීර සහෝදරයා අතිශය දුෂ්කර තත්වයන් තුළ පක්ෂය නිර්මාණය කරමින් කල්ලි කණ්ඩායම්වාදය මෙන්ම ප්‍රතිගාමී මතවාද පරාජයට පත් කර පක්ෂය ආරක්ෂා කළේ සමාජවාදී ජයග්‍රහණ වෙනුවෙන් බව පෙන්වා දුන්නේය. පක්ෂයේ විශේෂ මහා සමුළුව පවත්වන ඓතිහාසික අවස්ථාවට තිස්සමහාරාම ප්‍රදේශය තෝරා ගැනීම ඒ අර්ථයෙන්ද වැදගත් බව කියා සිටි ඔහු පුංචි ආණ්ඩුව පිහිටුවා තිස්ස ජනතාව ලබා දුන් සුවිශේෂී ජයග්‍රහණ මුළු රටටම ලබා දීමේ නව නායකත්ව මණ්ඩලයක් සහ වැඩපිළිවෙලක් තෝරාපත් කර ගන්නේ මෙවර සමුළුවෙන් බව පැවසීය.

## 2012.01.01
## ජනතා විමුක්ති පෙරමුණේ විශේෂ මහ සමුළුව සම්මත කරන ලද
# දේශපාලන යෝජනා

1. ශ්‍රී ලාංකේය සිංහල, දෙමළ, මුස්ලිම් හා සෙසු ජනතාවට නිදහස් සාධාරණ ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ අහිමි කරමින් තව දුරටත් බලය පවත්වාගෙන යන ජනාධිපතිවරයා හා ආණ්ඩුව 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර ඒ වෙනුවට 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සුජාත නොවන 2/3 බලය යොදාගෙන සම්මත කර ගැනීමට සමත්විය. එතැන් සිට තවදුරටත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උදුරා ගැනීමටත් මානව අයිතීන් අහෝසි කිරීමටත් විරුද්ධවාදීන් පැහැරගෙන යාමටත් අතුරුදහන් කිරීමටත් විරුද්ධ මත දරන්නන්ගෙන් පළිගැනීමටත් සාහසික අපරාධකාරී ක්‍රියාවල නිරත වීමටත් වැඩි වැඩියෙන් පෙළඹෙමින් ඇත.

රට තුළ ස්ථාපිත වෙමින් ඇති මෙකී ප්‍රජාතන්ත්‍රවිරෝධී, බලහත්කාරී පවුල් පාලනය පරාජය කිරීම සඳහා සංවිධානය වන ලෙසටත් සටන් කරන ලෙසත් ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජනතාවට ජනතා විමුක්ති පෙරමුණේ මෙම විශේෂ සමුළුව අවධාරණය කරයි.

2. 2009 මැයි මස 19වැනිදා බෙදුම්වාදී යුද්ධය අවසාන වීමෙන් පසු මේ වන විට අවුරුදු තුනකට ආසන්න කාලයක් ගතවී තිබේ. එහෙත් රාජපක්ෂ පාලනය මේ දක්වා ශ්‍රී ලංකාවේ ජාතික සමඟිය ඇති කිරීම සඳහා වූ අර්ථාන්විත පියවර කිසිවක් ගැනීමට සමත් වී නැත. තවමත් එම ප්‍රදේශවල සිවිල් පරිපාලනය ස්ථාපිත කරලීමට ආණ්ඩුව අසමත්ව තිබේ. තවදුරටත් තම ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනය එම ප්‍රදේශවල පවත්වාගෙන යාම වෙනුවෙන් අර්ධ මිලිටරි පාලනයක් පවත්වාගෙන යයි. යළි පදිංචි කරන ලද ජනතාවගේ ගැටලු විසඳීමට අසමත් ඇතිවා මෙන්ම තව දුරටත් පවුල් විශාල ප්‍රමාණයක් පදිංචි කරවීමටද ඇත. ඔවුන්ගේ ජීවිත යථාවත් කරවීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුකොට ගෙන ප්‍රශ්නය තවතවත් සංකීර්ණ කොට තිබේ. ඒ නිසා රට තුළත්, විදේශගතවත් බෙදුම්වාදී ප්‍රවණතා යළි හිස ඔසවමින් තිබේ.

ගෙවෙන හැම මොහොතක් මොහොතක් පාසා නැවත නැවතත් ඔප්පු වෙමින් ඇත්තේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන ජාතිකත්වයන් අතර පවතින අසමානතාවයන් වඩ වඩා උත්සන්න කරන ධනපති ක්‍රමය තුළ ජාතික ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් නැති බවය. ඒ අනුව ධනපති ක්‍රමය පරාජය කර ජාතික ප්‍රශ්නය ඇතුළු දේශපාලන, ආර්ථික හා සමාජයීය ප්‍රශ්න ස්ථිරසාර ලෙස විසඳීම සඳහා සමාජ පරිවර්තනයක් වෙනුවෙන් සමගි සම්පන්නව පෙළ ගැසෙන ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජන කොටස් වලට ජනතා විමුක්ති පෙරමුණේ මෙම විශේෂ සමුළුව ආයාචනා කර සිටී.

3. දේශප්‍රේමී සළු පිළි පෙරවාගත් මහින්ද රාජපක්ෂගේ අධිරාජ්‍යගැති පවුල් පාලනය මේ වන විට ශ්‍රී ලාංකේය වැඩකරන ජනතාව, ගොවි ජනතාව, ධීවර ජනතාව, රැකියා විරහිත තරුණ ජනතාව, ශිෂ්‍ය පරපුර, වෘත්තීයවේදීන් හා තාක්ෂණවේදීන් විද්වතුන් හා සාහිත්‍ය කලාශූරීන් හා මාධ්‍යවේදීන් නව ලිබරල් ධනවාදයේ ගොදුරු බවට පත්කොට අවිනිශ්චිත අනාගතයකට තල්ලු කෙරෙමින් ඇත. රට ණය බරින් මිරිකී ඇති අතර ජනතාවගේ වටිනා ඉඩම් ඇතුළු වටිනා සම්පත් විකුණා දැමීම ආණ්ඩුව විසින් දිගටම කරගෙන යයි. මේ මගින් ඔප්පුකර ඇත්තේ, ලාංකේය පසුගාමී ධනවාදයට ජනතාවත්, රටත් විනාශ කරනවා මිස අන් යමක් කළ නොහැකි බවය. එබැවින් මෙම කාලකණ්නිභාවයෙන් මිදීම සඳහා අධිරාජ්‍යවාදයටත් එහි නූතන ප්‍රකාශනය වූ නව ලිබරල් ධනවාදයටත් එරෙහිව සටන් කිරීම සඳහාත් ධනවාදය පරදා සමාජවාදී සමාජ ක්‍රමයේ ජයග්‍රහණය සඳහාත් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් සංවිධානය වී පළල් අධිරාජ්‍ය විරෝධී පෙරමුණ ගොඩනැගීමට සියලු ප්‍රගතිශීලීන්ට ප්‍රජාතන්ත්‍රවාදීන්ට, සැබෑ දේශප්‍රේමීන්ට, මානව හිතවාදීන්ට හා පරිසර හිතවාදීන්ට ජනතා විමුක්ති පෙරමුණේ මෙම විශේෂ සමුළුව ආයාචනය කරයි.

4. ධනවාදය වර්තමානයේදී එහි ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ මාරාන්තික අර්බුදයේ ගිලෙමින් ඇත. 2007දී පමණ අධිරාජ්‍යවාදීන්ගේ බැංකු හා ණය දෙන වෙනත් මූල්‍ය ආයතනවල ණයදීමේ හැකියාව සිඳීයාම ලෙස ප්‍රකාශයට පත්වුණ ධනවාදයේ අර්බුදය දැන් අධිරාජ්‍යවාදී රටවල් සතුව පැවති ණයදීමේ හැකියාව සිඳීයාම දක්වා උග්‍රවී ප්‍රකාශයට පත්වෙමින් ඇත.

මේ තත්වය තුළ අධිරාජ්‍යවාදයේ මූලස්ථානය වූ එක්සත් ජනපදයේද, යුරෝපා සංගමයට අයිති රටවල්වලද, පාලකයෝ ඒවායේ ජනතාවගේ සුභසාධනය, වැටුප්, දූවැන්ත කප්පාදුවකට භාජනය කරමින් අධිරාජ්‍යවාදයේ අර්බුදයේ බර ජනතාවන් මත පටවති. එය ඉවසා ගත නොහැකි ජනතාවෝ පාලකයන්ට එරෙහිව වීදි බසිති. උද්ඝෝෂණය තරති. වාඩිලා ගනිති.

පාලකයෝ අයිතීන් ඉල්ලා සටන් කරන ලක්ෂ සංඛ්‍යාත වූ ජනතාව පොලීසියේ හා හමුදාවේ සාහසික මර්දනයට ලක් කරති. එමගින් අධිරාජ්‍යවාදී රටවල් තුළ ස්ථාපිතව පවතින්නේ යයි කියන ප්‍රජාතන්ත්‍රවාදයේ හෙළුව ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරති. සාහසික මර්දනය ඉදිරියේදී වුවද වැඩකරන ජනතාව සමඟ තරුණ හා ශිෂ්‍ය ව්‍යාපාර වැඩි වැඩියෙන් ඒකරාශිවීම ජයග්‍රහණයේ සලකුණකි.

කෙසේ වුවද, නව ලිබරල්වාදී ධනපති ක්‍රමයේ සාහසික කප්පාදුවට එරෙහිව එක්සත් ජනපදයේ හා යුරෝපයේ ජනතා පළගැස්මටත්, උතුරු අප්‍රිකාවේ හා අරාබිකරයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජනතා පෙළගැස්මටත් වෙනත් බොහෝ රටවල් තුළත් පැන නැගී ඇති පාලක විරෝධී පෙළ ගැසීම්වලටත් ස්වාභාවික සම්පත් කොල්ලකෑම සඳහා අධිරාජ්‍යවාදීන් විසින් කරන ලද ආක්‍රමණවලට ලක්ව යුදමය තත්වයන්ට මුහුණ දී ඇති ඇෆ්ග නිස්ථානය ඉරාකය, ලිබියාව වැනි රටවල අරගල කරන ජනතාවටත් මේ දක්වා නිවැරදි නායකත්වයක් ලැබී නැති බව පෙනෙන්නට තිබේ.

මේ තත්වය වෙනස් කොට අධිරාජ්‍යවාදයත් එහි වර්තමාන ප්‍රකාශනය වූ නව ලිබරල්වාදී ධනවාදයත් පරාජයට පත් කිරීම සඳහා සමස්ත ලෝකයේ ජනතාව මෙහෙයවිය යුතුව ඇත. ඊට වමේ ව්‍යාපාරයන්ගේ නායකත්වය ලබාදිය යුතුව ඇත. ඒ සඳහා ජනතාව මතවාදීමය හා සංවිධානමය වශයෙන් ඒකරාශී කළ යුතුව ඇත. අරගලයට කැඳවිය යුතුව ඇත. ඒ සඳහා ආසියාවේ, අප්‍රිකාවේ, ලතින් ඇමරිකාවේ, යුරෝපයේ, අරාබිකරයේ හා උතුරු ඇමරිකාවේ අධිරාජ්‍ය වීරෝධී ජාත්‍යන්තර මූලස්ථානය ගොඩනැගිය යුතුය. ඒ වෙනුවෙන් වහාම පෙරමුණ ගන්නා ලෙස ජනතා විමුක්ති පෙරමණේ මෙම විශේෂ සමුළුව ලොව පුරා සියලු දේශයන්හි වෙසෙන කොමියුනිස්ට්වාදීන්ගෙන් ඉල්ලා සිටී.

### 2012 ජනවාරි 01වැනි දින තෝරා පත් කර ගන්නා ලද ජනතා විමුක්ති පෙරමුණේ නව මධ්‍යම කාරක සභාව

1. සෝමවංශ අමරසිංහ සහෝදරයා
2. ටිල්වින් සිල්වා සහෝදරයා
3. අනුර දිසානායක සහෝදරයා
4. විජිත හේරත් සහෝදරයා
5. ලාල් කාන්ත සහෝදරයා
6. බිමල් රත්නායක සහෝදරයා
7. සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා
8. ජිනදාස කිතුලෙගොඩ සහෝදරයා
9. ආර්. චන්ද්‍රසේකර් සහෝදරයා
10. ලක්ෂ්මන් නිපුනාරච්චි සහෝදරයා
11. නිහාල් ගලප්පත්ති සහෝදරයා
12. සමන්ත විද්‍යාරත්න සහෝදරයා
13. මහින්ද ජයසිංහ සහෝදරයා
14. නලින්ද ජයතිස්ස සහෝදරයා
15. ගාමිණී රත්නායක සහෝදරයා
16. වසන්ත පියතිස්ස සහෝදරයා
17. නීතිඥ සුනිල් වටගල සහෝදරයා
18. සමන්මලී ගුණසිංහ සහෝදරිය
19. එච්. පී. ධම්මික සහෝදරයා
20. චන්ද්‍රික අධිකාරි සහෝදරයා
21. වසන්ත සමරසිංහ සහෝදරයා
22. සමන්ත කෝරලේආරච්චි සහෝදරයා
23. සුමතිපාල මානවඩු සහෝදරයා
24. එම්.ඩී. විජේරත්න සහෝදරයා
25. සිසිර කුමාර වාහලතන්ත්‍රි සහෝදරයා



# කලාව රසවින්දනයෙන් ඔබ්බට

''**රදලවාදී මධ්‍යන යුගයේ අවසානයත්, සමකාලීන ධනපති යුගයේ ආරම්භයත් එක් මහා පුද්ගලයෙකුගෙන් සටහන් වී ඇත. හේ ඉතාලි ජාතික දාන්තේය. මධ්‍යකාලීන යුගයේ අවසාන කවියාත් නව යුගයේ ප්‍රථම කවියාත් ඔහුය. දැන් 1300 මෙන්ම නව ඓතිහාසික යුගයක් එළඹෙමින් පවතී. එම නව නිර්ධනපංතික යුගයේ උපත සනිටුහන් කරන නව දාන්තේ කෙනෙකු ඉතාලිය අපට ප්‍රදානය කරන්නේද?''** සුප්‍රසිද්ධ කොමියුනිස්ට් ප්‍රකාශනයේ ඉතාලි සංස්කරණයට එංගල්ස් ලියූ පෙරවදන අවසන් කර තිබුණේ එසේය. මෙම පෙරවදන එංගල්ස් ලියූවේ 1893 පෙබරවාරි 01 දා එංගලන්තයේ සිටය.

එංගල්ස්ගේ එම ප්‍රකාශනයෙන් පසුවද ධනවාදය සියවසකට මදක් වැඩි කාලයක් ගතකර තිබේ. ගෙවුණු සියවසට වැඩි කාලය තුළ ධනවාදය යළි යළිත් ඔප්පු කර ඇත්තේ එංගල්ස්ගේ අපේක්ෂාවේ නිවැරදිතාවයයි. මේ වනවිට සමාජ ක්‍රමයක් ලෙස යල් පැන ගොස් ඇති ධනවාදය, මාරාන්තික රෝගියෙකුගේ තත්වයට පත්ව, ලොව මිනිසුන්ට දුක, වේදනාව, ලෙඩ රෝග හා මරණය පමණක් උරුම කරමින් තම දුෂ්ටත්වය ප්‍රදර්ශනය කරමින් සිටී. ධනවාදයේ අවසානයත් නව නිර්ධන පංති යුගයක ආරම්භයත් සඳහා සියලු සටන් පෙරමුණු තුළ තම තමන්ගේ අවි රැගෙන සියලු බලවේග සටන් කළ යුත්තේ ඒ නිසාය. එංගල්ස් ඉල්ලා සිටි පරිදි නූතන දාන්තේලා අවශ්‍ය වන්නේ සෞන්දර්යාත්මක පෙරමුණේ සටන් වැදීම සඳහාය.

ජරපත් ධනවාදයට එරෙහිව සෞන්දර්යේ අවි හා මෙවලම් රැගෙන නව සමාජයක උපත වෙනුවෙන් සටනට එන්නැයි අඬගසන විට සමහර 'කලාකරුවන්' කෝපවීමටද ඉඩ තිබේ. ලංකාවේ 'සංවේදී කලාකරුවෝ' නොසන්සුන්වීමටද ඉඩ තිබේ. එහෙත් මේ එළඹ තිබෙන්නේ පැරණි සමාජය තුළ මිනිසුන් නිද්‍රාවට පත් කරන, ධනවාදය තුළ කිසිදාක ඉටු නොවන සුන්දර සිහින විකුණන, 'ජීවිතයේ හැටි ඔහොම තමයි' යනුවෙන් ධනවාදය සමග සමාදානයෙන් ජීවත්වීමට ජනතාවට බලකරන ඊනියා කලාකරුවන්ගේ යුගය නොව සමාජ පරිවර්තන කාර්යයට දායක වන කලාකරුවන්ගේ යුගය වේ. දාන්තේ වැනි කලාකරුවන්ගේ යුගය වේ.

සොඳුරු රසවින්දන මාධ්‍යයක් වන කලාවට සමාජ පරිවර්තන කාර්යයේදී මතවාදී අවියක කාර්යභාරයද ඉටු කළ හැකි බව ලෝක ඉතිහාසයෙන් ඔප්පු කොට තිබේ. වැඩවසම් සමාජයේ අවසානයත් නව ධනපති සමාජයේ ආරම්භයත් සනිටුහන් කළ මහා කවියා ලෙස එංගල්ස් විසින් දාන්තේ හඳුන්වන විට, ලියෝ තෝල්ස්තෝයි රුසියානු විප්ලවයේ කැඩපත ලෙස ලෙනින් විසින් හඳුන්වනු ලැබුවේ ඒ නිසාය. වඩා යහපත් සමාජයක් නිර්මාණය කිරීම සඳහා මෙන්ම ඒ වෙනුවෙන් අත්‍යාවශ්‍ය යහපත් මිනිසෙක්, හොඳ මිනිසෙක්, නිර්මාණය කිරීම සඳහාද කලාවට හැකියාව තිබේ. 1965 දී සාහිත්‍ය සඳහා වූ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලද සෝවියට් ගත් කතුවර මිහායිල් ෂෝලහොව් නොබෙල් ත්‍යාගය පිළිගනිමින් කළ කතාවෙන් උපුටාගත් මෙම කරුණුවලින්ද එය සනාථ වේ.

**''මානව වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමේ සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකව අදහන පරිදි යමෙකුට කලාකරුවෙක් ලෙසින් හඳුන්වාගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු මෙම ශක්තිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම උදෙසා යොදවන්නේ නම් පමණි.''**

**''මගේ කෘති මානව වර්ගයාගේ සිත්සතන් වඩ වඩාත් නිර්මල කිරීමට, වඩා යහපත්වීම සඳහා මගපෙන්වීමට ඉවහල් වන්නේ නම් මම ඒ පිළිබඳ උදක්ම සතුටු වෙමි.''**

**''එසේම මගේ කෘති මගින් තම සගයන් වෙත ආදරය දැක්වීම, මානව වර්ගයාගේ අභිවෘද්ධිය, පරමාදර්ශ උදෙසා සටන් වැදීමට මිනිසා පොළඹවනු ලබන්නේ නම් මම ඒ පිළිබඳව අවංකවම සතුටුවෙමි.''** ඒ ෂෝලහොව්ගේ වදන්ය.

මානව වර්ගයාගේ යහපත වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකිරීමට හැකියාව ඇති කලාව හුදු විනෝදයට, රසවින්දනයට පමණක් සීමා නොකොට ඉන් ඔබ්බට ගෙන යා යුතුව තිබේ. එය නව සමාජයක් සඳහා කරන අරගලයේදී මතවාදී අවියක් ලෙස යොදා ගත යුතුව තිබේ. ඒ සඳහා කලාව පිලිබඳව කලාවේ බිහිවීම පිළිබඳව කලාවේ ඓතිහාසික ගමන් මග පිළිබඳව, කලාවේ විද්‍යාව පිළිබඳව, කලාවේ විශිෂ්ටත්වය හා අපූර්වත්වය පිළිබඳ කලාවේ භාවිතය පිළිබඳව, කලාවේ වගකීම් හා කලාකරුවාගේ වගකීම් පිළිබඳව සංවාදයක් අවශ්‍යව තිබේ; උගෙනීමක් අවශ්‍යව තිබේ; ඒ සඳහා වන ආරම්භක ප්‍රවේශයක් ගත යුතුව තිබේ. මේ උත්සාහය ඒ සඳහාය.

කලාව යනු කුමක්ද? යන ප්‍රශ්නයට දෙන පිළිතුරේ සිටම, කලාව පිළිබඳව වන නිර්වචනයේ සිටම මේ පිළිබඳ මතවාද රැසක් තිබේ. කලාව ඉතා පුළුල් හා සංකීර්ණ විෂයක් බව අවිවාදිතය. ඒ නිසාම ඒ පිළිබඳ විවිධ මත පැවතීම සහේතුකය. කෙසේ වෙතත් මාක්ස්වාදී දෘෂ්ටියකින් ප්‍රගතිශීලී ආස්ථානයක සිට කලාව දෙස බැලීම, ඒ පිළිබඳ වඩා නිවැරදි අවබෝධයක් සඳහා අත්‍යාවශ්‍ය වන බැවින් අප කලාව දෙස බැලිය යුත්තේ එසේය. කලාව දෙවියන්ගේ දායාදයක් ලෙස සලකන විඥානවාදයේ කරවටක් ගිලී සිටින කලාකරුවෝත්, කලාව කලාව සඳහා යැයි පවසමින් ජනතාවගෙන් වියෝ වී පවතින ක්‍රමයට මෙහෙ කරන කලාකරුවෝත් ජනතාව ඉල්ලන දේ දීම තම වගකීම යැයි පවසමින් කලාව විවෘත වෙළඳපොළේ කැලි ගාණට අලෙවි කරන කලාකරුවෝත් තමන් සංවේදී යැයි පවසමින් 'රජතුමාට කඩේ යන' කලාකරුවෝත් අපට කමත්වා! ඔවුන්ගේ කාර්යය දිගටම කරගෙන යෑම ඔවුනට ඉඩ තබා අප අපේ කාර්යයට එනම් කලාව මතවාදී අවියක් ලෙස යොදා ගැනීම සඳහා ඒ පිළිබඳ ඉගෙනීමේ හා ඒ පිළිබඳ පුළුල් සංවාදයක් ආරම්භ කිරීමේ කාර්යයට දායක විය යුතුය.

කලාව මානව වර්ගයාගේ ප්‍රගමනය වෙනුවෙන් පුළුල් අර්ථයකින් යොදා ගත හැක්කේ, ඒ පිළිබඳ ඇති මිත්‍යා මතයන්ට එරෙහිව කරන අරගලයක් මගින් පමණි. පංති සමාජයේදී කලාවද පංතිමය වුවමනාවන් සමග සම්බන්ධවී තිබෙන නිසා නිර්ධන පංති කලාවක් සඳහා කලාව තුළ පවතින අධිපති පංති මතවාදය හඳුනාගත යුතුවේ. නූතන ධනවාදය තුළ එනම්, නව ලිබරල් ධනවාදය තුළ කලාව මුළුමනින්ම ධනපති ප්‍රාග්ධනයට නග්න ලෙස යටත් කර තිබේ. පන්ති සමාජය බිහිවූ දා සිට කලාව තුළ අධිපති පංතියේ ආධිපත්‍යය පැවතියත් වර්තමානයේ එය සියලු ආචාරධර්ම බිඳ දමූ නග්න හා නරුම ස්වරූපයට පැමිණ තිබේ. ධනවාදය තුළ සියලු මානව සාරධර්ම හා වටිනාකම් 'ආත්මාර්ථකාමී ගණන් බැලීම නැමැති අයිස්වතුරේ ගිල්වා' ඇති තත්වයක් තුළ එය පුදුම වීමට දෙයක් නොවේ. 'නරුමයා යනු සෑම දෙයකම මිල දන්නා එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයා' යැයි වරක් ඔස්කාවයිල්ඩ් පවසා තිබේ. එය ධනවාදය තුළ අනෙක් සෑම ක්ෂේත්‍රයකකදී මෙන්ම කලාව තුළදී ද දැක ගත හැකිය.

මේ තත්වයට එරෙහි අරගලයක්ද කලාව තුළ තිබේ. අධිපති පංති මතවාදයට එරෙහිව ජනතාවාදී වුවමනාවන් වෙනුවෙන් සිය මෙවලම් මගින් අරගල කරන සැබෑ කලාකරුවන්ද නැතුවා නොවේ. දැන් අවශ්‍යව ඇත්තේ, එම අරගලය තව තවත් සවිමත් කිරීමය. කලාව තුළ පවතින පාලක පංතියේ මතවාදී ආධිපත්‍යටත් ප්‍රාග ධනයේ ආධිපත්‍යටත් එරෙහිව කරන අරගලය පුළුල් විය යුතුය. ප්‍රබල විය යුතුය. ඒ සඳහා කලාකරුවන් මෙන්ම පොදු ජනතාවද සවිඥානිකව මැදිහත්වීම අවශ්‍ය වේ. කලාව පිළිබඳ සෞදර්යාත්මක හා දාර්ශනික අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශයක් අවශ්‍ය වන්නේ මේ නිසාය. අදින් ඇරඹෙන මෙම ලිපි මාලාව ඒ වෙනුවෙනි.

**මතු සම්බන්ධයි**

## කම්කරුවෙක් ඉතිහාසය කියවයි



**තීබසයේ දොරටු හත තැනුවේ කවුද?
රජවරුන්ගේ නම් පොත්වල පිරී ඇත
ගල් කුළු ඇද ගොඩ ගැසුවේ රජවරුන්ද?**

**බැබිලනය වාර ගණනාවක් විනාශ විය
ඒ හැමවිටම එය යළි ගොඩ නැගුවේ කවුද?
එනුවර ගොඩනැගූවන් දිවි ගෙව්වේ
ලීමාවරුන්ගේ රන්වන් දිලිසෙන මැදුරු තුළද?**

**චීන මහා ප්‍රාකාරය නිම කර සැඳෑවේ
පෙදරේරුවන් ගියේ කොතනටද?**

**මහා රෝමය ජයග්‍රාහී සිහිවටනවලින් පිරී ඇත
ඒවා ඉදිකළේ කවුරුන්ද?
සීසර් විජයග්‍රහණය කළේ කා මතින්ද?
බයිසන්තීනුවන් ගී ගයමින් දිවි ගෙවූ බව කියවේ
ඒ ගී ඇසුනේ මැදුරු තුළින් පමණද?
අත්ලාන්තිකය ගැන පුරාවෘතයේදී
ඒ රාත්‍රියේ මුහුද ගොඩ ගලද්දී
ගිලෙන මිනිසුන් විලාප කීවේ
ඔවුන්ගේ වහලුන් ගැනද?**

**තරුණ ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ජය ගත්තේය
එවිට ඔහු සිටියේ තනිවම ද?
සීසර් ගෝල්වරුන් අභිබැවීය
කෝකියෙක්වත් නොසිටියේද ඔහු සමග?
ස්පාඤ්ඤයේ පිලිප් රජු
සිය යුධ නැව් ගිලෙනු දැක හැඬුවේලු
හැඬුවේ ඔහු පමණද?**

**දෙවන පෙඩ්‍රික් සත් අවුරුදු සංග්‍රාමය දිනුවේය
ඔහු හැර අන් ජයග්‍රාහකයන් කවුද?**

**හැම පිටුවකම ජයග්‍රහණයකි.
ඒ ජයග්‍රහණයන්ට අහර පිසුවේ කවුද?
හැම දේශයකට වරක් මහා පුරුෂයෙකි
එහි වියදම් දැරුවේ කවුද?**

**තොරතුරු රැසකි!
ප්‍රශ්නද රැසකි!!**

**බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට්**

# "කෝප්" පයකින් වැසිය නොහැකි ආණ්ඩුවේ දූෂණ

ආණ්ඩුවේ රාජ්‍ය ආයතනවල වංචා දූෂණ සොයන කමිටු වාර්තාවක් ලෙස කෝප් (COPE) කමිටුවේ නොහොත් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නවතම වාර්තාවක් යළිත් එළි දැක්විණි. ඩිව් ගුණසේකර ඇමතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කමිටු වාර්තාව සඳහා මීට කලින් නොපැවැති ආන්දෝලනාත්මක සංවාදයක්ද රටේ මතුවිය. ඒ, මෙම කමිටුව විසින් පාඩු ලබන්නේ යැයි නම් කළ රාජ්‍ය ආයතන 10ක් යළිත් දින කිහිපයක් ඇතුලත පාඩු නොලබන්නේ යැයි නම් කිරීම නිසාය. මෙම කෝප් කමිටුවේ වාර්තා මගින් මීට කලින්ද රාජ්‍ය ආයතනවල සිදු කෙරුණු වංචා දූෂණ අක්‍රමිකතා පිළිබඳව හෙළිදරව් කිරීම් කළ එයින් රටටත් ජනතාවටත් අත්වූ යහපත් ප්‍රතිඵල පිළිබඳ ඇත්තේ බලවත් ගැටලුවකි.

දැනට ඉදිරිපත් වී ඇති නවතම වාර්තාව සහ මීට කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තා මගිනුත් හෙළි වූ එක් පොදු කරුණක් ඇත. ඒ රාජ්‍ය ආයතනවල සුළු පරිමාණයෙන් නොව මහා පරිමාණයෙන්ම වංචා දූෂණ අක්‍රමිකතා සිදුවන බවයි. ඒවා සිදුවන්නේද පොඩි මිනිසුන් අතින් නොව මැති-ඇමති මැදිහත්වීම්වලින් ඔවුන්ගේ අනුග්‍රහය මත බවයි. නමුත් ඒවා යළිත් වාර්තාවකින් එළිදකිනවා හැර ඊළඟ වසරේ දී වැළැක්වීමට ගනු ලැබූ පියවරක් නැත.

ඒ නිසාම මෙම වංචා දූෂණ හෙළිදරව් කිරීම සහ එහි ඇති දේශපාලන සීමා මායිම් හඳුනාගැනීම ඉතා වැදගත්ය. විශේෂයෙන් දුබල ධනපති ආණ්ඩු තමන්ගේ පැවැත්ම තහවුරු කර ගෙන ඇත්තේ සෘජුව හා වක්‍රව ජනතාවගේ බදු මුදල් සූරාකෑම මගිනි. ඒ සූරාකෑම කරගෙන යන්නේ ඔවුන්ම හදාගත් ආයතන පද්ධතීන් තුළින්ය. රාජ්‍ය යාන්ත්‍රණය තුළ ඇති සංස්ථා මණ්ඩල, දෙපාර්තමේන්තු යනු ඒ සූරාකෑමේ යාන්ත්‍රණයයි. ෆැක්ටරි කම්කරුවා කම්හල තුළ සෘජු සූරාකෑමකට ලක්වන්නේ කුමන ප්‍රමාණයකටද ඊටත් වඩා විශාල ගුණයකින් භාණ්ඩාගාරයට ජනතාව ගෙවන බදු මුදල් මේ රාජ්‍ය ආයතන පද්ධතිය මගින් විනාශයට ලක් කෙරේ. රාජ්‍ය ආයතන තුළ මිලදී ගැනීමේ ක්‍රම ටෙන්ඩර් පටිපාටි, විගණන නීති සියල්ල සකස් කරගෙන ඇත්තේ මෝරුන්ට රිංගා යාමටත් අවශ්‍ය නම් පමණක් හාල්මැස්සන් හිර කරගත හැකි ලෙසටත්ය.

ධනේශ්වර පාර්ලිමේන්තුව මෙවැනි කමිටු ව්‍යුහයක් සකස් කර ඇත්තේම ධනපති ක්‍රමය පවත්වාගෙන යෑමටත් යම් හෝ සීමාකාරී සාධක සහිතවත් මූල්‍ය විනයක් අවශ්‍ය නිසාවෙන්ය. නැතිනම් වන්නේ, ධනපති ක්‍රමයේද අරාජිකත්වය ඇතිවීමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව 'මූල්‍ය පාලන බලය ඇත්තේ පාර්ලිමේන්තුවටය' යනුවෙන් සඳහන් කර ඇත්තේ එබැවිනි. නමුත් දැන් ලංකාවේ දේශපාලනය තුළ නිර්මාණය වී ඇති අර්බුදය වන්නේ ධනපති ආණ්ඩු තමන්ගේ ක්‍රමය නඩත්තු කරගැනීමට සැදූ ධනේශ්වර ව්‍යුහයම තමන්ට එරෙහිව අභියෝග කරන මට්ටමට පත්ව තිබීමයි. කෝප් කමිටුව නම් කළ පාඩු ලබන ආයතන පාඩු නොලබන ආයතන ලෙස නම් කිරීමට එහිම සභාපතිවරයාට සිදුව ඇත්තේ ඒ නිසාය. කෝප් කමිටු වාර්තාවලට සිදුවී ඇති ඉරණම ඓතිහාසිකවම තේරුම් ගැනීමෙන් ධනපති ආණ්ඩුවල හා මේ ක්‍රමයේ අර්බුදයේ තවත් පැතිකඩක් අපට හඳුනාගත හැකිය.

**රාජපක්ෂ කමිටුව**

රට තුළ 'කෝප් කමිටුව' කුමක් දැයි ස්ථාවර මතයක් පළ කෙරුණේ ව්‍යවස්ථානුකූලව රාජ්‍ය මූල්‍ය පාලනයට පාර්ලිමේන්තුවට බලය ඇතැයි ව්‍යවස්ථාවේ වගන්ති තුළ ඇති නිසා නොවේය. එම වගන්ති අනුව 'පණ ඇති' කමිටුවක් ක්‍රියාවට නැගූ විටදීය. එවැනි ප්‍රබල අවස්ථාවක් මෑත ඉතිහාසයේ ක්‍රියාවට නැගුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂගේ සභාපතිත්වයෙන් යුත් කෝප් කමිටු වාර්තාව මගිනි. රුපියල් කෝටි 15000ක පමණ මූල්‍ය වංචා එම කමිටුව මගින් රටට අනාවරණය කරන ලදී. කමිටුවේ සාමාජිකයින් ලෙස ජ.වි.පෙ. ක්‍රියා කිරීමත් එසේ ව්‍යවස්ථාවේ වගන්තියක් සක්‍රීයවීමට බලපෑ අමතර සාධකයක්ද විය. 2006 වසරට අදාලව කෙරුණු රාජ්‍ය ආයතන 26ක නිරීක්ෂණයන් මත එම වාර්තාව සකස් කෙරිණි. විජේදාස රාජපක්ෂ වාර්තාව මගින් මහ බැංකුවත් මහ බැංකුව යටතේ ලියාපදිංචිව සිටි මූල්‍ය සමාගම්වල කටයුතුද පරීක්ෂා කිරීමේදී බංකොළොත් මූල්‍ය සමාගම්වලට එක්සත් ජාතික පක්ෂ පාලනය තුළ නැවත අයකර ගත හැකි නොහැකි ලෙස ලබාදී ඇති මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 7000ක් පමණ වෙතැයි අනාවරණය කරන ලදී. එම හෙළිදරව්ව අනුව එක්සත් ජාතික පක්ෂ ඇමතිවරයෙකු වූ මිලින්ද මොරගොඩ ඇමතිවරයාගේ සෘජු සම්බන්ධය ඇති, ඔහුගේ හා ඔහුගේ පවුලේ ඥාතීන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූ සී/ම මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමට මහා බැංකුව ලබාදුන් නැවත නොපියවූ මුදලු ප්‍රමාණය පමණක් රුපියල් මිලියන 5071.3ක් විය. කමිටු වාර්තාව එළිදැක්විණි. රුපියල් මිලියන 5000ක් මහ බැංකුවට පොලු තැබූ බවට චෝදනා ලැබූ මිලින්ද මොරගොඩ ඇමතිවරයා රාජපක්ෂ ආණ්ඩුවට එක්විය. ඉන් පසු පරීක්ෂණ අවසන්ය. අද වනතුරු චෝදනාව කමිටු වාර්තාවේ පමණි.

බිලුමැන්ඩල් පාරේ අක්කර 08ක රජයේ ඉඩම වෙළඳපොළ වටිනාකමින් තොරව සමාගමකට විකිණීම, තවත් ඇමතිවරයෙකුට එල්ල වූ බරපතළ චෝදනාවකි. ඔහු එ.ජා.ප.යේම සිටියානම් චෝදනාවට වැරදිකරුය. ඔහු එජාපයෙන් ආණ්ඩුවට පැනීම නිසා චෝදනාවෙන් නිදහස්ය. අවසානයේ ඉඩම් හුවමාරුවෙන් රජයට කිසිදු මුදලක් හිමි නොවූ බව පමණක් ඔප්පු විය. වාර්තා හමස් පෙට්ටියට ගිය අතර පිල්මාරුව නිසා චෝදනාවෙන් ගැලවීමට සන්ධාන පාලනය තුළ ඇමතිවරුන් වූ 'එ.ජා.ප. මිත්‍රයින්ට' හැකි විය. ගජමිතුරු දේශපාලනය විසින් හා පිල්මාරු සංස්කෘතිය විසින් ධනපති ක්‍රමයේම පැවැත්මට සකස් කරගත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අභියෝගයට ලක්කළේ එසේය.

නැවත 2007 අගෝස්තු මාසයේදී විජේදාස රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් වූ කෝප් කමිටුවම රාජ්‍ය ආයතන 70ක් පරීක්ෂාවට ලක් කර ආයතන 20ක් පිළිබඳ කරුණු සහිත වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

අමාත්‍යවරුන්ගේ ඇඟිලි ගැසීම, ලේකම්වරුන්ගේ අසමත්කම්, දුර්වල රජයේ අධීක්ෂණය ආදී කරුණු එම වාර්තාවෙන්ද හඳුනාගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව එස්.එම් චන්ද්‍රසේන අමාත්‍යවරයා මාවිල්ආරුවල අවතැන් වූ ගොවියන්ට ලබාදුන් වන්දිවලින් සිදුකළ වංචා ගැන බොහෝ කරුණු මෙහිදීද හෙළිවිය.

**මහාපරිමාණ වංචා** දූෂණ සිදුවී ඇති බව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මෙම කෝප්වාර්තාව මගින් අනාවරණය වන විට ඊට අදාලව නිහඬව සිටීමට බැරි නිසාම කතානායකවරයා එම වාර්තා යළිත් හොරු ඇල්ලීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යොමු කළේය. 'කාර්යක්ෂම ධනවාදයේ' හොරු-වංචනිකයින් ඇල්ලීමේ ආයතනය වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් පාර්ලිමේන්තුවේ කතානායකවරයාට දූෂිතයින් ඇල්ලීම කෙසේ වෙතත් එවැනි ලිපියක් ලද බවට හෝ යළි පිළිතුරු ලිපියක්වත් එව්වේදැයි අපි නොදනිමු.

**ගුණසේකර කමිටුව**

මෙවර 2011 දී යළිත් කෝප් (පොදු ව්‍යාපාර) කමිටු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ ඉතිහාසයේ ඉදිරිපත් කළ වාර්තා මාධ්‍යවල කටගැස්මට පමණක් සීමා වී තිබෙන යථාර්ථයකදීය. තමන්ගේ ක්‍රමය පවත්වා ගැනීමටවත් තරම් මූල්‍ය විනයක් ධනපති පාලනයට පවත්වා ගැනීමට නොහැකි බව ඔප්පු කර තිබියදීය.

ඩිව් ගුණසේකර වාර්තාව කලින් ඉදිරිපත් කළ වාර්තා කිසිවකටත් දෙවැනි නොවුණේ පිටු ගණනින්ය. පිටු ගණනින් කලින් වාර්තාවලට වඩා විශාලය. අධීක්ෂණය කළ ආයතන ගණනද 229ක්ය. එයද කලින්ට වඩා වාර්තාගතය. නමුත් අවසානයේ ප්‍රතිඵලය බින්දුවක්ය. කලින් වාර්තාවලට වඩා වෙනසකට ඇත්තේ පාඩු ලබන ආයතන 47ක් නම් කර ඉන් 10ක් පාඩු නොලබන ආයතන යැයි සභාපති ඩිව් ගුණසේකර විසින්ම යළිත් ප්‍රකාශ කිරීම පමණය.එයද පුදුමවීමට තරම් හේතුවක් නොවන්නේය. අපි පුදුම විය යුත්තේ එසේ සිදු නොවී මෙම වාර්තාව සත්‍ය එකක් ලෙසම තහවුරු කළේ නම් පමණි.

රාජ්‍යය බිහිවූ සමයේ පටන් රාජ්‍යය අහෝසි වන තුරුම රාජ්‍යය පවතින්නේය. ධනේශ්වර රාජ්‍යය සූරාකෑමෙන් මෙන්ම දූෂණයෙන්ද පිරී පවතින්නේය. රාජ්‍ය අහෝසි කරන රාජ්‍යය බිහිවන තුරුම දූෂණය නාස්තිය අක්‍රමිකතා මේ ක්‍රමයේ ජාති ලක්ෂණ ලෙස පවතින්නේය. ඒවා පාලනය කර ගැනීමට ඔවුන් විසින්ම සකස් කර ගන්නා, පනවා ගන්නා ව්‍යුහයන්ද පවතින්නේ, ක්‍රමය අර්බුදයකින් තොරව පවතින්නේ නම් පමණි. මෙම සමාජ ක්‍රමය අර්බුදයට යනවිටම ක්‍රමයේ පැවැත්මට පිහිටුවාගන්නා මෙම ආයතන ව්‍යුහයන්ද බාල්දු

15වැනි පිටුවට





ආර්ථික නිෂ්පාදනයත්, අනිවාර්යයෙන්ම ඉන් පැන නගින සෑම ඓතිහාසික යුගයකම සමාජ සැලැස්මත් එම යුගයේ දේශපාලනමය හා බුද්ධිමය ඉතිහාසයයේ පදනමයි.

**මාක්ස් / එංගල්ස්**
**කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය**

# රාජ්‍යයේ සම්භවය පිළිබඳ තවත් මත








ප්‍රසුගිය කලාපයේ දී අවසානයට අප විසින් සාකච්ඡා කරනු ලැබුයේ රාජ්‍යයේ බිහිවීම පිළිබඳ ග්‍රීක හා රෝම චින්තකයින් ඉදිරිපත් කළ මත පිළිබඳවය.

**රාජ්‍යයේ බිහිවීම පිළිබඳ පෙරදිග මත**

**හින්දු ආගමික මතය**

හින්දු ආගමික වේද ග්‍රන්ථවල සහ බ්‍රහ්මණ ඉගැන්වීම්වල රාජ්‍යයේ බිහිවීම පිළිබඳ මත ඉදිරිපත් කොට තිබේ. ඒවායෙන් කියැවුණේ රජයත්, රජුත් රටේ නීතියත් දෙවියන් විසින් නිර්මාණය කරන ලද බවය. මේ නිසා රජු තම පාලන කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු වූයේ දෙවියන්ට පමණයි. රජු කොතෙක් කෲර වූවත් ඔහුගේ පාලනය කොතෙක් පීඩාකාරී වූවත් ඊට විරුද්ධව නැගීසිටීමට ජනතාවන්ට බලයක් නොතිබිණි. දේශපාලන වශයෙන් මෙමගින් ආරක්ෂා කරනු ලැබුයේ ආඥාදායක බලයයි.

**බෞද්ධ මතය**

රජය බිහිවීම පිළිබඳ බෞද්ධ මතය දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙන් අපට හමුවේ. ඉබේ වැඩුණු ධාන්‍ය වර්ගය හෙවත් ස්වයං ජාත හාල් භුක්ති විඳිමින් මිනිසුන් ඉතා සතුටින් සාමදානයෙන් ජීවත් වූ ආදි කල්පිත යුගයන් විය. කල්යාමේදී තෘෂ්නාධිත මිනිසුන් විසින් තම පරිභෝජනයට පමණක් නොව ගොඩගසා ගැනීමටත් මෙහි ස්වයං ජාත හාල් නෙලීමට පටන් ගත්විට පැවති සමාජයේ සාමයත් සාමූහිකත්වයත් බිඳ වැටෙන්නට විය. තම පරිභෝජනය ඉතා ඉක්මනින් මිනිසුන් ධාන්‍ය නෙලීමට පටන්ගත්විට ධාන්‍ය වැවෙන භූමි භාගය ඔවුන් අතර පුද්ගලිකව බෙදාගෙන පරිභෝජනය කිරීමට තීරණය විය.

බුද්ධ දේශනාවට අනුව පෞද්ගලික දේපළ ක්‍රමය බිහිවී ඇත්තේ, ජනතාව විසින්ම ඇතිකරගත් සම්මුතියන් යටතේය. එහෙත් මෙම ප්‍රථම සම්මුතිය යටතේ බිහිකරගත් සමාජ ක්‍රමය සාමය හා යහපැවැත්ම වැඩිකල් පවත්වාගෙන යාමට නොහැකිවිය. ඊට හේතු වූයේ, එක්තරා තෘෂ්ණාධික පුද්ගලයෙකු තම ඉඩමේ ධාන්‍ය පරිභෝජනය කරන අතරම අසල්වැසි ඉඩමේ ධාන්‍ය සොරකම් කිරීමයි.

බිඳ වැටුණු සමාජ සාමයත් සාමූහිකත්වයත් ගොඩනැගීමට මිනිසුන් නැවත වරක් රැස්වී සාකච්ඡා කොට පුද්ගලික දේපළ ක්‍රමයේ ආරක්ෂාවට පාලකයෙකු පත්කර ගැනීමට තීරණය කළහ. මෙහි පාලකයා මහජනතාව විසින් ස්වකැමැත්තෙන් තෝරා පත්කරගත් නිසා මහා සම්මත ලෙසත් දේපළ ක්‍රමයේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටන නිසා ක්ෂත්‍රිය ලෙසත් ධර්මයට අනුව රට පාලනය කිරීමට පොරොන්දු වූ නිසා රජා ලෙසත් හඳුන්වන ලදී.

රාජ්‍යයේ සම්භාවය හා රාජ්‍ය පිළිබඳ හා සකස්වීමට නූතන යුගයේ තෝමර් මුවර්, ඉරාමස්, මාටින් ලූතර් සහ ජෝන් කැල්වින් යන අයගේ මතද විශේෂ බලපෑමක් කළේය. තෝමස් මුවර් 1478 දී එංගලන්තයේදී උපත ලැබූ නීතිඥයෙකි. ඔහු චින්තකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත්වූයේ, 1516දී ඔහු විසින් රචිත 'උටෝපියා' (UTOPIA)ග්‍රන්ථයෙනි.

මුවර්ගේ කුළුපග මිතුරෙකු වූ ඕලන්ද ජාතික ඩේසි මේරියුස් ඉරාමස් The Praise of Holly හෙවත් 'මෝඩකමේ දැනුම' නම් ග්‍රන්ථයේ රචකයාය. එමගින් ඔහු රාජ්‍යය පිළිබඳ පල්ලියේ බලපෑම් විවේචනයට ලක් කළේය.



> බිඳ වැටුණු සමාජ සාමයත් සාමූහිකත්වයත් ගොඩනැගීමට මිනිසුන් නැවත වරක් රැස්වී සාකච්ඡා කොට පුද්ගලික දේපළ ක්‍රමයේ ආරක්ෂාවට පාලකයෙකු පත්කර ගැනීමට තීරණය කළහ. මෙහි පාලකයා මහජනතාව විසින් ස්වකැමැත්තෙන් තෝරා පත්කරගත් නිසා මහා සම්මත ලෙසත් දේපළ ක්‍රමයේ ආරක්ෂකයා වශයෙන් පෙනී සිටන නිසා ක්ෂත්‍රිය ලෙසත් ධර්මයට අනුව රට පාලනය කිරීමට පොරොන්දු වූ නිසා රජා ලෙසත් හඳුන්වන ලදී.

1483 දී ජර්මනියේ උපත ලැබූ මාර්ටින් ලූතර් පූජකයෙකි. ඔහු පාප්ගේ සර්ව බලධාරී බලය විවේචනයට ලක්කළ අතර ඔහුගේ එම අදහස් හැඩ ගැන්වීමට ඉරාමස්ගේ ඉගැන්වීම් බලපෑවේය. කෙසේ වෙතත් මාටින් ලූතර් කතෝලික පූජකයෙකු ලෙස පල්ලියේ බලය අභියෝගයට ලක්කරමින් නැගී එන ධනවාදයේ චින්තනයට මග හෙළි කළේය.

ලූතර් මෙන්ම ජෝන් කැල්වින්ද (1509-1564) පල්ලිය අභියෝග යට ලක්කළේය.

ප්‍රොතෙස්තන්ත්‍රවාදයේ ප්‍රවණතාවයක් වූ කැල්වින්වාදය ප්‍රාථමික වශයෙන් ප්‍රාග්ධන සමුච්ඡගතවීමේ අවධියේ ධනපති අවශ්‍යතාවයන් ප්‍රකාශයට පත්කළේය.

ලූතරියානුවාදය (මාටින් ලූතර් ඉදිරිපත් කළ මතවාදය) තුළ දක්නට නොලැබුණු අන්දමේ සංවිධානයක ආගමික න්‍යාය ධර්මයක් මෙන්ම දැඩි විනය නීති මාලාවක්ද කැල්වින්වාදය තුළ දක්නට ලැබුණි. කැල්වින්ගේ චින්තනයේ මූලික ඉගැන්වීම වූයේ සර්ව බලධාරී වූ දෙවියන් වහන්සේ ඉදිරියේ මිනිසා ඉතාම අසරණ දුර්වල සත්වයෙකු බවයි. මේ නිසා උන්වහන්සේගේ කැමැත්ත පරිදි නියතවී ඇති මිනිස් ජීවිතය වෙනස් කිරීමට මිනිසා සතුව බලයක් නොපවතී. උප්පත්තියෙන්ම එක්කෝ මිනිසා නිරයට තීන්දු වී ඇත. නැත්නම් දෙවියන්ගේ රාජ්‍යයට ඇතුල් කරගැනීමට තෝරාගෙන ඇත.



එහෙත් කතෝලික සභාවේ බලය ව්‍යාප්තවූ රටවල්වල කැල්වින්වාදීන්ට තම සමය ආරක්ෂා කර ගැනීමට කැල්වින්ගේ මෙම අදහස් බාධකයක් විය. එනිසා ඔවුහු ආගමික පීඩනයන්ට එරෙහිව ආගමික සහනශීලීභාවය සඳහාත් ආඥාදායකත්වයට එරෙහිව දේශපාලන නිදහස සඳහාත් සටන් කිරීමට පෙළඹුණහ. මෙය ඉතාමත් කදිමට පිළිබිඹුවන්නේ ප්‍රංශයේ හියුගෝනට්වරු ගෙන ගිය ආගමික සටන් ව්‍යාපාරය තුළිනි.

කැල්වින්වාදය වැළඳගත් හියුගෙ ්නට්වරුන්ට ප්‍රංශයේ කතෝලික රාජ්‍යයේ දැඩි මර්දනයට එරෙහිව සටන් කිරීමට සිදුවිය. 30 අවුරුදු යුද්ධයකට මගපෑදූ මේ සටන ආඥාදායකත්වයට එරෙහිව ලිබරල්වාදීන් පසු කලෙක ගෙන ගිය සටන් ව්‍යාපාරවල පූර්වාදර්ශය සැපයීය.

හියුගෝනට්වරුන් විසින් රාජ්‍යවල ආගමික පීඩනයට විරුද්ධව පත්‍රිකා රාශියක් පළකරන ලදී. ඒවා නිර්ණාමිකව හෝ ව්‍යාජ නම්වලින් පළකරනු ලැබිණි. ඒ අතරින් ස්ටීවන් ජූනියස් බෲටස් නමින් පළකරනු ලැබූ Vindicine Contra Tyrannos නම් ලියැවිල්ල ඓතිහාසික වැදගත්කමක් දරයි. මෙම ලියැවිල්ලෙන් ප්‍රධාන ප්‍රශ්න 4ක් මතු කරනු ලැබිණි.

1. දෙවියන්ගේ නීතියට එරෙහිවත් රජවරුන් ආඥාවක් නිකුත් කරන විට එයට යටත් වීමට ජනතාව බැඳීසිටීද?
2. දෙවියන්ගේ නීතියට එරෙහිව ක්‍රියාකරන රජවරුන්ට විරුද්ධව නැගීසිටීම නීත්‍යානුකූලද? එලෙස නැගීසිටීම නීත්‍යානුකූල නම් එය කවරෙකු විසින් කොතෙක්දුරට කළ යුතුද?
3. රාජ්‍යයන් විනාශ මුඛයට ළංකරමින් ජනතාව පීඩාවට පත්කරන්නා වූ රජෙකුට විරුද්ධවත් එලෙස නැගීසිටීම නීත්‍යානුකූලද? එසේනම් එය කවරෙකු විසින් කොතෙක් දුරට ක්‍රියාත්මක කළ යුතුද?
4. මෙබඳු ප්‍රජාපීඩක පාලකයන්ට එරෙහිව ඇති කරන්නාවූ කැරලි ගැසීම්වලට සහන දීමට අසල්වැසි පාලකයන්ට අයිතියක් තිබේද? යන්න එම ප්‍රශ්න හතරයි.

මෙම ප්‍රශ්න හතරට පිළිතුරුදීම සඳහා කතුවරයා දේශපාලන යටත්භාවය පිළිබඳ සම්මුතිවාදයක් ඉදිරිපත් කරයි. ජනතාව පාලකයාට යටත් වන්නේ, සම්මුතියක් මත පිහිටාය. එවැනි සම්මුති දෙකක් ඇත. පළමුවැන්න වන්නේ එක් පාර්ශවයක ජනතාවත් පාලකයන් තවත් පාර්ශවයක සිටත් ඇති කරගත් සම්මුතියයි. දෙවැන්න පාලකයා සහ ජනතාව අතර ඇතිකරගෙන තිබෙන සම්මුතියයි.

පළමු සම්මුතිය යටතේ එය රැකීමේලා දෙවියන්ට වගකීමට බැඳීසිටින්නේ පාලකයා පමණක් නොවේ. ජනතාවද එහි කොටස්කරුවන් බැවින් දෙවියන් සමග ඇතිකරගත් සම්මුතිය ආරක්ෂා කරගැනීමේලා පාලකයා මෙන්ම ජනතාවද එක සමාන ලෙස බැඳී සිටියි.

මෙනිසා යම් හෙයකින් පාලකයා එහි සම්මුතියට පටහැණිව හිතුවක්කාරී ලෙස ක්‍රියා කරන්නේනම් ඔහු පලවාහැරීමට ජනතාවට බලයක් තිබේ.

දෙවැනි සම්මුතිය යටතේද එහි සම්මුතියට පටහැණිව ක්‍රියාකරන පාලකයන්ට විරුද්ධව කැරලි ගැසීමට ජනතාවට අයිතිය තිබේ.

# නිදහස් අධ්‍යාපන අයිතිය අහෝසියි

## පනත පාර්ලිමේන්තුවට

1978 විවෘත ආර්ථිකය අපේ රටට හඳුන්වා දීමත් සමග සෑම දෙයක් සම්බන්ධයෙන්ම මිලක් සහිතව බලන සමාජයක් ගොඩනැගෙන්නට විය. එහි තර්කානුකූල එළඹුමෙන් අධ්‍යාපනයටද වියෝ වන්නට බැරි විය. 1983 අධ්‍යාපන ධවල පත්‍රිකාව යනුවෙන් එවකට එක්සත් ජාතික පක්ෂ පාලනය විසින් ගෙන එන ලද අධ්‍යාපන සැලැස්ම ඍජුවම අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය අහෝසි කරන සැලැස්මක් වූ අතර එය පරාජය කිරීමට අපේ රටේ සිසුන් ගුරුවරුන් මෙන්ම දෙමව්පියන්ද විසින් අති විශාල කැපකිරීමක් කරන ලදී. එකී කැපකිරීම ඉතිහාසයේ සාක්ෂි අතර වඩාත් බරින් තැන්පත් වී තිබේ. ඉන්පසුව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නමින් පාර්ලිමේන්තුවට පනතක් ගෙනවිත් එදා රනිල් වික්‍රමසිංහ මහතාට කළ නොහැකි වූ දෙය කිරීමට උත්සාහ කළද එයද පෙරසේම පරාජය කරන්නට මෙරට ප්‍රගතිශීලී ජනතාව සමත් විය. එවැනි කාර්යයන්වල නියළුණු සමහර තැනැත්තන් මෑත ඉතිහාසය තුළ තම භූමිකාව සඟවා තබා ගනිමින් සිට යළි කරළියට රැගෙන විත් තිබෙන බව වත්මන් රාජපක්ෂ අට හවුල් පාලනය පසක් කරමින් තිබේ. වත්මන් ආණ්ඩුව විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අලුත් පනතක් කඩිමුඩියේම පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු සූදානම් කර තිබේ. එය නම් කොට ඇත්තේ 'උසස් අධ්‍යාපන ආයතනවල සුදුසුකම් රාමුව, ප්‍රමිති ආරක්ෂණය හා වරප්‍රදාන කිරීමේ පනත' (Qualification Framework, Quality Assuarance And Accreditation Of Higher Educational Institutions Act) යනුවෙනි. ආණ්ඩුව ජනතාවට හා ශිෂ්‍යයින්ට කොළේ වසා වෙනත් නමක් ආරෝපණය කරමින් මේ ගෙන ඒමට සූදානම් වෙන්නේ 'පෞද්ගලික විශ්වවිද්‍යාල පනත'ම බව ඉතා පැහැදිලිය.

1977 සිටම අපේ රටේ බලයට ආ විවිධ ආණ්ඩු පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවන්නට උත්සහ ගත් බව රටේ ජනතාව සාක්ෂි දරනු ඇත. අවස්ථා කීපයකදීම විවිධාකාරයේ නම්වලින් ආයතන ගණනාවක් පිහිටුවනු ලැබුවද ඒ සෑම ආයතනයක්ම නීත්‍යානුකූල කරගැනීමට කටයුතු සිදුකරගනු ලැබුවේ දැනට ක්‍රියාත්මක නීති රාමුව තුළදී වීම විශේෂත්වයකි. එහෙත් රාජපක්ෂ අටහවුල් ආණ්ඩුව ඉතිහාසයේ පළමු වතාවට වෙනම පනතක් ගෙනවිත් පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීමටත්, පිහිටුවා තිබෙන ''උපාධි කඩවලට'' නීත්‍යනුකූලභාවය ලබා දීමටත් මේ වන විට කටයුතු සූදානම් කර තිබේ.

විශ්වවිද්‍යාල හසුරුවන සර්වබලධාරී 'මණ්ඩලය'

**01.** මේ පනත මගින් රටේ පවතින සියලුම රාජ්‍ය, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන පාලනය කිරීමට හා ඒවා පිළිබඳ තීන්දු ගැනීමට සමත් සර්ව බලධාරී 'මණ්ඩලයක්' පත්කරනු ලබන අතර එය නම් නම් කොට ඇත්තේ Sri Lanka Qualification Framework, Quality Assurance And Accreditation Board යනුවෙනි. දැනට අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය පාලනය කරන ඉහළම ව්‍යුහය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත් (UGC) මේ මණ්ඩලය යටතට පත්වෙයි. විශ්වවිද්‍යාල සම්බන්ධව තීන්දු ගන්න UGC යට තිබූ ස්වාධීනත්වයත් නැති කර එය තවත් රූකඩ ආයතනයක් බවට මේ පනතෙන් පත් කර ඇත.

**02.** ඉහත කී සර්වබලධාරී 'මණ්ඩලයට' සාමාජිකයන් 11 ක් පත්කෙරේ. 04 දෙනෙක් උසස් අධ්‍යාපන ඇමතිවරයා විසින් ඍජුවමත්, ඉතිරි 07 දෙනා නිල බලයෙනුත් පත් වෙයි. මේ 07 අතරේ විශ්වවිද්‍යාල උපකුලපති කමිටුවේ සභාපතිත්, UGC සභාපතිත් ඇතුළත්ය. කෙටියෙන් කියතොත් 'මණ්ඩලයේ' සාමාජිකයන් 11 න් 09 ක්ම ඇමතිවරයාට අනුව හැසිරෙන පත්වීම්ය. වෘත්තීය ක්ෂේත්‍ර නියෝජනය කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) සභාපතිත්, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාපතිත් සිටියි.

දැනට පවතින SLMC ය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට විරුද්ධ බව සඳහන් කොට තිබේ. එමනිසා එහි තිබෙන වෘත්තීය ගරුත්වය හා ස්වාධීනත්වය අහිමි කර, පිළියන්දල VIGNAN පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යක්ෂ ලෙස පත්වීම භාරගත් මහාචාර්ය කාලෝ ෆොන්සේකා SLMCයේ සභාපති කිරීමට ආණ්ඩුව කටයුතු කළේය. මේ අනුව මේ මණ්ඩලය පවසන්නේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම වෙනුවට ආණ්ඩුවේ පෞද්ගලීකරණ වුවමනාව අනුව මෙහෙයවෙන ආයතනයක් බව පැහැදිලියි.

**03.** උසස් අධ්‍යාපන සුදුසුකම් සහිත ඕනෑම කෙනෙක් 'මණ්ඩලයේ' සභාපති කිරීමේ බලය උසස් අධ්‍යාපන ඇමතිවරයාට පනතෙන් පවරෙයි. ඒ අනුව මූලික උපාධියක් තියෙන ඕනෑම ජාවාරම්කාරයෙක්, කොම්පැණිකාරයෙක්, කලුකඩ මුදලාලි කෙනෙක් රටේ දරුවන්ගේ උසස් අධ්‍යාපනය පිළිබඳ තීන්දු ගන්න ඉහළම තැනට පත්වීමට ඉඩ ඇත. මේ ආණ්ඩුව පෞද්ගලික විශ්වවිද්‍යාලවලට පාන ආදරය අනුව මාලඹේ PMC අයිතිකාර වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා 'මණ්ඩලයේ' සභාපති ඉඩ නැත්තේ නොවේ.

**04.** පනතේ 04 (ඊ) වගන්තිය අනුව රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාලවල පාඨමාලා සංසන්දනය කර, ඒවා පවත්වාගෙන යාම හෝ නොයාම පිළිබඳ තීන්දු ගැනීමට 'මණ්ඩලයට' බලතල තිබේ. ලාභ නොලබන පාඨමාලා ලෙස නම් කර පුරාවිද්‍යාව, දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සංස්කෘත, ඉතිහාසය වැනි සමාජීය විද්‍යා විෂයයන් සම්පූර්ණයෙන්ම රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් ඉවත් කරන්නත් මේ අනුව හැකිය. (දැනටමත් මේ අධ්‍යයනාංශ වසා දැමීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටී.) ඒවගේම 'මණ්ඩලයට' නිල බලයෙන් වෛද්‍ය හා ඉංජිනේරු ක්ෂේත්‍ර නියෝජනය කරමින් පමණක් සාමාජිකයන් දෙදෙනෙක් තෝරා ගැනීමෙන්ම පෙනී යන්නේ, ආණ්ඩුව මුලින්ම විකිණීමට සූදානම් මෙම පාඨමාලා බවය. තවත් ඉදිරියට යන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාඨමාලාවල ගුණාත්මකභාවය අඩුයැයි නිර්දේශ කර විකිණිය හැකි පාඨමාලා සියල්ල පෞද්ගලික විශ්වවිද්‍යාලවලට පැවරීමටත් 'මණ්ඩලයට' හැකිය.

පෞද්ගලික විශ්වවිද්‍යාල කොමිසම

**05.** මේ පනත යටතේ ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට පෞද්ගලික විශ්වවිද්‍යාල සඳහාම වෙනම ආයතනයක් පිහිටවේ. ඒය නම් කර ඇත්තේ, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා කොමිසම (Council for Non-State Higher Educational Institutions) යනුවෙනි. පෞද්ගලික විශ්වවිද්‍යාල ලියාපදිංචිය, පිළිගැනීම හා පාලනය කිරීම, උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශය ධෛර්යමත් කිරීම, ආධාර කිරීම හා දියුණු කිරීම, රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීමේදී එයට උපදෙස් දීම මේ කොමිසමේ කාර්යයන් අතර සමහරක්. මේ ගෙනඒමට හදන්නේ, UGC යටත් වඩා බලතල සහිත පෞද්ගලික විශ්වවිද්‍යාල කොමිසමකි.

**06.** මේ කොමිසමේ සාමාජිකයන් 13 න් 06 ක් ම පත් කරන්නේ උසස් අධ්‍යාපන ඇමතිවරයාය. ඒ අය අතරට වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකරණ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 03 දෙනෙකු අයත්ය. මෙයින් පෙනී යන්නේ ඉදිරියේදී වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකරණ, නීති, තොරතුරු තාක්ෂණ වැනි විකුණා ලාභ ලැබිය හැකි උපාධි සියල්ලම විකිණීමට ආණ්ඩුව සූදානම්ය යන්නය.

**07.** පනතින් හඳුන්වන 'රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල' මුලින්ම ලියාපදිංචි කළ යුත්තේ, සමාගම් රෙජිස්ට්‍රාර් හා ආයෝජන මණ්ඩලය යටතේය. එයින් අදහස් වන්නේ, ඒවා ව්‍යාපාරික ආයතන බවය. මෙයින් පැහැදිලි වෙන්නේම ආණ්ඩුවේ අරමුණ විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය නොහැකි ලකුණු 1-2 ක් මදි වෙන සිසු සිසුවියන්ට සරසවි වරම් හිමිකර දීම වෙනුවට රුපියල් ලක්ෂ 50-100 ට උපාධි විකුණා මුදල් ගැරීම බවය. කොමිසමේ අරමුදල් ඕනෑම වේලාවක ඕනෑම තැනක ආයෝජනය කිරීමේ බලයත් පනතේ 52 වන වගන්තිය අනුව කොමිසමට හිමි වෙයි.

මෙහි අදහස උසස් අධ්‍යාපනය විකිණීම හැරෙන්නට වෙන මොකක්ද ?

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය දුබල කර, පෞද්ගලික විශ්වවිද්‍යාලවලට නිලභාවය ලබාදී රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කිරීම ආණ්ඩුවේ දුෂ්ට අරමුණ බව හොඳටම පැහැදිලිය. රටේ ආදායමෙන් හරි අඩක්ම පොහොසත්ම පවුල් 20% අතර බෙදාගනිද්දී, දුප්පත්ම පවුල් 20% ට ලැබෙන්නේ රටේ ආදායමෙන් 4.5% කි. මෙවැනි දුප්පත් පවුල්වල දරුවන්ට සමාජයේ ඉහළ නැගීමට තිබූ පඩිපෙළ නිදහස් අධ්‍යාපනය පමණි. ඒ අයිතියත් අහිමි කිරීමට ආණ්ඩුව දැන් මේ පනත ගෙනඒමට සූදානම් වේ. ප්‍රෝඩාකාරී ලෙස පාර්ලිමේන්තුවේ ගොඩනගාගත් 2/3 බලය පාවිච්චි කර පනත සම්මත කරගැනීමට ආණ්ඩුව මේ වන විට කටයුතු සූදානම් කොට අවසාන බව ඉතා පැහැදිලිය.

නිදහස් අධ්‍යාපන අයිතිය දූයේ දරුවන්ගෙන් උදුරා ගැනීමට අපේ රටේ බොහොමයක් පාලකයන් උත්සාහ කළ නමුත් එය සාර්ථක නොවූයේ අපේ රටේ දෙමව්පියන් ගුරුවරුන් මෙන්ම දරුවන් එයට එරෙහිව අති දැවැන්ත මැදිහත්මක් කළ නිසාය. අධ්‍යාපන අයිතිය විනාශ කිරීම සඳහා ආණ්ඩු විසින් ගෙන එන ලද සෑම අණ පනතක් සම්බන්ධයෙන්ම කල් වේලා ඇතිව දකිමින් එහි හානිය රටට ප්‍රකාශ කරමින් එය රැක ගැනීම සඳහා මෙරට ප්‍රගතිශීලී ජනයා පෙළගස්වනු ලැබුවේ ජනතා විමුක්ති පෙරමුණය. එසේ නොවන්නට අද නිදහස් අධ්‍යාපන අයිතිය යනුවෙන් අපට කථා කරන්නට හෝ කිසිවක් ඉතිරිවී නොතිබීමට බොහෝ විට ඉඩ තිබුණි. තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම සඳහා මහත් සේ උනන්දුවෙන් කටයුතු කරන දෙමව්පියන්ගේ අභිලාෂයන්වලට මුවා වී රටේ පාලකයින් සුවහසක් දරුවන්ගේ නිදහස් අධ්‍යාපන අයිතිය විනාශ කිරීම සඳහා සැලසුම් සකස් කරමින් තිබේ. මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය යනු දෙමව්පියන්ගේ අභිලාෂයන්වලට මුවා වී අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම සඳහා ගන්නා ලද රාජපක්ෂ අට හවුල් පාලනයේ එක් අවස්ථාවකි. එහි ආරම්භක මොහොතේදී එහි සාධාරණය උදෙසා එම විද්‍යාලයේ දරුවන්ගේ දෙමව්පියන් යොදාගන්නට රාජපක්ෂ අටහවුල් පාලනය සමත් වුවද වර්තමානයේ එම දරුවන්ගේ දෙමව්පියන් මාලබේ වෛද්‍යා විද්‍යාලයට එරෙහිව නීතිය ඉදිරියට ගොස් ඇත්තේ තමන් වියදම් කළ මුදල් ආපසු ලබා ගැනීම වෙනුවෙන් යුක්තිය ලබා ගනු සඳහාය. ඔවුන් පවසන්නේ, තම දරුවන් වෙනුවෙන් තමන් වියදම් කරන ලද අති විශාල මුදල වෙනුවෙන් තම දරුවාට නිසි අධ්‍යාපනයක් එකී ආයතනය මගින් ලබා නොදෙන බවයි. මෙයින් පැහැදිලි වන්නේ, ලාභය අරමුණු කරගත් ව්‍යාපාරික මනසකින් අධ්‍යාපනය දෙස බලන තැනැත්තකුට එහි ගුණාත්මකභාවය පිළිබඳ අවධානයක් යොමු කිරීමට අවශ්‍ය නොවන බවය. ඉදිරියේදී පිහිටුවීමට උත්සාහ කරන පෞද්ගලික විශ්ව විද්‍යාලවලටද අත්වන ඉරණම මෙය මිස අන් යමක් නොවන බව පැහැදිලිය. රාජපක්ෂ අට හවුල් පාලනය මුහුණ දෙන ණය උගුලෙන් බේරීම සඳහා ඔවුන්ට විකිණීම හා කොල්ලකෑම හැර අන් යමක් නොමැති බව ඉතා පැහැදිලිය. එහෙත් රාජපක්ෂ අටහවුල් පාලකයින්ගේ එකී වුවමනාව තෘප්ත කිරීම සඳහා අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය බිලි ගැනීමට ඉඩදී බලා සිටීම වගකීම් සහිත පුරවැසියකුගේ කාර්යය නොවනු ඇත . මක්නිසාද යත් අධ්‍යාපනය යනු රටක අනාගතය තීරණය කරන ප්‍රබලම සාධකයක් වන බැවිනි.






''පාලකයෝ කිසි විටෙක ජනතාවට අධ්‍යාපනය ලබාදීමට කටයුතු නොකරති. ඔවුන් උත්සාහ කරන්නේ ජනතාව අධ්‍යාපනයෙන් පිටමං කිරීමටය. මක් නිසාද යත් උගත් ජනතාවට පිළිතුරු දීමට පාලකයන්ද උගත්තු විය යුතු වන බැවිනි.

**ප්‍රංශ ජාතික අධ්‍යාපනඥ ලොයිස් බ්‍රේයිලි**

# ජයග්‍රහණ මැද පෙරට යන කියුබන් කාන්තාව හා අපි

කියුබන් විප්ලවය සිදු වී ජනවාරි 1 වැනිදාට වසර 53 කී. කියුබන් විප්ලවයත් සමඟ එරට ආර්ථික, දේශපාලන, සංස්කෘතික, සමාජීය වෙනස්කම් ගණනාවක් සිදුවූවා සේම කියුබන් කාන්තාවගේ ජීවන තත්වයේ සුවිශේෂී වෙනස්කම් ගණනාවක්ද සිදුවිය. ඒ විප්ලවීය වෙනස්කම් හේතුවෙන් අද වනවිට කියුබන් කාන්තාවන් දේශපාලන, රැකියා, අධ්‍යාපන, සෞඛ්‍ය ක්ෂේත්‍රයන් තුළ කැපී පෙනෙන තත්වයක් හිමිකරගෙන ඇත.

විප්ලවයට පෙර කියුබන් කාන්තාවගේ තත්වය

පිදෙල් කැස්ත්‍රෝගේ නායකත්වයෙන් 1959 දී සිදුවූ විප්ලවයට පෙර කියුබාව ඉතාම දිළිඳු රටක් වූ අතර ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 20% ට වඩා අඩු අගයක (1956දී- 17%) පැවතිණි. 1940 ව්‍යවස්ථාව තුළ ලිංගිකත්වය මත වෙනස් ලෙස සැලකීම නීති විරෝධී යැයි සටහන්ව තිබුණද 1959 වනතෙක් එම නීතිය ක්‍රියාත්මක වූයේ නැත. කාන්තාවන් ඉතා සීමිත පිරිසකට ගුරුවරියන්, ලේකම්වරියන්, උපස්ථායිකාවන් ලෙස රැකියා අවස්ථාවන් හිමි වුවද වැඩ කරන කාන්තාවන්ගෙන් බහුතරය ගෘහ සේවය, සිගරට් හා ඇඳුම් කර්මාන්ත තුළ මෙන්ම ගණිකා වෘත්තිය තුළ ඉතා අඩු මුදලකට සූරාකෑමට ලක්විය. එකල හවානා නගරය 'ගණිකා මඩම' ලෙස හැඳින්වූයේද බොහෝ කාන්තාවන් තම දිවිපෙවෙත ගැටගසා ගැනීම සඳහා ගණිකා වෘත්තියේ නිරත වූ බැවිනි.

1959ට පෙර ළමුන්ගෙන් 60% ක් පාසල් නොගිය අතර එකල සාක්ෂරතා නොහැකියාව 40.3% ක් විය. බොහෝ පවුල්වල ආර්ථික අගහිඟකම් හේතුවෙන් පිරිමි දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පමණක් වියදම් කිරීමට දෙමාපියන් කටයුතු කළ බැවින් කාන්තාවන්ගෙන් බහුතරයක් 6 ශ්‍රේණිය දක්වාවත් අධ්‍යාපනය ලබා නොතිබුණි. එනිසා ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ගේ සාක්ෂරතාව ඉතාම පහළ මට්ටමක පැවතිණි. එසේම සෞඛ්‍ය සේවය කෙතරම් පහත් මට්ටමක පැවතියේද කිවහොත් ළදරු මරණ අනුපාතිකය උපත් 1000 කට 100ක් තරම් වූ අතර ජීවිත අපේක්ෂා කාලය වූයේ වසර 50 කි.

විප්ලවයෙන් පසු කාන්තාවන් ලැබූ ජයග්‍රහණ කියුබන් කාන්තාවන්ට ආර්ථික, දේශපාලන, සංස්කෘතික, සමාජීය ක්ෂේත්‍රයේ පමණක් නොව පවුල තුළද අයිතීන් හා පිරිමින්ට සමාන තත්වයක් හිමිවන බව සඳහන් වගන්ති කිහිපයක් එරට ව්‍යවස්ථාව තුළටද ඇතුළත් කර එම අයිතීන් තහවුරු කිරිමේ පියවර ගැනීමට විප්ලවීය ආණ්ඩුව කටයුතු කළේය. එසේම සමාජ සාධාරණත්වය තුළ කාන්තාවන්ට සමාන හිමිකම් ලබාදීම මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන එය නීතියෙන් තහවුරු කිරීමට පියවර ගැනීමද කියුබන් විප්ලවයෙන් පසුව ඇති වූ තවත් සුවිශේෂී වෙනසක් විය. දේශපාලනයේදීද කාන්තාවන් ඉදිරියෙන් සිටින අතර පාර්ලිමේන්තුව තුළ කියුබන් කාන්තා නියෝජනය 43.2%කි.



වර්තමානයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන්ගේ ප්‍රතිශතය අනුව කියුබාවට හිමිවන්නේ ලෝකයේ 6 වන ස්ථානයය.

අධිකරණ පද්ධතිය තුළ කාන්තා නියෝජනය 60%කි. නීතීඥවරියන් ලෙස 62%ක්ද, විනිසුරුවරියන් ලෙස 49%ක්ද, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියන් ලෙස 47%ක්ද වශයෙන් එම ක්ෂේත්‍රය තුළ ඉහළ කාන්තා නියෝජනයක් දක්නට ලැබේ. එසේම විප්ලවයෙන් පසුව සියලු ක්ෂේත්‍රවල රැකියාවන්හි නිරතවීමට ඉඩ සැලසෙන පරිදි නීති පවා සම්මත වූ අතර අද වනවිට කියුබාවේ ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 66%කි. ජාතික ආර්ථිකයේ සෑම අංශයකම හා සෞඛ්‍ය, අධ්‍යාපන, විද්‍යා ක්ෂේත්‍රයන් තුළ විශාල ලෙස කාන්තා සහභාගිත්වයක් දක්නට ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ 72%ක්ද, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ 70% ක්ද, වෘත්තීය හා තාක්ෂණික ශිල්පීනියන් ලෙස 66.4% ක්ද, බැංකු සේවිකාවන් ලෙස 70%ක්ද ලෙසින් කාන්තා නියෝජනය ඉහළ මට්ටමක පවතී.

විප්ලවයෙන් පසු අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින්, පළමු වසර 10 තුළ අලුතින් පාසල් 7000ක් ආරම්භ කිරීමටද, විප්ලවයට පෙර ද්විතීයික අධ්‍යාපනය ලැබීමට පවා ඉඩ විවර නොවූ කාන්තා පාර්ශ්වයට අධ්‍යාපනයේදී පිරිමින්ට හා සමාන අවස්ථාවන් ලබාදීම වෙනුවෙන් පාසල් පද්ධතිය තුළ වැඩපිළිවෙළවල් ගණනාවක් ක්‍රියාත්මක කිරීමටද පියවර ගැණුනි. එලෙස සැලසුම්සහගත ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දියත් වූ වැඩපිළිවෙළ හේතුවෙන් විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන කාන්තාවන්ගේ ප්‍රතිශතය 62% ක් දක්වා ඉහළ නැංවීමට හැකිවිය. තවද විද්වත් මට්ටම් තුළ කාන්තා නියෝජනය 41.7%කි.

එක්සත් ජනපදය විසින් පනවා ඇති ආර්ථික සම්බාධක මැද වුවද වර්තමානයේ ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාමට කියුබාව සමත් වී ඇත. මේ වනවිට කියුබාවේ සජීවි උපත් 1000 කට ළදරු මරණ අනුපාතිකය 6ක් වේ. එය ලතින් අමෙරිකානු රටවල අඩුම ළදරු මරණ අනුපාතිකය වන අතර ලෝකයේ අඩුම ළදරු මරණ අනුපාතික ඇති රටවල් අතර කියුබාවද සිටී. 2009 වසර වනවිට කියුබාවේ ජීවිත අපේක්ෂා කාලය අවුරුදු 79 කි. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ජනගහනයෙන් 300කට එක් වෛද්‍යවරයෙක් සිටිය යුතු යැයි පවසා ඇති අතර ලෝකයේ එක් වෛද්‍යවරයෙකුට සිටිනා අඩුම ජනගහනය ඇත්තේ කියුබාවේය. එය ජනගහනයෙන් 167කට එක් වෛද්‍යවරයෙක් ලෙසිනි. 2007 වසර වනවිට 68 000ක් වූ වෛiවරුන්ගේ ප්‍රමාණයෙන් 53.3%ක් කාන්තාවන්ය.

| මූලික දත්ත කිහිපයක් | කියුබාව | ශ්‍රී ලංකාව |
|---|---|---|
| ජනගහනය | මිලියන 11.2 | මිලියන 18.1 |
| උපතේදී ආයු කාලය | අවුරුදු 79 (2009) | අවුරුදු 74 (2009) |
| ළදරු මරණ අනුපාතිකය-සජීවි උපත් 1000කට | 6 (2009) | 15 (2009) |
| එක් වෛද්‍යවරයෙකුට ඇති ජනගහනය | 167 (2007) | 1800 (2007) |
| සාක්ෂරතාව(%) | 100 (2009) | 91 (2005-2008) |
| කාන්තා සාක්ෂරතාව (%) | 100 | 83.8 |
| ජාතික ආදායමෙන් සෞඛ්‍ය සඳහා වෙන් කළ කොටස(%) | 23 (1998-2008) | 6 (1998-2008 |
| ජාතික ආදායමෙන් අධ්‍යාපනය සඳහා වෙන් කළ කොටස (%) | 10 (1998-2008) | 3.35 |
| පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය (%) | 36 | 10 (1998-2008) |
| කාන්තා ශ්‍රම බලකාය (%) | 66 | 33.5 |

සටහන -1 (මූලාශ්‍රය - යුනිසෙෆ්)

සමාජවාදී කියුබාවේ තත්වය එසේ වන විට අප රටේ කාන්තාවන්ගේ තත්වය ගැන සොයා බැලීම වැදගත් වන්නේ අප සිටිනා තත්වය සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට එයින් හැකිවන හෙයිනි.

(සටහන -1) කියුබාව තම රටේ සංවර්ධනය සඳහා එරට සියලු කාන්තාවන්ගේ දායකත්වය ලබා ගැනීමට වැඩපිළිවෙළවල්, සැලසුම් දියත් කරද්දී, ණය හා බදු මත ආර්ථිකය පවත්වාගෙන යන යමින්, ආර්ථිකය නැංවීමට කිසිදු වැඩපිළිවෙළක් නොමැති වත්මන් ආණ්ඩුවට මෙරට කාන්තාවන් නගා සිටුවීම සඳහා වැඩපිළිවෙළක් ඇතැයි සිතීමද විහිළුවකි. සටහන-1 දෙස බැලූවිට අපට වැටහෙන්නේ විප්ලවයෙන් පසු දුප්පත්කම තුරන් කරමින්, සෑම පවුලකටම නිවසක් ලබාදෙමින්, නූගත්කම මුළුමනින් තුරන් කරමින්, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි ලොව ඉහළම සේවාවන් පවත්වාගෙන යන රට බවට පත්වෙමින්, අධිරාජ්‍යවාදී රටවල විවිධ බාධක හමුවේ වුවද කියුබාව නොසැලී අධිෂ්ඨානශීලීව සැලසුම්සහගතව ඉදිරියට යන බවකි.

## වෙනසකට කාලයයි



සීතලව කැටි ගැසුණු
ගණ අඳුරු කළුවරේ
දිගු කල්ප කාලයක්
ඇවිද ආවෙමු සබඳ.......
'වෙනසකට කාලයයි'
පෙර'ඹරින් නැගෙන හිරු
සීරුවෙන් සන් කරයි
වේදනාවෙන් බරිත හදවතේ
උණුසුමෙන්, සීතලෙන් පණ
පෙවුණු
සහෝදර ප්‍රේමය.....
දෝතටම ගෙන තෙදින්
ප්‍රභාත්මක හෙට දිනක්
පුබුදන්න
විඳාලන්න ඔබ දැත්.......

# චීනය වටලෑම වෙනුවෙන් සීතලේ සිටීම

පසුගිය දෙසැම්බර් මැදභාගයේ දිනක වොෂින්ටනයේදී රටවල් 3ක සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැත්වුණා. මේ පිළිබඳව ලෝක අවධානය එතරම් යොමු නොවූවත් එය රහසිගත කඳවුරු බැඳීමක පළමු පියවරයි. සීතල යුධ සමයේ ලෝකය මූලික කඳවුරු දෙකකට බෙදී තිබීමෙන් පසු ලෝකය අත්දකින නව කඳවුරු බැඳීමක මුල් අවස්ථාවක් ඉන් සටහන් වුවා.

**සයකන් මන්ත්‍රණය**

අභිමි වෙමින් යන තම ගෝලීය භූමිකාව නැවත අත්පත්කර ගැනීමේ අප්‍රකාශිත සටනක සිටින ඇමරිකා එක්සත් ජනපදයේ අනුග්‍රහය යටතේ පැවති මෙම සාකච්ඡාව සඳහා සහභාගි වූයේ, ආසියාවේ රටවල් 2ක්. ඒ, ඉන්දියාව සහ ජපානයයි.

මෙම ත්‍රෛපාක්ෂික රැස්වීම සඳහා ඉන්දියාවෙන් ජාවෙඩ් අෂ්රෆ් සහ ගෞතම් බම්බ්වාලේ සහ ලේකම්වරු දෙදෙනා සෙසු රටවල් දෙකෙහි නියෝජිතයින් හමුවූ බව ඉන්දීය ආරංචි මාර්ග සඳහන් කළා.

මේ සාකච්ඡාවේ ප්‍රකාශිත අරමුණ වූයේ, රටවල් ත්‍රිත්වයෙහි වෙළඳාම, ආර්ථිකය හා න්‍යෂ්ටික බලය පිළිබඳ සාකච්ඡා කිරීමයි. එහෙත් මේ එකතුවෙහි ස්වභාවය හූ දේශපාලනික අර්ථයෙන් තේරුම්ගත් විට එහි ප්‍රධාන අරමුණ ඉහත සඳන්වූ එකක්වත් නොවන බව ඉතාම පැහැදිලියි. මන්ද එකතුවූ සියලුදෙනාගේ මහා පොදු සාධකය වනුයේ නැගී එන චීනය පිළිබඳ විරෝධය නිසයි. එබැවින් ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ වැඩි ඉඩක් වෙන්වන්නට ඇත්තේ, චීනයට එරෙහිව ආසියානු කලාපයේ සන්ධානයක් ගොඩනැගීම හා ඒ අනුව ක්‍රියාත්මකවීම පිළිබඳවයි.

ජාත්‍යන්තර ආරංචි මාර්ගවලට අනුව මෙම ත්‍රෛපාක්ෂික සන්ධානය පසුගිය අගෝස්තුවේ පැවති උපායමාර්ගික ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ (CSIS) විද්වතුන්ගේ සාකච්ඡාවකදී හෙළිදරව් කෙරුණා. එම සාකච්ඡා පදනම්කරගනිමින් නිකුත් කෙරුණු නිවේදනයක කියවුණේ චීනයේ හමුදා නවීකරණයේ වේගවත් ස්වරූපය එක්සත් ජනපදයේ, ජපානයේ හා ඉන්දියාවේ දැඩි කනස්සල්ලට හේතුවී ඇති බවයි. ඊට අනුව චීනයේ හමුදා ශක්තිමත්කිරීමේ ක්‍රියාවලිය විනිවිද පෙනෙන සුළු එකක් නොමෙයි. එසේම එහි බලහත්කාරී හැසිරීම සහ දේශසීමා ගැටලු, සයිබර් අවකාශය හා අභ්‍යවකාශය පිළිබඳ චීනයේ වුවමනාකම් ප්‍රශ්නකාරීයි.

**හතුරාගේ හතුරන්**

චීනයේ වැඩීම පාලනය කිරීම සඳහා ආසියාව තුළින් සොයා ගත හැකි හොඳම මිතුරන් දෙදෙනා එක්සත් ජනපදය තෝරාගෙන තිබෙනවා. සෝවියට් දේශයේ බිඳවැටීමෙන් පසු ශක්තිමත් මිතුරෙකු අහිමි වූ ඉන්දියාව තමන්ගේ කලාපීය අධිපත්‍යය ශක්තිමත් කර ගැනීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයට හේතුවීම තේරුම් ගත හැකියි. දේශ සීමා කරුණු මුල් කර ගනිමින් ඉන්දියාව වරක් චීනය සමග යුද වැදී තිබීමත් වෙළඳ යුද්ධයේදී ඉන්දියාව තමන්ගේ ප්‍රබල සතුරා ලෙස චීනය සැලකීමත් මෙහිලා තීරණාත්මක වෙනවා. ආසියානු කලාපය තුළ චීනය වැනි විරුද්ධවාදියෙකු සමග හැපෙන්නට ඇමරිකාවේ සහය අවශ්‍ය යැයි ඉන්දියාව තළ වන විශ්වාසය, ආසියාවේ එක්සත් ජනපද වුවමනාවන් සඳහා ඉන්දියාව පාවිච්චි කර ගත හැකි බවට වන ඇමරිකාවේ විශ්වාසය සමග සමපාත වී තිබෙනවා.

අනෙක් අතට ජපානය චීනයේ සතුරු රටක් ලෙස පවතින්නේ, ඓතිහාසික තත්වයන් යටතේමයි. වැඩි දුරක් නොගොස් දෙවන ලෝක යුද්ධයට පෙර කාලයට ගියද ජපානය චීනයේ විශාල කොටසක් තම ආධිපත්‍යට යටත් කර ගනිමින් අතිශය දරුණු පාලනයක් ගෙනගියා. ජපානයට යටත් චීනයේ නැන්ජින් වැනි නගරයක මාසයක කාලය තුළ ලක්ෂයකට වැඩි චීන ජාතිකයන් ප්‍රමාණයක් සමූල ඝාතනය වීම කෲරත්වයේ එක් නිදසුනක් පමණයි. ජපාන සෙබළුන්ගේ සුඛවිහරණය සඳහා යොදාගත් ලක්ෂ සංඛ්‍යාත චීන කාන්තාවන් වෙනුවෙන් ජපානය වන්දි ගෙවියයුතු බවට චීනය තුළ අදත් පවතින්නේ බලවත් මතයක්. මේ අමිහිරි අත්දැකීම්වලට වන්දි ගෙවීමට සිදු වීමක් පිළිබඳ භීතියත් තමන් ආධිපත්‍යය දරා සිටි වෙළඳපොළ චීනය විසින් අත්පත් කරගනිමින් සිටීම පිළිබඳ සිත් වේදනාවත් ජපානය චීනයට එරෙහි ව්‍යාපෘතියට ඈඳාගත හැකි සාධක නිර්මාණය කරනවා. ලෝක ආර්ථිකයේ දෙවන බලවතා ලෙසට සිටි ජපානය පරදවමින් චීනය ඉදිරියට පැමිණියේ පසුගිය වසරේදීයි. චීන ධීවර යාත්‍රාවක්, ජපානයට අයත් බවට ඔවුන් ප්‍රකාශ කරන දූපතක් අසල මසුන් මැරීමේ යෙදී සිටියදී ජපානය විසින් විට මාස කිහිපයකට පෙර අත්අඩංගුවට ගත්තා. ඒ පිළිබඳ ගැටලුව නිමා වූයේ, කපිතාන්වරයා අත්අඩංගුවෙන් නිදහස් නොකළහොත් ජපානයට බරපතළ විපාක විඳීමට සිදුවනු ඇති බවට චීනය කළ අනතුරු ඇඟවීමකිනුයි. එය ජපානය අපේක්ෂා කළ අන්දමේ පිළිතුරක් නොවිය හැකියි. ජපානය සිතන්නට ඇත්තේ, එමගින් චීනය තමන්ගේ තර්ජනාත්මක භූමිකාව ප්‍රදර්ශනය කළ බව විය යුතුයි. කෙසේ වුවද මේ සියලු සාධක එක්සත් ජනපදයේ වොෂින්ටන් රැස්වීම බලා යන්නට ජපානයට හේතු සපයා තිබෙනවා.

**ඇස් උඩ යැවූ වාර්තා**

එක්සත් ජනපද අධිරාජ්‍යවාදී භූමිකාව සමග චීනය ඍජු ලෙස ගැටෙන්නට අපේක්ෂා කරන්නේ නැහැ. ඉරාකය, ඇෆ්ගනිස්ථානය හා ලිබියාව වැනි තැනකදී ගැටුම් අවම කර ගැනීමට චීනය පරෙස්සම් වුණා. එහෙත් ආර්ථික ක්ෂේත්‍රයේ චීනය අත්පත් කර ගනිමින් ඇති පුළුල් භූමිකාවට සාපේක්ෂ යුධමය ආධිපත්‍යයක් චීනය ඉදිරියේදී ඉල්ලා සිටිනු ඇතැයි එක්සත් ජනපදය විශ්වාස කරනවා. චීනයේ යුද බලයේ වර්ධනය දෙස සන්සුන් මනසින් බලා සිටින්නට ඇමරිකාවට නොහැක්කේ එබැවිනුයි. 2009 පෙන්ටගන් වාර්තාවට අනුව චීනය යුධ බලය විශාල ලෙස වැඩි කර ගනිමින් ඉන්නවා. විශේෂයෙන් චිනයේ නාවුක බලය මෑත කාලීනව වේගයෙන් වර්ධනය වීම පිළිබඳව එහි කරුණු ඇතුළත්. එයට යුද නැව් 260ක් තිබීමත් එයින් 75කට වැඩි සංඛ්‍යාවක් දැවැන්ත යුද නැව් වීමත් සබ්මැරීන් 60කට වැඩි සංඛ්‍යාවක් තිබීමත් කෙරෙහි වාර්තාව අවධානය යොමුකරනවා. එසේම න්‍යෂ්ටික ශීර්ෂ සහිත මිසයිල සිය ගණනක් ඇති බවත් ඒවා ඉලක්ක වෙත මෙහෙය විය හැකි දියුණු තාක්ෂණික පද්ධති ඇති බවත් තවත් උපක්‍රමික අවි රැසක් ඇති බවත් මේවායේ ප්‍රතිඵලයක් ලෙස චීන හමුදාව කලාපීය වශයෙන් ප්‍රමුඛ තැනක පසුවන බවත් එහි සඳහන්.

පසුගිය නොවැම්බරයේ පැවති බාලි සමුළුවේදී පවා ඔබාමා උත්සාහ දැරුවේ, චීන විරෝධීන්ගේ සන්ධානයක උදව්වෙන් ආසියාව තුළ එක්සත් ජනපද ස්ථානගතවීම සාධාරණීකරණය කර ගන්නටයි. ඒ සඳහා ආසියාවට වෙනත් පැත්තකින් බැඳීමක් හදාගැනීමට ඔහු උත්සාහ කළා. ''පැසිපික් බලවතෙක් ලෙසට ඇමරිකාව මෙහි පැමිණ ඇත. ආසියානු පැසිෆික් කලාපයේ ආරක්ෂාව පිළිබඳ කරුණේදී යුද වියදම්වල ප්‍රමාණය පිළිබඳ තැකීමක් කළ නොහැක.'' ඔහු එහිදී කියාසිටියා.

පසුගියදා ඕස්ට්‍රේලියාවේ සිදු කළ ඔබාමාගේ සංචාරයේදී පවා අවධානය යොමු වී තිබුණේ චීනය ඉලක්ක කරගත් පුළුල් හමුදා ශක්තිමත් කිරීමක් සඳහා බවයි සඳහන් වන්නේ. අනෙක් අතට දිගුකාලීන වශයෙන් ඇමරිකානු හමුදා රඳවා ඇති දකුණු කොරියාවේදී 2002 දී තවත් ඇමරිකානු නාවික හමුදා කඳවුරක් ස්ථාපිත කෙරුණා. ඒ ජේජු (Jeju) දූපතේදීයි. ඒජිස් (Aegis) නම් මිසයිල ආරක්ෂණ පද්ධති සහිත ප්‍රහාරක නෞකාවලට පහසුකම් සැපයීම එහි අපේක්ෂාවයි. ඊසානදිග ආසියාවේ මාධ්‍යයේ, ඊසානදිගින් ජපානයත් බටහිරින් චීනයත් සහිත ජේජු දූපත කොරියානු සමුද්‍රසන්ධියේ වැදගත් උපක්‍රමික පිහිටීමක තිබෙන්නක්.

මේ සියලු යුධමය හා දේශපාලනික වටලෑම් චීනය ඉලක්ක කරගෙන සිදුවන බව ඉතාම පැහැදිලියි. යුධමය වශයෙන් චීනයට අභියෝගයක් වීමට එක්සත් ජනපදය ගන්නා උත්සාහය චීනයේ ආර්ථික වර්ධනයට අනුලෝම වශයෙන් ක්‍රියාත්මක වෙනවා. චීනය 10.3% ක වේගයකින් දළ ජාතික නිෂ්පාදනය වර්ධනය කරගනිමින් සිටියදී එක්සත් ජනපදයේ එම වේගය 1.8% ක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෑත වාර්තාවකට අනුව මිලදී ගැනීමේ හැකියාවේ සමානත්වය (PPP) අනුව 2016 වසර වන විට චීනය විසින් එක්සත් ජනපද ආර්ථිකය අභිබවා යනු ඇති. ඊට අනුව මේ වසරේ ඩොලර් ට්‍රිලියන 11.2ක් වන චීන ආර්ථිකය 2016දී ඩොලර් ට්‍රිලියන 19 වීමට නියමිතයි. එසේම දැනට ඩොලර් ට්‍රිලියන 15.2ක් වන එක්සත් ජනපද ආර්ථිකය එම කාලය වන විට වර්ධනය වන්නේ, ඩොලර් ට්‍රිලියන 18.8ක් දක්වා පමණයි. එහි අදහස මීට දශකයකට පෙර චීන ආර්ථිකය මෙන් තුන්ගුණයක විශාලත්වයක් තිබූ එක්සත් ජනපද ආර්ථිකය තවත් වසර 5කින් චීනයට පසුබා යාමයි. ආර්ථික වශයෙන් සිදුවන පසුබෑම හමුවේ යුදමය හා දේශපාලනික ආධිපත්‍යය රැකගැනීමට ඇමරිකාව තැත්කරමින් සිටිනවා.

**සිහිනවල බර කරට**

''ආරක්ෂාව පිළිබඳ කරුණේදී වියදම් ගැන නොසිතන'' බවට වන ඔබාමලාගේ වහසිබස් වෙනුවෙන් පීඩාවට පත්වීමට බලකෙරෙනු ලැබ ඇත්තේ, ඇමරිකානු පීඩිත ජනතාවටයි. රිපබ්ලිකන්වරුන්ගේ හා ඩිමොක්‍රටික්වරුන්ගේ සහය ඇතිව කොන්ග්‍රසයෙන් හා සෙනෙට් සභාවෙන් 2012 අයවැය සම්මත වෙද්දී සමාජ සුභසාධන වියදම් බරපතළ ලෙස කප්පාදු වී ගොස් තිබෙනවා. අඩු ආදායම්ලාභීන්ට නිවෙස් උණුසුම්කර ගැනීම සඳහා ලබාදුන් ඉන්ධන සහනාධාරය ඩොලර් බිලියන 1.2කින් හෙවත් 25%කින් කප්පාදු කෙරුණා. එය ශීත ඍතුවේ දසදහස් සංඛ්‍යාත දිළිඳු හා වයස්ගත ඇමරිකානුවන් මරණීය අවදානමකට පෙළෙන තරම් කෲර පියවරක්. රැකියා පුහුණු සෞඛ්‍ය හා අධ්‍යාපන වියදම් සඳහා වන වියදම්වලින් ඩොලර් බිලියන 1.4ක් කපා දැමීමටත් අධ්‍යාපනය සඳහා වන පෙල් (Pell) අරමුදලින් තරුණයන් 100,000ක් ඉවත්කරලීමටත් අයවැය යෝජනා තීරණය කර තිබෙනවා. එහි තේරුම අඩු ආදායම්ලාභී දහස් සංඛ්‍යාත සරසවි සිසුන්ට ඉහළ යන ආයතන හා දේශන ගාස්තු තනිවම දරාගැනීමට සිදුවනු ඇති බවයි. ඉදිරි වසර ගණනාවක් පුරා සිදුවීමට නියමිත පෙල් අරමුදල් කප්පාදුව ඩොලර් බිලියන 1.6ක්.

මේ සියලු පටි තදකරගැනීම් නිර්දේශකරමින් ඇමරිකානු අධිරාජ්‍යවාදී පාලනය උත්සාහ කරන්නේ, අඩසියවසකට වැඩි කාලයක් නඩත්තුකරගෙන ආ ඇමරිකානු සිහිනය කඩා නොවැටී පවත්වාගැනීමටයි. එනම් ඇමරිකානු අභිමානය පිළිබඳ ව්‍යාජයය. එය ආරක්ෂාකර ගැනීම සඳහා හිඟන භාණ්ඩාගාරයක් ඇතිව සටන්වැදීමේ අභියෝග යට කරදීමට සිදුව ඇත්තේ ඔබාමාටයි. ඒ වෙනුවෙන් සීතලේ සිටීමට සිදුව ඇත්තේ ඇමරිකානු පීඩිත ජනතාවටයි.







සමාජ සුභසිද්ධියට හා උන්නතියට වඩා යුද්ධ කටයුතු සඳහා දිගින් දිගට, වසරින් වසර වැඩි වැඩියෙන් වැය කරන ජාතියක් ආධ්‍යාත්මික මරණය වෙත ළඟා වෙමින් තිබෙන්නකි.

**මාටින් ලූතර් කිං**

## කවුළුව හැරමි තබමි

# "අපේ තාත්තාගේ" මරණය



ජපන් ආක්‍රමණිකයාගේ සපත්තුවට පෑගී පොඩිවී සිටි කොරියානු ජනතාව එයින් මුදාගෙන එකී ජනතාවට නිදහසේ ජීවත්වීම සඳහා ආලෝකය ළඟාකර දීමට කටයුතු කළ කිම් ඉල් සුන් නම් ශ්‍රේෂ්ඨ විප්ලවවාදියාගේ මරණයෙන් පසු කොරියානු ජනතාව තමන්ගේ පාලකයා ලෙස කිම් ජොන් ඉල් තෝරාගත්තේ සැබෑවටම ඔහු කොරියානු ජනතාවට ආදරය කරන සැබෑ නායකයෙක්වීම නිසා මිස කිම් ඉල්ගේ පුතා නිසා නොවන බව පසුගියදා කිම් ජොන් ඉල්ගේ මරණය හමුවේ හඬා වැළපුනු ජනතාව දුටුවිට සතුරන්ට පවා ඒත්තු ගැන්විණි. සමාජවාදී කොරියානු ජනතාව හුදකලා කොට තම වුවමනාවන් අනුව කටයුතු කරන රාජ්‍යයක් බවට එය පත්කර ගැනීම සඳහා ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදීන් කොපමණ උත්සාහ දැරුවද ඒ සියල්ල හමුවේ නොසෙල්වී තම ජනතාවගේ ජීවිත නගා සිටුවීම සඳහා ධෛර්යයෙන් කටයුතු කළ කිම් ජොන් ඉල් කොරියානු ජනතාව විසින් අමතනු ලැබුවේ 'අපේ තාත්තා' යනුවෙනි. ඔහු සැබෑවටම ජනතාවට අසීමිතව ආදරය කළ තාත්තා කෙනෙකු විය. ඒ නිසාම කොරියානු ජනතාවට ඔහුගේ වියෝව හදවත කම්පා කරවන වියෝවක් විය. එය දරා ගැනීමට කොතරම් උත්සාහ කළද හදවතේ වේදනාව කඳුළුවලින් පිටවනු වැළැක්විය නොහැකි වූ බව දකින්නට හැකි විය. මාධ්‍ය සංදර්ශන සඳහා මවා ගත් සෙනෙහසින් යුතුව තමන් තුළ නැති පීතෘ ගුණයක් ව්‍යාජව මවාගෙන එය සාවද්‍ය ආකාරයට ජනතාවට පරාවර්තනය කරන අපේ රටේ පාලකයින්ට කිසිදාක ජනතාවගේ තාත්තා වීමට හැකියාවක් නැත. එම නිසා ඔවුන්ට හැකිවන්නේ තාප්පවල පෝස්ටර්වලින් ආඩම්බරකාර තාත්තා යැයි ලියා තැබීම පමණි.

# සහෝදරත්වයේ ජනතා පවුර



මනුෂ්‍යත්වය යනු එකම කුලයකි. එයට ආගම හෝ ජාතිය හෝ වෙනත් කවරාකාරයේ බෙදීමක් හෝ අදාල වන්නේ නැත. එහෙත් ධනපති පාලකයින් කිසි විටෙක එම කුලයට එකඟ වන්නේ නැත. ඒ නිසා ම මෙම මනුෂ්‍යත්වයේ කුලය කඩා විසිරවීම සඳහා ඔවුන් විවිධාකාරයේ උපාය උපක්‍රම යොදනු ඇත. කුඩා කුඩා ඒකකවලට ජනතාව බෙදුණු විට තම අභිලාෂයන් ඉටු කර ගැනීමට මෙම පාලකයින්ට පහසු වනු ඇත. එම නිසාම එකට එක්වීම වෙනුවට බෙදී වෙන්වීම පිළිගන්නා ඔවුන් ඒ වෙනුවෙන් සැලසුම් දියත් කරනු ඇත.

මෙවැනි එක්වීමක් පිළිබඳව සාඩම්බරකාර හැඟීමක් ඇති වූයේ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ හා රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයාගේ නායකත්වයෙන් පසුගියදා ගොඩනැගුණු 'සහෝදරත්වයේ ජනතා පවුර' නම් සංවිධානය නිසාවෙනි. අධිරාජ්‍යවාදී වුවමනාවට අපේ රටේ පාලකයෝ සිංහල දෙමළ, මුස්ලිම් පමණක් නොව උඩරට පහත රට යනාදී වශයෙන්ද ජනතාව බෙදීමට කටයුතු කරන ලදී. එහෙත් ඒ සියල්ල පාලකයින්ගේ වුවමනාවට සිදු වුවද එහි ප්‍රතිවිපාකවලට ගොදුරු වූයේ අපේ රටේ ජනතාවයි. දශක 3 ක් පුරාවට රට තුළ දියත් වූ යුද්ධය එකී බෙදීම්වල තර්කානුකූල ප්‍රකාශනයක්ද විය. යුද්ධය නිමා වුවද සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව තුළ සහෝදරත්වය ගොඩනැංවීමට රාජපක්ෂ අට හවුල් ආණ්ඩුව අසමත් විය. ඒ නිසාම බිඳුණු සිත් යළි සකස් කිරීමේ භාරධූර කාර්යයක් සහෝදරත්වයේ ජනතා පවුරට නිතැතින්ම හිමිවනු ඒකාන්තය. එබැවින් ආණ්ඩුව අසමත් වී තිබෙන බිඳුණු සහෝදරත්වය යළි ඇති කිරීමේ උත්තුංග කාර්යයට ශක්තියක් වන්නට සහෝදරත්වයේ ජනතා පවුරට හැකි වුවහොත් එය අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සැබෑ මිනිසුන්ගේ ශක්තිය එක්තැන්වන සැබෑම ජනතා පවුරක් වනු ඒකාන්තය.

# පොලිටිකල් පංතිය




පන්තිය එකම කලබලයකි. වෙනදා වචනයක්වත් කතා නොකරන සරෝජනී අද තොරතෝංචියක් නැතිව එක දිගටම කියවමින් සිටින්නේ රූපවාහිනී සංවාදවලට එන ආණ්ඩුවේ ඇමතිවරුන් සිහිපත් කරමිනි. චමියා තාප්පයේ අයිනට වෙලා හිටගෙන ඉන්නේ පුරුද්දට වගේ එක කකුලක් බිත්තියට තියාගෙනය. වසන්ති හෝදලා ඇඳගෙන ඇවිත් තියෙන ගවුම දිහා බලාගෙන ඉන්නේ කප්චික ගන්න සබන් කුඩු දාලා හෝදපු ඇඩ් එක මතක් කරමිනි. එහෙත් අද සර් එනපාටක් නැති හැඩය. එක පාරටම සමරේ පන්තියට දුවගෙන ආවේ Breaking News එකක් ප්‍රචාරය කරන්නට පෙර ටීවී එකේ යන පූර්ව ප්‍රචාරක දැන්වීමක ස්වරූපයෙනි.

අද තමයි අපේ අයියට තේරිලා තියෙන්නෙ එයා කරන්නෙ වැදගත් රස්සාවක් නොවන බව. සමරය ජනපති ජනහමුව දවසෙ යමක් කියලා වටපිට බලන ජනාධිපතිතුමා වගේ පන්තිය වටේටම බැලුව.

ඒ වුණාට අපිනම් දන්නෙ ඔයාගෙ අයිය හොඳ රස්සාවක් කරනව කියලයි. මම නම් කැමතියි ඔයත් ඒ රස්සාවම කරනවනම්. වසන්ති උත්තර දුන්නෙ සමරෙ දිහා බලාගෙන නොවෙයි. පන්තියේ අනිත් අය යමක් හිතයි කියල වුවමනාවෙන්මයි. ඒත් වසන්ති ගැන එහෙම හිතන්න කාටවත් ඕනකමක් නැත්තෙ වසන්තිගෙ කාඩ් එක ''පවිත්‍ර නෝන'' නිසා. ඒවගේ දේවල් ගොඩක් වෙලාවට කියන නිසා.

මේකයි මචං, අපේ අයිය හිතං හිටියෙත් එහෙම තමයි. ඒ නිසා තමයි අපේ තාත්ත හැමදාම රෑට පුටුවෙ වාඩිවෙලා කකුල් දෙක උඩින් තියාගෙන උගත් පාඩම් කොමිසමේ වාර්තාව කියවන ජනාධිපති තාත්ත වගේ උජාරුවෙන් අයිය වගේ වෙයන් කියලා මටත් එක එක ඒව කියන්නෙ. ඒ වුණාට අද අයියම කියපි මගේ රස්සාව මේ තරම් බාලුදු වෙන එකක් බව දැනගෙන හිටියනම් මම මේකට නොගිහින් ආණ්ඩුවෙන් දෙන පොහොර සහනාධාරය අරගෙන තේ කෑල්ල හාරල කුඹුරක් කරනව කියල.

කොහොම වුණත් මම හිතන්නෙ උඹලයි අයියට මොකක් හරි වැරදීමක් වෙලා කියල. මොකද එහෙම අයට ඕන තරම් වරදිනව. ඒව ඒ තරම් ගණං ගන්න ඕන නෑ. සුළු වැරදීම්. චමිය එහෙම කිව්වෙ 'රැඛ ප්‍රතිඵල විකාරයක් වුණ දවසෙ එස්.බී. ඇමතිතුමා කරපු ප්‍රකාශය වගේ. කොහොමත් චමිය කට ඇද කරල පොඩ්ඩක් ඉස්සිලා කතා කරනකොට එස්.බී. ඇමතිතුමාව මතක් වුණත් උඌට කවුරුත් එහෙම කියන්නෙ නැත්තෙ එස්.බී.ගෙ මුහුණෙ වගේ අජූවක් චමියගේ මුහුණෙ නැති නිසා.

එක දවසක් අපේ අයිය මට කියනව 'උඹට ලැජ්ජ නැද්ද කොල්ලොත් එක්ක රවුම් ගහල ගෙවල් ගානෙ රස්තියාදු ගහල නිකම්ම නිකං නිකමෙක් වගේ වෙන්න, ඒක මටත් කරන අවමානයක්' කියලා. සමරය ඒක කිව්වෙ අධ්‍යාපන ප්‍රශ්න සම්බන්ධයෙන් උත්තර දෙන මොණරාගල නියෝජ්‍ය ඇමති වගේ.

දැන් ඉතින් හරියට කියපං බලන්න මොකද්ද උඹලැයි අයියට රස්සාව එපා වෙන්න වෙච්ච ප්‍රශ්නෙ කියලා. මෙච්චර වෙලා කිසිම දෙයක් කථා නොකර හිටපු සමනය එක පාරටම එහෙම ඇහුවා. ඒත් සමරය ඒකට උත්තර දෙනව වෙනුවට හිනාවෙලා වට පිට බැලුවෙ හරියට පාර්ලිමේන්තුවෙ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විපක්ෂයෙන් අහන ප්‍රශ්නවලට උත්තර නොදී මගහරින්න හදනව වගේ. ඒත් සාකච්ඡාව ටිකක් දුර ගිහින් තිබුණු නිසා සමරෙට ඒකට උත්තරයක් දෙන්නම වුණා.

මේකං මචංල වැඩේ. අපේ අයිය අද උසාවි යනකොට හැම තැනම පොලීසිය දාලලු. උසාවි ශාලාවට ගන්නෙ නම් කරපු පිරිසක් පමණයිලු. ඒත් මුළු සර්වාගෙම අතගාල බලලලු. මීට පෙර එහෙම වෙලා නැතුලු. නීතීඥයො ඔක්කොම වගේ කලබල වෙලා පොලීසියෙන් ඇහුවලු ඒ මොකද කියලා. පොලීසිය උත්තරයක් දෙනව වෙනුවට ප්‍රශ්නෙන් මග හැරලා ගියාලු. අන්තිමට අයියල පොලීසියෙ ලොක්කෙකුගෙන් ප්‍රශ්න කරපුවම උසාවිය නීතීඥයින්ට තහනම් කරන්නේ ඇයි කියලා එයා කිව්වලු ඒක ආරක්ෂක අමාත්‍යාංශයෙන් ආපු නියෝගයක් කියලා. අයියලත් එක්ක හිටපු නීතීඥයො ඔක්කොටම ඒකට හොඳටම කේන්ති ගිහිල්ල. ඒගොල්ල ගිහිල්ල අග්‍රවිනිශ්චයකාරතුමියට පැමිණිලි කරන්න. නමුත් යන්න දීල නෑ. පස්සෙ තමයි ඒගොල්ලො දැනගෙන තියෙන්නෙ ඒ වෙනකොට නාමලේ බේබිගේ දිවු(රු)ම උසාවියෙන් සිදුකරන්න කටයුතු සූදානම් කරපු නිසා එහෙම වුණා කියලා. සුද්දගෙ කාලෙවත් නීතිය මෙහෙම බාල්දු කළේ නැහැ කියලා අයිය ගෙදර ඇවිත් අම්මත් එක්ක තර්ක කළේ ඇමතිකමක් නැති නියෝජ්‍ය ඇමතියෙක් ඒක ගන්න හිතාගෙන රැස්වීමක කථා කරනව වගේ.

අපෝ ඕකද ප්‍රශ්නෙ. මම රූපවාහිනියෙන් බලාගෙන හිටියේ නාමලේ බේබිගෙ දිවුරුම. එයා පැළඳගෙන හිටියෙ හැත්ත ගණන්වල එයාගෙ තාත්ත දිවුරුම් දෙන වෙලාවේ පැළඳගෙන හිටපු ටයි එකමලු. කොච්චර වුණත් අරපිරිමැස්මෙන් වැඩකරන පවුලක් කියලා අපේ අම්මත් ඒ වෙලාවෙ කිව්ව. නාස්තිකාරයන්ට මේව ඉගෙන ගන්න හොඳ පාඩම් කියලා අපේ තාත්ත මගේ දිහා නොබලම කිව්වෙ රනිල් සජිත් ගැන සමුළුවේදී කරපු කථාව වගේ කියලා චමිය උත්තර දුන්න.

මොනව වුණත් ජනාධිපතිතුමා දරුවන්ට ආදරෙයි. ඒකයි එහෙම කරල තියෙන්නෙ. තමන්ගෙ පාලන කාලයේදී අරලිය ගහ මන්දිරය දරුවන්ට පැය 24 ම විවෘතයි කියල මතකද 10 පන්තියෙදී අපේ ටීචර් අපිව එක්කන් ගියා ඒක බලන්න. වසන්තිය ආසාවෙන් වගේ ඒක කිව්වෙ සංස්ථා සභාපතිකමක් ලැබුණු අමාත්‍යාංශ ලේකම්තුමියක් වගේ.

ඒක ඇත්ත. ඒ නිසා තමයි මේ සැරේ A/L ප්‍රතිඵල වරද්දපු එකට දඬුවම් දෙන්න හිතාගෙන සංස්කෘතික අමාත්‍යාංශෙ හිටපු ලේකම් කෙනෙක් එක්ක කොමිසමක් පත්කරල ඒ ගැන හොයන්න කියල තියෙන්නෙ. සිසිරය එහෙම කිව්වෙ සමච්චලේට කියල උගේ වචනවලින්ම කාටත් තේරුණා.

ඕක එච්චර ගණං ගන්න දෙයක් නෙමෙයි. මොකද එයා තාමත් බේබි කෙනෙක්. පොඩි ළමයින්ගේ සතුට වෙනුවෙන් අම්මල තාත්තල ගොඩක් දේවල් කරනවා. මෙතන වෙලා තියෙන්නෙත් එහෙම එකක්. උඹ ඒක අයියට හරියට තේරුම් කරල දීපන්. එතකොට අයිය ආයිමත් රස්සාවට යාවි. ඒ රස්සාව ගෞරවයක් ඇතුව කරාවි. ඒ වගේම උඹ අයියට කියපං, පොඩි එවුන්ට වැරදි උගන්නන මහ එවුන්ට විරුද්ධව නීතිය විතරක් නොවෙයි නීතිය හදන තැනුත් වෙනස් කරන්න මැදිහත් වෙන්න කියලා. සමනයාගේ පිළිතුරු කතාව කෙටි වුණාට ලොකු බරක්. ඒක තේරුනේ එතනින් එහාට කවුරුවත්ම කථා නොකරපු නිසා.

# ජනබලයට යට වූ ආණ්ඩුවේ බලහත්කාරය



කවුරු කුමන වර්ගයේ අරගලයන් සිදුකළද එළවළු හා පළතුරු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කූඩ අනිවාර්ය බවත් එය කඩකරන ඕනෑම කෙනෙකුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන බවත් පැවසූ ජොන්ස්ටන් ඇමතිවරයා තවදුරටත් සඳහන් කළේ මහින්ද චින්තනය යනු ජනතාවට අවශ්‍ය ආකාරයට පාලන කටයුතු මෙහෙයවීම නොව තමන්ට අවශ්‍ය ආකාරයට සැලසුම් ක්‍රියාත්මක කිරීම බව යැයි සඳහන්කොට පැය 48ක් ඉක්ම යාමට ප්‍රථම තම තීරණය හකුළා ගන්නට සිදුවූයේ ආණ්ඩුවේ බලහත්කාරය අභිබවා ජන බලය පෙරට ආ බැවිනි.

ජනතාවගේ ශක්තිය කොපමණද යන්න වටහා ගන්නට ජනතාවගේ ඇති අසමත්කම මෙම පාලකයන්ට වාසි සලසා දී තිබේ. එම නිසාම පාලකයෝ ස්වාභිමතය වෙනුවෙන් සියල්ල මෙහෙයවීමට කටයුතු කරති. එහෙත් සැබෑව නම් කුමන බලයක් හමුවේ වුවද ජන බලය යට කළ නොහැකි බවයි. පසුගියදා ආණ්ඩුවේ කූඩ සම්බන්ධ ක්‍රියාවලියද මෙයට කදිම සාක්ෂියකි. එහෙත් හුදකලා අරගලවලින් ජන බලය ජය ගත්තද එය සැබෑ ජයග්‍රහණයක් බවට පරිවර්තනය වීමට නම් ඒ සඳහා නිවැරදි නායකත්වයක් මෙන්ම නිවැරදි මඟ පෙන්වීමක්ද අවශ්‍ය වනු ඇත. එසේ නොවුණහොත් ජනතාවගේ උත්සාහය හුදකලා සිදුවීමකට පමණක් ලඝු වනු වැළකිය නොහැකිය. මෑත ඉතිහාසයේ ඊජිප්තුවෙන්ද ටියුනීසියාවෙන්ද අප ලද ආදර්ශය එයයි. එබැවින් පාලකයින්ට එරෙහිව ජනතාව අරගල කළ යුතු වන්නේ කිසිසේත්ම පාලකයින් විසින් සිදුකරනු ලබන හුදකලා ක්‍රියාවක් පරාජයට පත් කිරීම සඳහා පමණක් නොව එවැනි සිදුවීම් ඇති කරන පාලක ක්‍රමයටම එරෙහිව බව ඔවුන් වටහා ගත යුතුව ඇත. එසේ වටහා ගැනීම ප්‍රමාද වන තරමට කරනු ලබන අරගලයන්ගේ සැබෑ ජයග්‍රහණයද ජනතාවට දුරස්වනු ඇත.

9 පිටුවෙන් **කෝප් පයකින් ...**

වී හැල්ලුවී විනාශ වී යෑම වැළැක්විය නොහැක්කේය. අනාගත සමාජවාදී සමාජයේද දූෂණය නාස්තිය පිටුදැකීමේ ක්‍රමවේද අවශ්‍ය වනු ඇත්තේය. නමුත් ඒ බලහත්කාරී ප්‍රෝඩාකාරී ව්‍යූහයන් ලෙස නොවන්නේය. ඒවා ජනතාවගේ අවශ්‍යතාවයන් මතම ජනතාවම සකස් කරගන්නා. ස්වාධීන හා නිර්භීත තීරණ ගත හැකි ව්‍යූහයන් වනු ඇත්තේය. ක්‍රමය විසින්ම දූෂණය පිටු දකින විට ආයතන ව්‍යූහයන්ද අනවශ්‍ය වනු ඇත්තේය. ඒ තාක් ධනපති ක්‍රමයට ඇත්තේ මහා සාගරය තරමේ අක්‍රමිකතා දූෂණ වංචා වසා ගැනීමට කෝප්ප තරමේ මෙවැනි කමිටු ව්‍යූහයන් පවත්වා ගැනීමේ දුබල පිළිතුරු පමණක්ය.

**2011 කොප් කමිටුව හෙළිකරන දූෂණ කිහිපයක්**

**01. මිහින් ලංකා ආයතනය**
- ගුවන්තොටුපල සමාගමෙන් ලබාගත් මිලියන 500ක ණයට අදාල පොළී ගෙවා නැත.
- ආරම්භ කළ දිනයේ සිටම මූල්‍ය වාර්තා පාර්ලිමේන්තුවට හෝ විගණකාධිපතිට ලබාදී නැත.
- 2007/2008 පාඩුව මිලියන 3356යි. 2008/2009 පාඩුව රු. මිලියන 4657යි. 2009/2010 පාඩුව රු. මිලියන 5722යි.
- දැනට පවතින ගෙවිය යුතු ණය රුපියල් බිලියන 2.4කි. (මිලියන 2400කි)
- ඉදිරියේ ආයතනය පවත්වාගෙන යෑමටනම් තවත් රුපියල් මිලියන 381.7ක් රජයෙන් ණය අවශ්‍යව ඇත.

**02. ලංකා පුත්‍ර බැංකුව**
- මුළු වත්කම් රුපියල් බිලියන 2.3කි. (මිලියන 2300). බැංකුව ලබාදී ඇති යළි අයකර ගත නොහැකි ණය පමණක් රුපියල් බිලියන 1.3කි. ණය අයකර නොගැනීමේ අනුපාතය 55%කි.
- බෙටන්ස් ආයතනයට ඇප නැතිව ලබාදුන් ණය රුපියල් මිලියන 300කි.
- ත්‍රීමලේ එක්සත් ජාතික පක්ෂ සංවිධායිකාවගේ (පසුව ආණ්ඩුවට එක්විය) ධීවර සමිතියට දුන් අයකර ගත නොහැකි ණය රු. මිලියන 75කි.
- 2007 අයවැයෙන් වෙන්කළ රු. මිලියන 1000කින් මිලියන 750ක් පෞද්ගලික ඇඟළුම් සමාගමකට ආණ්ඩුව ලබාදී ඇත්තේ ලංකා පුත්‍ර බැංකුව මගිනි. ඒ යළි අයකර නොගැනීමටය.

**03. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
- දේශපාලන පක්ෂවලට දැන්වීම් පළකළ එහෙත් නොගෙවා ඇති රුපියල් 42,649,586ක මුදල අයකර ගත නොහැකිය.
- මිහින් ලංකා ආයතනයෙන් ලැබිය යුතු මිලියන 10ක් අයකර ගෙන නැත.
- 2006දී රු. මිලියන 137ක් වූ ලාභය මේ වනවිට රුපියල් මිලියන 4.7ක් දක්වා පහත බැස ඇත.

**04. ශ්‍රී ලංකා ධීවර සංස්ථාව**. - ණය රු. මිලියන 43කි

**05. සළුසල** - 2009/2010 පාඩුව රු. මිලියන 30කි.

**06. එයාර්ලංකා** - 2008/2009 පාඩුව රු. මිලියන 9300යි.

**07. ගුවන්විදුලි සංස්ථාව**
- බාහිරින් ලැබිය යුතු රු. මිලියන 97.3ක් අයකර ගත නොහැකිය.
- අමතර සේවකයින් සංඛ්‍යාව 329කි.
- 2009 සත්‍ය පාඩුව රු. මිලියන 727ක් ආණ්ඩුවෙන් ලද මුදලින් 2010 දී මූල්‍ය වාර්තාවල මිලියන 47ක ලාභ ලෙස පෙන්වීම.

**08. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය.**
- 2009 වියදම් වැඩිවීම 524%කි.
- හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගනය ඉදිකිරීම වරාය අධිකාරියට භාරදීම ගැටලු සහගතය.
- මුළු ණය ගෙවිය යුතු ප්‍රමාණය රුපියල් මිලියන 6100කි. මුළු වත්කම් ඇත්තේ රුපියල් මිලියන 3100ක් පමණි.
- හම්බන්තොට පල්ලේකැලේ හා බෙත්තාරාම අලුත්වැඩියා කිරීමේ වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 3300කි. නමුත් සත්‍ය වියදම රුපියල් මිලියන 7180කි.

**09. ලංකා බැංකුව**
- අයකර ගත නොහැකි ණය රුපියල් 228,6948,763කි. අයිරා පහසුකම් 10දෙනෙකුට පමණක් රුපියල් මිලියන 653ක් දී ඇත.
- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පාඩු ලබද්දී දී ඇති ණය රුපියල් මිලියන 3.2කි.
- ඉන්ටර්නැෂනල් ග්‍රොසරීස් එලයන්ස් ආයතනයට දී ඇති ණය මුදල රුපියල් මිලියන 340කි.
- පෞද්ගලික ආයතන 06කට දී ඇති රුපියල් මිලියන 90ක් ලබාදී ඇත්තේ ප්‍රමාණවත් ඇප නොමැතිවය.

**10. රාජ්‍ය දැව සංස්ථාව**
- පෞද්ගලික ආයතනයකට රුපියල් මිලියන 30ක් ආයෝජනය කර ඇත්තේ විධිමත් නීතියට අනුව නොවේ.
කපාහැර ඇති ණය රු. මිලියන 14.4කි.
- 2007 පාඩුව රු. මිලියන 11යි. 2008 පාඩුව රුපියල් රු. මිලියන 29කි.
- හිටපු ඇමතිවරයා ආයතනයේ 65-4013 වාහනය පැහැරගෙන ගොස් ඇත. (ජ.වි.පෙ. විසින් හෙළිකිරීමෙන් පසු යළි භාර දී ඇත.)

16පිටුවෙන් **පලස්තීන ජනතාවගේ විමුක්තිය.....**



පසු 1840 සිට ආරම්භ වූ තත්වයක් බව පෙන්වා දුන්නේය. ''1990 දශකයේ මුල් කාලයේ අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාව මත ජර්මනියේ බර්ලින් තාප්පය බිඳ දැමුවත් මේවන විට ඊශ්‍රායලය විසින් ඉදිකරමින් සිටින විනාශකාරී තාප්පයට විරුද්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධාන කතා කරන්නේ නැහැ. අධිරාජ්‍යවාදය කොතරම් දුෂ්ටද? කොතරම් අමානුෂිකද? මුළුමහත් මානව ශිෂ්ටාචාරයට එරෙහිව ම්ලේච්ඡත්වය මුදාහරිනවාද යන්න පලස්තීනය මතින් දැකගත හැකියි.

ලෝකය පුරා ජනතාව අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් වදිනවා. ඒ වගේම ලෝකය පුරා සිටින ප්‍රගතිශීලි ජනතාව මේ අරගලවලට සහයෝගය පළකරනවා. 'පලස්තීනයට ජීවත්වීමට ඉඩදෙනු' කියන අරගලය තුළ අපේ පක්ෂයත් ක්‍රියාකාරීව සිටිනවා. පලස්තීන ජනතාවගේ අරගලය ජනතා විමුක්ති පෙරමුණ කොන්දේසි විරහිතව ආරම්භයේ සිටම සහයෝගය පළකරනවා. ඒ වගේම පලස්තීන ජනතාවගේ අරගලය වෙනුවෙන් දිවි පිදූ වීරවරයන්ට අපේ ආචාරය පිරිනමනවා. අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට විරෝධය පළකරමින් සම්මත කරගත් එක්සත් ජාතීන්ගේ යෝජනා ක්‍රියාත්මක කරන ලෙස බලකරනවා.

මේ අවධියේ ලෝකය පුරාම ඒකාධිපතීන්ට විරුද්ධව අරගල ඇවිලී යමින් තිබෙන බව පැහැදිලියි. ටියුනීසියාවේ බෙන් අලී එවැනි අරගලයකින් බලයෙන් පහ කළා. ඊජිප්තුවේ හොස්නි මුබාරක් පලවා හැරියා. මේ පාලකයන් අධිරාජ්‍යවාදීන්ගේ සහාය ලබමින් සිටි අය. ඒකාධිපති පීඩනයට එරෙහිව එම ජනතාව තුළ ස්වභාවික විරෝධයක් ඇතිවී තිබුණා. හැබැයි ඒ අරගල අධිරාජ්‍ය විරෝධී හෝ ධනපති පාලනයට විරුද්ධ වුණේ නෑ. ඒ රටවල වාමාංශික දේශපාලන ව්‍යාපාර නොතිබීමේ අඩුව එයින් පැහැදිලිය. ඒ නිසා ඒකාධිපති පාලකයන් පලව ා හැර යළිත් බලය ලබාගත්තේ ධනපති පාලකයන් ජනතාව බලාපොරොත්තු වූ ප්‍රශ්න විසඳීමක් හෝ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීමක් සිදුවුණේ නැහැ. නමුත් මේ අරගලවලින් පැහැදිලි වන්නේ කොතරම් බලවත් යැයි ප්‍රදර්ශනය කරමින් සිටි ඒකාධිපති පාලකයන් පුංචි සිදුවීමකින් ආරම්භ කර ජනතා අරගල හමුවේ බලය අත්හල බවයි.

අද අපේ රටේ පාලන බලය උසුලන මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉටුකරමින් ඉන්නේ අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවන් මේ උවමනාවන් පරාජය කළ යුතුයි. ඒක අධිරාජ්‍ය විරෝධී සටනක් විතරක් වෙන්නේ නෑ. අධිරාජ්‍ය විරෝධී මෙන්ම ධනවාදයට විරුද්ධ සටනත් ඒකාබද්ධ කළ අරගලයත් එකට ගමන් කළ යුතුයි. අපි ඒ බව හොඳින්ම හඳුනාගෙන සිටින දේශපාලන පක්ෂයක්. ජනතා විමුක්ති පෙරමුණ 1965 සිටම අධිරාජ්‍ය විරෝධී හා ධනවාදී විරෝධී අරගලය එක්තැන් කළ ජාත්‍යන්තරවාදයත් සමග දේශප්‍රේමීත්වය එකට එක් කළ පක්ෂයක්. 1967 සිටම ලංකාවට අදාල අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පිළිබඳ නිවැරදි දේශපාලන විග්‍රහයක් අපේ පක්ෂයට තිබෙනවා. 1948 දී ලංකාවට නිදහස ලැබුණේ නැති බවත් සිදුවූයේ නව යටත්විජිතයක් බවට පත්වීම පමණක් බවත් අපි මහජනතාවට කීවා. මෙම දේශපාලන විග්‍රහය අනුව අපේ පක්ෂය දිගටම ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ නිසා අධිරාජ්‍යවිරෝධී අරගලත්. ධනවාදයට එරෙහි අරගලයත් ඒකාබද්ධ කරමින් ජයග්‍රාහී මාවතකට ඉදිරියටම ගමන් කරමින් සිටිනවා.

සමස්ත ජනතාවම පීඩාවට පත්කළ අධිරාජ්‍යවාදී ධනවාදයේ සමාජ ආර්ථික ක්‍රමය ආරක්ෂා කර ගන්න බලවේග දෙකක් එකවිට ක්‍රියාත්මකවීමට පටන්ගෙන තිබෙන බව පැහැදිලියි. මහින්ද රාජපක්ෂ නියෝජනය කරන අධිරාජ්‍යවාදී ධනපති පාලනයේ තැන ගැනීමට එක්සත් ජාතික පක්ෂය එක් පැත්තකින් ක්‍රියාත්මක වන අතර අනෙක් පැත්තෙන් වමේ මුහුණුවර ගත් අවස්ථාවාදී වමේ මධ්‍යස්ථාන ගොඩ නගමින් තිබෙනවා. මේ අම්බලමේ සකලවිධ අවස්ථාවාදීන්, පාවාදෙන්නන්, කුමන්ත්‍රණකරුවන් වගේම ජනතා හතුරන් රංචු ගැසෙමින් සිටිනවා. එක තනේ කිරි උරා බී හැදෙන වර්ග දෙකක කට්ටිය ගැන අපිට හඳුනාගන්න පුළුවන්. කොතරම් සංකීර්ණ වුවත් මේ තත්වය හා සත්‍යය තේරුම්ගෙන කුමන්ත්‍රණකාරයින්ගේ මධ්‍යස්ථාන පරදා සැබෑ වමේ ව්‍යාපාරයේ අරගලය ජයග්‍රහණය කරවීමට අපි කටයුතු කරනවා.

ජාත්‍යන්තරවාදය ජයග්‍රහණය කළ හැක්කේ මේ වගකීම නිසි සේ ඉටුකළ හොත් පමණයි. චේ ගුවේරා සහෝදරයා එක් අවස්ථාවක සඳහන් කළා වගේ අධිරාජ්‍යවාදයට එරෙහිව වියට්නාම් සටන්බිම් එකක් නොව සිය ගණනක් ඇතිවිය යුතු බව. එය සත්‍යයක්. අද එවැනි සටන්බිම් දහස් ගණනක් අවශ්‍යයි. එය සටන්බිම් තුළ පලස්තීන ලකුණ සහිත අරගල බිම්, ආසියානු ලකුණ සහිත අරගල බිම්, අප්‍රිකානු ලකුණ සහිත අරගල බිම් ඒකාබද්ධවීමත් අවශ්‍ය වෙනවා. ලෝක පරිමාණ අධිරාජ්‍යවාදය පරාජය කළ හැක්කේ, එවැනි ස්වාධීන අරගල ඒකාබද්ධ කිරීමෙන් පමණයි. මේ ජාත්‍යන්තරවාදී යුතුකම් ඉටුකිරීමට ලෝක ඉතිහාසයේ අත්දැකීම් අපි ලබාගන්නවා. ඒ වගේම දශක 04කට වැඩි පක්ෂ ඉතිහාසයේ අත්දැකීම් නිවැරදිව ඒකරාශී කර ගන්නවා. අපේ වගකීම මුළුමහත් මානව සංහතියටම නිදහස් හා සාමානාත්මතාවයෙන් පිරි සමාජයක් බිහි කිරීමයි. මනුෂ්‍යයත්වයක් සහිත සමාජයක් බිහිකිරීමයි. ඒ වෙනුවෙන් අපි ජයග්‍රාහී අරගලයක යෙදී සිටිනවා.''

5 පිටුවෙන් **නව වසර අරගල.....**



දණගස්වා ජයග්‍රහණ දිනාගන්න මෑත කාලයේ අවස්ථා දෙකකදී ජනතාව සමත් වුණා. එකක් පසුගිය මැයි මාසයේ පෞද්ගලික අංශයට ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුප් පනතක් ගෙනාපු වෙලාව. ඊට එරෙහිව වීදිවලට බැහැල අරගල කරපු වෙළඳ කලාපේ සේවකයෝ ආණ්ඩුවේ මර්දනය නොසලකා සටන්කර ජයගත්තා. ඒ සටනට ජ.වි.පෙ. තම දායකත්වයත් නායකත්වයත් ලබාදුන්නා.
ඒ වගේම පසුගියදා එළවළු ප්‍රවාහනයට ප්ලාස්ටික් කූඩ අනිවාර්ය කරපු වෙලාවෙත් ඉන් පීඩාවට පත් ප්‍රජාව වීදි බැහැලා අරගල කළා. ඒ අරගලයට ජ.වි.පෙ. සිය දායකත්වය හා නායකත්වය ලබාදුන්නා. එයත් ජයග්‍රහණය කළා. ඒ හැම වෙලාවකම ජ.වි.පෙ. පුංචියි, හරි දුර්වලයි හරි කියලා කවුරුවත් කිව්වේ නැහැ. ඒ නිසා අරගල කරන ජනතාවට මේ ආණ්ඩුවේ පැරදවීමට පුළුවන් කියලා අපි දැඩිව විශ්වාස කරනවා. ඒ වගේම ජනතා අරගලවලට නායකත්වය දිය හැක්කේත් දිය යුත්තේත් ජ.වි.පෙ. විසිනුයි කියලත් අපි විශ්වාස කරනවා. ඒ සඳහා අපි ක්‍රියාත්මක වෙනවා.

***නියමුවා:***
***හොඳයි, මේ අරමුණ සඳහා නව වසරේදී ඔබ පක්ෂය ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද?***

*ටිල්වින් සහෝදරයා*
2012 නව වසරක් වෙන්නේ කැලැන්ඩරයට අනුව විතරයි. එහෙම නැතුව බැලුවම තියෙන්නේ පරණ ධනපති ක්‍රමයමයි. පරණ ආණ්ඩුවමයි. පරණ ප්‍රශ්න හා අභියෝගමයි. කොහොම වුණත් අලුත් අවුරුද්දේ ජනතාවගේ ප්‍රශ්න හා අභියෝග තව තවත් වැඩි වේවි. ඒ නිසාම අරගල වැඩි වේවි. ඒ වෙනුවෙන් සූදානම්වීම හා පක්ෂයත් පංතියත් සූදානම් කිරීම සඳහා අපි ක්‍රියාමාර්ග කිහිපයක්ම ගැනීමට බලාපොරොත්තු වෙනවා. අපි පවත්වන විශේෂ සමුළුවත් එහි එක් අවස්ථාවක්. අපි අපේ පක්ෂය සියලුම අවස්ථාවාදී කල්ලි කණ්ඩායම්වල බලපෑමෙන් නිදහස් කරලා 'පිරිසිදු' කරගත යුතු වෙනවා. පක්ෂය ශක්තිමත්ව ගොඩ නැගීමට ක්‍රියාමාර්ග ගත යුතු වෙනවා. ඒ වගේම පොදු ජනතාව අතරින් මතුවන විවිධ අරගලවලට නායකත්වය දීම සඳහාත් පොදු ජනතාව අරගලවලට මෙහෙයවා ගැනීම සඳහාත් පුළුල් බහුජන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු වෙනවා. එය ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන බහුජන ව්‍යාපාරයක් විය යුතුවාක් මෙන්ම සැබෑ ලෙසම පොදු ජනතාව ආමන්ත්‍රණය කළ හැකි පුළුල් බහුජන ව්‍යාපාරයක්ද විය යුතුයි. රටේ සියලුම සමාජවාදීන්ට, ප්‍රගතිශීලීන්ට, දේශප්‍රේමීන්ට එක්ව සටන් කළ හැකි මධ්‍යස්ථානයක් ලෙස මෙම බහුජන ව්‍යාපාරය ගොඩනැගිය යුතුයි. ඒ වෙනුවෙන් මැදිහත්වීම අපේ කාර්යයක් වෙනවා. අපේ ඉදිරි ඉලක්කය හා ක්‍රියාමාර්ග වන්නේ ඒවායි. පන්ති සටනේ සජීවී අත්දැකීම් තිබෙන පසුගිය කාලයේ සමාජය තුළ නිර්මාණය වූ සියලු අවස්ථාවාදයන් හා කල්ලි කණ්ඩායම්වාදීන් පරාජය කොට සැබෑ දේශපාලනය රැකගැනීමට සමත් වූ ජ.වි.පෙ.ට ඉහත අභියෝග දිනීම දුෂ්කර නැතැයි අපි විශ්වාස කරනවා. ඒ සඳහා අප සමග එකතුවන ලෙස අප සියලුම ජනකොටස්වලට ආරාධනා කරනවා.

2 පිටුවෙන් **විරුද්ධවාදීන් මර්දනය...**

ආණ්ඩුවේ චරිත සහතිකය අතිශය කණගාටුදායකය. එය ආණ්ඩුවේ වුවමනාව පරිදි අර්ථකථනය කර ගන්නා නෛතික දඩුවම් පැමිණවීම්වල සිට සුදු වෑන් උපයෝගී කරගන්නා පුද්ගල පැහැරගැනීම් දක්වා පරාසයක ක්‍රියාත්මකය.

ආණ්ඩු විරෝධී ප්‍රවෘත්ති වෙබ් අඩවි තහනම, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පහරදීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පැවරීමකින් තොරව තරුණයින් රඳවා තබාගැනීම, උතුරේ මාධ්‍යවේදීන්ට සහ ශිෂ්‍ය ක්‍රියාකාරීන්ට පහර දීම, කොළඹද ඇතුළු දිවයිනේ නගර ගණනාවකදී පුද්ගල පැහැරගැනීම් සිදුවීම, මෑතකාලීන ආණ්ඩුවේ පළිගැනීමේ ක්‍රියාවලිය තුළ වේ. කවරාකාරයක හෝ විරුද්ධ මත දැරීමේ හේතුව මත විරුද්ධවාදීන්ගෙන් පළිගැනීමේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී භාවිතය අතිශය පිළිකුල් සහගතය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති නිදහස් අදහස් දැරීමේ අයිතිය තමන්ගේ විරුද්ධවාදීන් අරභයා නොපවතින බවටත් ආණ්ඩුවට එරෙහිවීමට සිතන්නන් ඒ පිළිබඳ දෙවරක් සිතා බැලිය යුතු බවටත් ඒත්තුගැන්වීම ආණ්ඩුවේ අපේක්ෂාව වී තිබේ.

රට තුළ දීගින් දිගටම වර්ධනය වන මෙම ප්‍රජාතන්ත්‍රවිරෝධී පරිසරය තමන්ගේ පැවැත්ම ශක්තිමත් කරනු ඇතැයි ආණ්ඩුව විශ්වාස කරනවා විය යුතුය. එහෙත් එමගින් ප්‍රදර්ශනය වන්නේ, ආණ්ඩුවේ ශක්තිමත්භාවය නොව දුබල බව සහ බියගුළු බවය. අනෙක් අතට ආණ්ඩුව විරුද්ධවාදීන් අරභයා අනුගමනය කරන පිළිවෙත ආණ්ඩුවට එකතු කරන්නේ, ජනතා විරෝධයය. මේ තත්වය තුළ ලලිත් කුමාර හා කුගන් මුරුගන් දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනා නිදහස් කිරීමට පියවර ගන්නා ලෙසත් පුද්ගල පැහැරගැනීම් වහා නතර කරන ලෙසත් අපි ආණ්ඩුවට දැඩිව අවධාරණය කරමු. එසේම ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ගමන පැරදවීම සඳහා පෙරට එන මෙන් සමස්ත ලාංකේය ජනතාවගෙන් අපි මහත් ඕනෑකමින් ඉල්ලා සිටිමු.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## නව වසරට සුභ පැතීමට පෙර සැබෑ ඝාතකයා හඳුනා ගැනීම

ග්ලෝබල් ඉෂුස් (Global Issues) නම් වෙබ් අඩවිය ළමා මරණ පිළිබඳ සංඛ්‍යා දත්ත සහිත වාර්තාවක් පළකර තිබේ. එය දකින හෘද සාක්ෂිය ඇති ඕනෑම අයෙකුගේ හදවත කම්පනය කිරීමට එම තොරතුරු ප්‍රමාණවත්ය. එකී වාර්තාවට අනුව දිළිඳුකම කුසගින්න හා පහසුවෙන් වැළක්විය හැකි රෝග නිසා ලොව පුරා සෑම දිනකම ළමයි 2,1000 ක් මිය යමින් සිටිති. එය සංසන්දනාත්මකව මෙලෙස වාර්තා කර තිබේ.

1. ඉහත හේතුමත සෑම තත්පර 4කට වරක් ලොව කොතනක හෝ ළමයෙක් මියයයි.
2. එලෙස මිය යන ප්‍රමාණය විනාඩියකට 14කි.
3. එලෙස සෑම වසරකම ළමයි මිලියන 7.6 කි මිය යති.
4. මෙලෙස සෑම එක් දිනයකදීම මියයන ළමුන් ප්‍රමාණය 2011 ලිබියාවේ යුධ ගැටුම්වලින් මිය ගිය ප්‍රමාණයට සමානය.
5. මෙලෙස සෑම දින 10කදි මියයන ළමුන් ප්‍රමාණය 2010 හයිටියේ සිදුවූ භූමි කම්පාවෙන් මියගිය මුළු ප්‍රමාණයට සමානය.
6. මෙලෙස සෑම දින 11 කදි මිය යන ළමුන් ප්‍රමාණය 2004 දෑ ආසියානු කලාපයට බලපෑ සුනාමියෙන් මියගිය මුළු ප්‍රමාණයට සමානය.

ඉදින් තවත් සැසඳීම් කුමටද? ලොව දරුණුම ඛේදවාචකවලින් මියයන ප්‍රමාණයට වඩා මෙලෙස නිහඬව මිය යන ළමුන් ප්‍රමාණය විශාලය. මේ ලොවපුරා දිවිනසාගැනීම්වලින් ලෙඩ රෝගවලින් හා යුධ ගැටුම්වලින් මිය යන ප්‍රමාණයට අමතරවය. අනිවාරණීය ලෙසම ජීවත් කිරීමට හැකිව තිබියෙදී, උපදින සෑම කෙනෙකුටම ජීවත්වීමේ අයිතිය පිළිගෙන තිබියෙදී මෙලෙස දිනපතා මියයන දරුවන්ගේ මරණවලට වගකිව යුත්තේ කවුද? ඒ අන්කවරෙක් නොව වත්මන් ධනවාදී සමාජ ක්‍රමයයි. වත්මන් ධනවාදය නිහඬ ඝාතකයෙකුගේ තත්වයට පත්ව තිබේ.

උපදින සියලු දෙනාට නොමැරී ජිවත්වීමට තරම් ආහාර ටිකක් ලබාදීමට නොහැකි නම් කොතරම් දියුණුයයි කීවද එවැනි සමාජ ක්‍රමයක් සාධාරණ වන්නේ නැත.

දැන් (දින දර්ශනයට අනුව) 2012 නව වසර ලබන විට සියලු දෙනාම නව වසරට එකිනෙකාට සුභ පතා ගන්නා අයුරු දැකිය හැක. නව වසරට සුභපැතීමේ කාර්යයේදි ප්‍රග්ධන හිමියෝත් කළුකඩ මුදලාලිලාත් ජාවාරම්කරුවෝත් ධනපති දේශපාලනඥයෝත් පෙරමුණ ගනිති. සාමය සතුට සෞභාග්‍යය, පිරි නව වසරට සුභ පතති. එහෙත් ලොව ජනතාවට සැබැවින්ම ලැබෙන්නේ සාමය සතුට හෝ සෞභාග්‍යය නොව යුද්ධ පීඩාවන් දිළිඳුකම හා නිහඬ මරණයන්ය. ජනතාවගෙත් දරුවන්ගේත් ඝාතකයන් විසින්ම ජනතාවට සුභ පතන හාස්‍යජනකයක් වී ඇති මේ ඛේදජනකය, එනම් ධනපති ක්‍රමය අවසන් කළ යුතුය. ලැබූ නව වසර පමණක් නොව මානව සංහතියේ මුළු අනාගතයම සුභවන්නේ එවිටය.

ලොවපුරා ධනපති පාලකයනුත් ඔවුන්ගේ උපදේශකයනුත් ඊනියා සමාජ ක්‍රියාකාරිකයනුත් අනාගත සෞභාග්‍යයක් ගැන කථා කරද්දී, හොඳම දේ ළමයින්ට යයි පුරසාරම් දොඩද්දී ළමයින්ට ලැබී ඇත්තේ දුප්පත්කම නුගත්කම හා මරණය බව ඉතා පැහැදිලිය. ලංකාවේ පාලකයෝද ආසියාවේ ආශ්චර්යයක් ගැන කථා කරති. ළමයින්ට හොඳ අනාගතයක් ගැන හීන පෙන්වති. එහෙත් සත්‍යය ඉතා කටුකය. ඉහත වෙබ් අඩවියට අනුවට දිළිඳුකම කුසගින්න හා පහසුවෙන් වැළැක්විය හැකි රෝග නිසා 2010 වසරේ පමණක් දකුණු ආසියාවේ මියගිය වයස අවුරුදු 5ට අඩු ළමයින් සංඛ්‍යාව ලක්ෂ 25කි. එය දෙවැනි වන්නේ, උප සහරා අප්‍රිකානු කලාපයේ මියගිය ළමුන් ලක්ෂ 37ට පමණි. ආසියාවේ සැබෑ ආශ්චර්යය. එසේය.

දිළිඳුකම නිසා කුසගින්න නිසා පහසුවෙන් වැළැකිය හැකි රෝග නිසා කවුරුන් හෝ මිය යන්නේ නම් එම මරණ ස්වභාවික මරණ නොව මිනීමැරුම්, ඝාතනයන් වේ. ලොව නිහඬ ඝාතකයා බවට ධනවාදය පත්ව සිටිනේ, ඒ අනුවය.මේ කුරිරු ධනවාදය මෙලෙස පවතිද්දි එතුළ සුභ අනාගතයක් වෙනුවෙන් නව වසරට සුභපතා ගැනීම සැබවින්ම රැවටිමකි. හාස්‍යඋපදවන කරුණකි. එබැවින් දැන් කළ යුතුව තිබෙන්නේ, සම්ප්‍රදායට අනුව නව වසරට සුභ පැතීම නොව නව වසරත් ඉදිරි අනාගතයත් සැබැවින්ම සුභ කර ගැනීම සඳහා සටන් කිරීමය, ක්‍රියාත්මක විමය. සවිඥ්ඥනික විමය.

කෙතරම් අවංක වුවත් හොඳ හිතින් සිදුකළත් සුභපැතුම් හෝ හොඳ ප්‍රර්ථනාවලට කිසිවක් ලබාදිය නොහැක. ඉන් සිදුකළ හැක්කේ, ජනතාව තාවකාලිකව හෝ නිද්‍රාවට පත් කිරීමත් බලාපොරොත්තු ඇති කිරීමක් පමණි. එහෙත් යමෙක් හොඳ ප්‍රාර්ථනා හෝ සුභපැතුම් වචනවලට පමණක් සීමා නොකොට ඒවා ක්‍රියාවට නැගීම සඳහා සටන් කරන්නේනම් අරගල කරන්නේනම්, ඒ වෙනුවෙන් වෙහෙසෙන්නේනම් එම ප්‍රාර්ථනා හා සුභපැතුම් ස්ථිර ලෙසම දිනක සැබෑ වෙන්නේය. එබැවින් ධනපති ක්‍රමය නිහඬ ඝාතකයෙක් ලෙස හැසිරෙන මේ යුගයේ අවශ්‍ය වන්නේ, නව වසරට සම්ප්‍රදායික ලෙස සුභ පතා ධනවාදයේ විය ගස මත ගෙල තබන මිනිසුන් නොව ධනවාදය පරදා නව සමාජයක් සඳහා දැනුවත්ව අරගල කරන සටන් වදින මිනිසුන්ය. නව වසර සැබෑ ලෙසම සුභ වසරක් කිරීම සඳහා සටන් කරන එවන් සැබෑ මිනිසුන්ට අපි සුභ පතමු.

# කොළඹ උද්ඝෝෂණ පාගමනට ජන ගඟක්!

ආණ්ඩුවේ 2012 ප්‍රෝඩාකාරී අයවැයට, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයට එරෙහිව දිවයින පුරා පවත්වන ලද විරෝධතා මාලාවේ තවත් එක් ක්‍රියාමාර්ගයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කරනු ලැබූ දැවැන්ත උද්ඝෝෂණ පාගමනක් පසුගිය 14වැනි දින පස්වරුවේ කොළඹදී පැවැත්විණි. කැම්බල් පිටියෙන් ආරම්භ වූ පාගමන කොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවති විරෝධතා රැස්වීමකින් අවසන් විය.

ආණ්ඩුව විසින් බදු පනවමින්, භාණ්ඩ මිල ඉහළ දමමින් සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතයට මරු පහරක් එල්ල කරමින් සිටිමටත් මාධ්‍ය මර්දනය, පුද්ගල පැහැරගැනීම්, බොරු චෝදනා ඉදිරිපත් කරමින් පුද්ගලයන් සිරගත කිරීම් ආදී නීතිය අතට ගැනීම් මගින් ජනතාව තවදුරටත් අපහසුතාවයට පත්කරන ප්‍රජාතන්ත්‍ර විරෝධී අත්තනෝමතික පාලනයක් ගෙන යමින් සිටීමටත් එරෙහි සටන්පාඨ මෙහිදී හඬ නැගිණි.



## පලස්තීන ජනතාවගේ විමුක්තිය ලෝක ජනතාවගේ විමුක්තියේම කොටසක්

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



පලස්තීන ජනතාවගේ සැබෑ නිදහස වෙනුවෙන්, ඔවුන්ගේ ස්වෛරීභාවය වෙනුවෙන්, මානව හිමිකම් ආරක්‍ෂා කිරීම වෙනුවෙන් ලෝකය පුරා ජීවත් වෙන ප්‍රගතිශීලී ජනතාව නගන හඬේ පෙරමුණේම ජනතා විමුක්ති පෙරමුණද සිටින බව ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා පැවසීය. ඔහු මේ බව ප්‍රකාශ කළේ, සමාජවාදී තරුණ සංගමය විසින් නොවැ. 29 වෙනි දිනට යෙදී තිබූ පලස්තීන සහයෝගිතා දිනය වෙනුවෙන් පසුගිය 06 වෙනි දින කොළඹ මහජන පුස්තකාලයේදී සංවිධානය කළ පලස්තීන සහයෝගීතා වැඩසටහනේ ප්‍රධාන දේශනය පවත්වමිනි.

ඒ වෙනුවෙන් වාර්තා චිත්‍රපටයක්ද තිරගත කෙරුණු අතර මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති ආචාර්ය අන්වර් අල් අගා මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි විය. සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධාක බිමල් රත්නායක, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක වෛද්‍ය නලින්ද ජයතිස්ස යන සහෝදරවරුද මෙයට සහභාගි වී සිටියහ.

එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේ පැවසීය.

" අධිරාජ්‍යවාදී පීඩනයට එරෙහිව අධිරාජ්‍යවාදී සූරාකෑමට එරෙහිව ලෝකයේ කුමන් හෝ රටක ජනතාවක් අරගල කරන්නේ නම් එම ප්‍රගතිශීලී අරගල සමඟ ජනතා විමුක්ති පෙරමුණ අත්වැල් බැඳගනිමින් තම ජාත්‍යන්තරවාදී යුතුකම ඉටුකරනවා. ජනතා විමුක්ති පෙරමුණ රට තුළ වෙහෙසකර කාල පරිච්ඡේදයක වැඩකරන අතර ජාත්‍යන්තර යුතුකම් ඉටුකිරීමටද අමතක කරන්නේ නැහැ. විමුක්ති අරගල පහසුවෙන් සහ ඉක්මනින් ජයග්‍රහණය කරන්නේ නැති බව ඇත්ත. නමුත් එම අරගල මර්දනයෙන් කෙළවර කළ නොහැකි බවත් ඇත්තයි. දශක 6කට අධික කාලයක් පවතින පලස්තීන ජනතාවගේ අරගලය නුදුරේදීම ජයග්‍රහණය කරන බව ස්ථිරයි.'' ඔහු පැවසීය.

පලස්තීන ජනතාවගේ විමුක්ති අරගලයේ මෑත ඉතිහාසය පිළිබඳව විග්‍රහයක් කළ ටිල්වින් සිල්වා සහෝදරයා පලස්තීනය ගැටලුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්විජිතයක් බවට පත්වීමෙන්

15 පිටුවට

## අයවැයට එරෙහිව ජ.වි.පෙ. කිරිබත්ගොඩදී උද්ඝෝෂණයේ

රාජපක්ෂ ආණ්ඩුවේ අයවැයට විරෝධය පළකරමින් ජ.වි.පෙ. සංවිධානය කළ උද්ඝෝෂණ මාලාවේ තවත් පියවරක් පසුගිය 04වැනි දින පෙරවරුවේ කිරිබත්ගොඩ නගරයේදී පැවැත්විණි. එම අවස්ථාවට පා.ම සුනිල් හඳුන්නෙත්ති, නාගරික මන්ත්‍රී නීතිඥ සුනිල් වටගල, සමන්මලී ගුණසිංහ, බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නලින්ද ජයතිස්ස යන සහෝදර සහෝදරියන් ඇතුළු මහජනතාව විශාල පිරිසක් සහභාගි වී සිටියහ.




මෙහිදී අදහස් දක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා මේ වන විට ඉන්ධන මිල ඉහළ ගොස් ඒ අනුව භාණ්ඩ මිලද ඉහළ ගොස් රටේ ජනතාවට දරාගනීමට නොහැකි ජීවන බරක් ඔවුන්ගේ ගේ කර මත පැටවී ඇති බව පැවසීය. බදුබර මෙන්ම විශාල ණය බරක් ජනතාවගේ හිස මත පටවා අවසන් බව අවධාරණය කළ විජිත හේරත් සහෝදරයා මේ තත්වය තුළ ජනතාව රවටන ප්‍රෝඩාකාරී අයවැයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ රට පුරා උද්ඝෝෂණ පවත්වන බව කියා සිටියේය.

එහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී. සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා වැඩකරන ජනතාව, කාන්තාවන්, විරැකියාවෙන් පෙළෙන තරුණයින්, ගොවි, ධීවර, ජනතාව ඇතුළු සියලු දෙනාට රාජපක්ෂ ආණ්ඩුවේ අයවැයට පමණක් නොව ජනතාවගේ ප්‍රශ්න විසඳීමට නොහැකි ධනවාදී ආර්ථික සමාජ ක්‍රමය වෙනස් කර අලුත් ආර්ථික රටාවක්, අලුත් සමාජ රටාවක් හැදීම සඳහා පෙළගැසෙන ලෙස ජනතාවට ආරාධනා කළේය.

**නියමුවා 2012 දින දර්ශනය**




**ආධාරය රු. 100.00**

## රටෙන් 52%කට අයවැයෙන් වෙන්කර ඇත්තේ සොච්චමක්

### සමාජවාදී කාන්තා සංගමය




2012 වසරට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යංශයට වෙන්කළ මුදල රුපියල් මිලියන 995 සිට රුපියල් මිලියන 949 දක්වා අඩුකර ඇති බවත් එයිනුත් මිලියන 734ක් වෙන්කර තිබෙන්නේ, ඇමතිවරයා ඇතුළු අමාත්‍යංශ කාර්යාල වියදම් දැරීමට බවත් ළමයින්ගේ සහ කාන්තාවන්ගේ කටයුතු වෙනුවෙන් ඉතිරිවන්නේ, සොච්චම් මුදලක් බවත් පෙන්වා දුන් සමාජවාදී කාන්තා සංගමය රටේ ජනගහනයෙන් 52% කට ආසන්න කාන්තාවන්ගේ සංවර්ධනයට එවැනි සොච්චම් මුදලකින් කළ හැක්කේ කුමක්දැයි ප්‍රශ්න කර සිටියේය.

මෙම අදහස් පළ වූයේ, පසුගිය 05වැනි දින එම සංගමයේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙම මාධ්‍ය හමුව සඳහා සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා සමන්මලී ගුණසිංහ සහෝදරියද ශ්‍රියානි මඩුගල්ල, සුභානී පතිරණ, චන්ද්‍රමාලී පෙරේරා, ශ්‍රියා කෝන්ගල්ල, සෙල්වි ක්‍රිශ්නන්, චාන්දනී කරුණාතිලක යන කමිටු සාමාජිකාවෝද එක්ව සිටියහ.

## ජ.වි.පෙ. කටාර් කමිටුවෙන් ශ්‍රී ලංකා පාසලට පරිත්‍යාගයක්



කටාර්හි ශ්‍රී ලාංකේය සිසුන් විශාල පිරිසක් ඉගෙනුම ලබන ස්ටැෆර්ඩ් පාසලේ සිසුන්ට අඩුපාඩු ලෙස පැවති පොත්පත් පරිත්‍යාග කිරීමට ජ.වි.පෙ. කටාර් කමිටුව පසුගියදා කටයුතු කළේය.

ඉල් මහ විරු සමරුව වෙනුවෙන් කටාර් බලා ගිය ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙම පාසල නිරීක්ෂණය කිරීමේදී ඉදිරිපත් වූ යෝජනාවක් අනුව කටාර් කමිටු සාමාජිකයන්ගේ මූල්‍යමය සහයෝගයෙන් මෙම පරිත්‍යාගය සිදුවිය.

කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.